# 1994 ආර්ථික ක්‍රියාකාරිත්වය ගැටළු සහ ප්‍රතිපත්ති

පසුගිය වසරේ පැවති ශක්තිමත් වර්ධනයෙන් පිටුබල ලද තිරසාර ආර්ථික වර්ධනය, පෞද්ගලික ආයෝජන මට්ටමේ වැඩිවීම සහ පාරිභෝගික මිළ ගණන් ඉහළයාමේ වේගයෙහි කැපී පෙනෙන පහත වැටීම, 1994 දී ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි දක්නට ලැබුණු ප්‍රධාන ලක්‍ෂණ වේ. කෙසේ වුවද, ඉහළ අයවැය හිඟය, ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ විශාල හිඟය, ජාතික මැතිවරණ දෙක නිසා ප්‍රතිපත්ති ලිහිල් වීම් හේතුවෙන් අඛණ්ඩව ඉහල මට්ටමක පැවති මූල්‍ය වර්ධනය, 1994 වසරේ සාර්ව ආර්ථික කළමනාකරණයේදී අවධානයට ලක්වුනු ප්‍රධාන ක්ෂේත්‍රයන් විය. මැතිවරණයන්ට පසුව ඇති වූ තවත් වැදගත් සිදුවීමක් වූයේ ආර්ථිකය ලිහිල් කිරීමේ ක්‍රියාදමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමටත්, වෙළෙඳපොළ හිතකර ආර්ථික වාතාවරණය ශක්තිමත් කිරීමටත් ඇති කැපවීම පිළිබිඹු කළ නව රජයේ ප්‍රතිපත්තීන් ප්‍රකාශයට පත් කිරීමයි. මෙය මෑත වර්ෂයන්හිදී ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්තීන් තවදුරටත් අඛණ්ඩව පවත්වාගෙන යෑම සහතික කිරීමක් විය.

## සමස්ත ක්‍රියාකාරිත්වය

පසුගිය වසරේ වාර්තා කළ සියයට 6.9 ක වර්ධනයට පසුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය (ද. දේ.නි.) මූර්ත වශයෙන් 1994 දී සියයට 5.6 කින් වර්ධනය විය. විදේශීය ශුද්ධ සාධක ආදයම ඇතුළත් දළ ජාතික නිෂ්පාදිතය (ද. ජා. නි.) සියයට 5.3 කින් වර්ධනය විය. මෙමගින් 1993 දී වාර්තා කළ ඉහළ වර්ධන ප්‍රවනතාවයේ සුළු පසුබෑස්මක් පෙන්නුම් කළද, ආර්ථික සංවර්ධනයේ පුරෝගාමිත්වය පෞද්ගලික අංශයට පැවරූ ආර්ථිකය ලිහිල් කිරීමේ මෑත කාලීන උත්සාහයන් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරනවල බලපෑම් යටතේ, 1994 වසරේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙන් පිළිබිඹු කරනු ලැබුයේ ආර්ථිකයට පහසු ලෙස යථා තත්ත්වයට පත්වීමට ඇති හැකියාවයි. විදේශ වෙළෙඳ ක්ෂේත්‍රය තුළ 1993 වසරේ වෙළෙඳ අනුපාතයේ ඇති වූ සියයට 2.0 ක හිතකර වර්ධනයට ප්‍රතිවිරුද්ධව යමින් 1994 දී එය සියයට 4.7 කින් පහත වැටුණි. දේශීය වශයෙන් සලකන කල, 1994 දී ශ්‍රී ලංකාවෙහි මැතිවරණ තුනක් පැවති අතර එමගින් රජයේ වෙනස්වීමක් සිදු විය. මැතිවරණ මධ්‍යයේ රාජ්‍ය ප්‍රතිපත්ති ලිහිල්වීම් සහ වර්ෂයේ අවසාන භාගයේ කර්මාන්ත කටයුතු සඳහා ඇති වූ බාධාවන්, ව්‍යාපාරික විශ්වාසය පළුදු කිරීමට හේතු විය. මෙම ප්‍රවනතාවයන් ආර්ථිකයේ අංශ කිහිපයක ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑම් ඇති කළේය.

1.1 සංඛ්‍යා සටහන

**ජාතික ආදායම් සංඛ්‍යා 1992 -1994**

| ශීර්ෂය | වර්තනාකම රුපියල් (දශලක්‍ෂ) | | | වර්ධන අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| | 1992* | 1993* | 1994* | 1993* | 1994* |
| 1. පවත්නා සාධක වියදම් අනුව ද. දේ. නි. | 386,999 | 453,092 | 523,300 | 17.1 | 15.5 |
| 2. ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. | 140,990 | 150,783 | 159,269 | 6.9 | 5.6 |
| 3. පවත්නා සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. | 379,179 | 447,113 | 515,272 | 17.9 | 15.2 |
| 4. ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. | 138,074 | 148,744 | 156,662 | 7.7 | 5.3 |
| 5. පවත්නා වෙළෙඳපොළ මිළ අනුව ද.ජා.නි. | 424.313 | 499.622 | 575.810 | 17.7 | 15.2 |
| 6. මැදිවසර ජනගහනය ('000) | 17,405 | 17,619 | 17,865 | 1.2 | 1.4 |
| 7. ඒක පුද්ගල ද. ජා. නි. | | | | | |
| I. පවත්නා සාධක වියදම් මිළ අනුව (රු.) | 21,786 | 25,377 | 28,843 | 16.5 | 13.7 |
| II. ස්ථාවර සාධක වියදම් මිළ අනුව (රු.) | 7,933 | 8,442 | 8,769 | 6.4 | 3.9 |
| III. පවත්නා වෙළෙඳපොළ මිළ අනුව (රු.) | 24,379 | 28,357 | 32,231 | 16.3 | 13.7 |

* තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.


තේ, පොල් සහ වී යන අංශවල ස්ථිර වර්ධනයක් පෙන්නුම් කරනු ලැබුවත්, කෘෂිකාර්මික අංශය 1993 දී වාර්තා කළ සියයට 4.9 ක සමස්ත වර්ධනයට සාපේක්‍ෂව 1994 දී සියයට 3.3 ක වර්ධනයක් පමණක් වාර්තා කළේය. වර්ෂයේ අවසාන භාගයේදී කර්මාන්ත කටයුතු සඳහා ඇති වූ අවහිරකම් සහ ඇහළුම් පංගු ලබා ගැනීම පිළිබඳව ඇති වූ අවිනිශ්චිතතාවයන් කම්හල් කර්මාන්ත අංශයේ වර්ධනය අඩුකළ අතර එම හේතුවෙන් කර්මාන්ත අංශයේ වර්ධනය සියයට 10.5 සිට සියයට 9.1 දක්වා අඩුවිය. මේ අතර, කාර්මික සහ කෘෂිකාර්මික අංශවල ඇති වූ අඩු වර්ධන ක්‍රියාකාරිත්වය හේතුකොටගෙන සේවා අංශය 1993 දී වාර්තා කළ සියයට 6.3 ක වර්ධනයට සාපේක්‍ෂව 1994 දී සියයට 5.2 ක සාමාන්‍ය වර්ධන වේගයක් වාර්තා කළේය.

සාර්ව ආර්ථික වාතාවරණයේ ඇති වූ පිරිහීම සහ මැතිවරණ වලට පෙර සිදුවූ ප්‍රතිපත්ති ලිහිල්වීම් මගින් 1993 දී වාර්තා කළ සීඝ්‍ර ආර්ථික වර්ධන ප්‍රවනතාවයේ වේගය අඩාල කෙරෙන ලකුණු පහළ විය. දැඩි පිස්කල් ප්‍රතිපත්තීන් ලිහිල් කිරීම් රජයේ අයවැය ක්‍රියාවලිය අසමතුලිතාවයට පත් කළ අතර එමගින් ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් කෙරෙහි සැළකිය යුතු පීඩනයක් ඇති කෙරුණි. පසුගිය වසරේ පැවති සියයට 0.8 ක හිඟයට සාපෙක්‍ෂව 1994 දී රාජ්‍ය අයවැයෙහි ජංගම ගිණුම ද. දේ. නි. න් සියයට 2.9 ක සැලකිය යුතු හිඟයක් වාර්තා කළ අතර මෙය රටේ ඉතුරුම් උත්සාහයන් අධෛර්යමත් කොට ඇත. වාර්තා වියදම් ඉහළයාමේ ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත අයවැය හිඟය ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරේ පැවති සියයට 8.4 මට්ටමේ සිට 1994 දී සියයට 10 දක්වා ඉහළ ගියේය. මෙම තත්වය දේශීය ණය ගැනීම් ද. දේ. නි. යේ සියයට 6.5 ක ප්‍රමාණයක් දක්වා ඉහළ නැංවීමට හේතු විය. රජයේ දේශීය ණය ගැනීම් ඉහළ යාම සහ පෞද්ගලික අංශය බැංකු ක්‍රමයෙන් ලබාගත් ණයවල අඛණ්ඩ වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය සමස්තයන් තවදුරටත් පීඩනයට පත් කරමින් මුදල් සැපයුම සියයට 19.7 කින් වැඩිවිය.

ආර්ථිකය තුළ පැවති ඉහළ ඉල්ලුම් පීඩනය සනිටුහන් කරමින් ඉතුරුම්/ද.දේ.නි. අනුපාතය 1993 දී පැවති සියයට 16 මට්ටමේ සිට 1994 දි සියයට 15.2 දක්වා අඩු වූ අතර, ඉතුරුම් සහ ආයෝජන වෙනස මගින් නියෝජනය වන සම්පත් පරතරය පුළුල් කරමින් ආයෝජන/ද. දේ. නි. අනුපාතය සියයට 25.6 සිට සියයට 27 දක්වා ඉහළ ගියේය. ඉතුරුම්/ද. දේ. නි. අනුපාතය අඩුවීමට සම්පූර්ණයෙන්ම හේතු වූයේ රාජ්‍ය අංශයේ ඉතුරුම් පහත වැටීමය. එමෙන්ම, රාජ්‍ය ඉතුරුම්වල ඇති වූ මෙම පහත වැටීම (මෙය 1993 දී. ද. ජා. නි. ප්‍රතිශතයක් ලෙස සියයට 0.8 ක සෘණ අගයක් වූ අතර, 1994 දී එය සියයට 2.9 දක්වා වැඩි වී ඇත.) කලින් වර්ෂය තුළදී පෞද්ගලික අංශයේ ඉතුරුම්වල නොකඩවා ඉහළයාමක් හඟවනු ලැබින. සමස්ත ඉතුරුම් සහ ආයෝජනයේ සිදු වූ මෙම වෙනස්කම්වලට අනුරූපීව ගෙවුම් තුලයේ ජංගම ගිණුම සැළකිය යුතු ලෙස පිරිහුනු අතර, 1993 දී ද. දේ. නිෂ්පාදිතයෙන් සියයට 3.8 ක හිඟයක්ව පැවති මෙම හිඟය 1994 දී සියයට 6.5 දක්වා ඉහළ ගියේය. මෙම තත්ත්වය සහ ප්‍රාග්ධන ගලාඒම්වල සිදු වූ අඩුවීම ගෙවුම් තුලනයේ සමස්ත අතිරික්තය 1993 දී පැවති වි.ගැ.හි. දශලක්ෂ 375 සිට 1994 දී වි.ගැ.හි. දශලක්‍ෂ 173 දක්වා අඩු කරනු ලැබින.

දේශීය මිළ ගණන් මත වූ ඉහළ ඉල්ලුම් පීඩනය, වර්ෂයේ පළමු මාස පහ තුළදී කොළඹ පාරිභෝගික මිළ දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය සියයට 12 ක මට්ටමක නොවෙනස්ව පැවතීම තුළින් මනාව පිළිබිඹු විය. ජීවන වියදම අඩු කිරීමේ පරමාර්ථයෙන්, එහෙත් සැළසුමකින් තොරව, රජය හඳුන්වා දුන් තීරු ගාස්තු අඩු කිරීම්, ආයාත බදු ලිහිල් කිරීම් සහ පරිපාලන මිළ ගණන් අඩු කිරීම් වැනි පියවරවල් මීට පසු කාලයේ මිළ දර්ශකයේ වෙනස්කම් සඳහා දැඩි ලෙස දයක විය. වර්ෂය අවසාන භාගයේ සැපයුම් තත්ත්වයේ සිදු වූ වර්ධනය, ආර්ථිකයේ පැවති මිළ පීඩනය මධ්‍යස්ථ තත්ත්වයට පත් කිරීමට උපකාරි විය. තවද, ආර්ථිකයේ පැවති ඉහළ ඉල්ලුම් පීඩනය මධ්‍යයේ පවා කොළඹ පාරිභෝගික මිළ දර්ශකයට අනුව වාර්ෂික උද්ධමන වේගය සියයට 8 ක සාමාන්‍යයන් විය. කෙසේ වෙතත් මූල්‍ය අංශයේ සිදු වූ අඛණ්ඩ ඉහළ වර්ධනය 1994 වර්ෂය තුළදි සැළකිය යුතු උද්ධමනකාරී පීඩනයක් සනිටුහන් කළේය. අයවැය හිඟය ස්ථිර ලෙස අඩු කිරීම තුලින් මෙම ඉල්ලුම් පීඩනය අඩු නොකළහොත් සහ දැනට පවතින ව්‍යුහාත්මක බාධාවන් ඉවත් කිරීමකින් තොරව, මැදි කාලයේදී ඉහළ ආර්ථික වර්ධනයක් සමඟ මිළ ස්ථායීතාවයක් පවත්වා ගැනීම දුෂ්කර වනු ඇත.

# දළ ජාතික නිෂ්පාදිතය




ශ්‍රී ලංකා මහ බැංකුව.

## ජාතික ආදායම හා වියදම

පවත්නා සාධක වියදම් මිළ අනුව, 1994 දී දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) රුපියල් බිලියන 515 ලෙස ඇස්තමේන්තු කොට ඇති අතර, එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 15.2 ක වර්ධනයකි. මේ අතර පවත්නා සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. ය, වක්‍ර බදු සහ සහනාධාර සමඟ ගැලපුම් කිරීමෙන් ලබා ගන්නා පවත්නා වෙළෙඳපළ මිළ අනුව ද.ජා.නි. ,1994 දී රුපියල් බිලියන 576 වූ අතර ,එයද, 1993 දි පැවති රුපියල් බිලියන 500 හා සසඳන විට සියයට 15.2 ක වැඩිවීමකි. 1993 වසර හා සසඳන විට සියයට 1.4 ක ජනගහන වර්ධන වේගයක් පෙන්නුම් කරමින් 1994 දි මැදි වසර ජනගහනය දශලක්ෂ 17.87 ලෙස ඇස්තමේන්තු කර ඇත. මේ අනුව, පවත්නා වෙළෙඳපළ මිළ ගණන් අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය, 1993 දී පැවති රුපියල් 28,357 (ඇ. ඩොලර් 588) සමඟ සැසඳීමේදී එය 1994 දී රුපියල් 32,231 (ඇ.ඩොලර් 652) දක්වා සියයට 13.7 කින් වර්ධනය විය.

පවත්නා වෙළෙඳ මිළ අනුව දළ දේශීය වියදම (ද. දේ. වි.) 1994 දී රුපියල් බිලියන 648 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇති අතර, එය 1993 සමඟ සසඳන විට සියයට 18.3 ක වැඩිවීමකි. 1994 දි රුපියල් බිලියන 491 වූ පරිභෝජන වියදම සියයට 17.0 ක වැඩිවීමක් වාර්තා කළේය. පසුගිය වර්ෂයේ සියයට 16.6 ක වර්ධනය හා සසඳන විට 1994 දී පෞද්ගලික පරිභෝජන වියදම රුපියල් බිලියන 435 දක්වා සියයට 16.4 කින් වැඩි විය. 1993 වර්ෂයේදී පැවති රටාව අනුව යමින් ආනයනිත භාණ්ඩ හා සාධක නොවන සේවා සඳහා වන පෞද්ගලික වියදම සියයට 24 ක ඉහළ වර්ධන වේගයකක් සළකුණු කළ අතර, දේශීය නිෂ්පාදිත භාණ්ඩ සඳහා වන වියදම වාර්තා කරන්නේ සියයට 13.6 ක සාපේක්ෂ අඩු වර්ධන අනුපාතිකයකි. ආනයනික පරිභෝජන භාණ්ඩ අතර, ආහාර හා පාන වර්ග සහ මෝටර් රථ හා විදුලි භාණ්ඩ වැනි කල් පවතින පාරිභෝගික භාණ්ඩ සැළකිය යුතු වර්ධනයක් වාර්තා කොට ඇත. 1993 දී සියයට 11.8 කින් ඉහළ ගිය රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම 1994 දී සියයට 22.5 ක ඉහළ වර්ධන වේගයක් වාර්තා කිරීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ භාණ්ඩ හා සේවා මිළදී ගැනීම් සඳහා වූ වර්තන වියදම සියයට 22 කින් ඉහළ යාම වේ.

### 1.2 සංඛ්‍යා සටහන
### දළ ජාතික නිෂ්පාදිතයේ සංයුතිය සහ වර්ධනය 1992 - 1994 ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව

| ශීර්ෂය | වටිනාකම රුපියල් (දශලක්ෂ) | | | වර්ධන අනුපාතිකය | | |
|---|---|---|---|---|---|---|
| | 1992* | 1993* | 1994* | 1992* | 1993* | 1994* |
| 1. කෘෂිකර්මය වන හා ධීවර | 30,090 | 31.554 | 32,593 | -1.6 | 4.9 | 3.3 |
| එයින් | | | | | | |
| 1.1 තේ | 2,303 | 2,985 | 3,116 | -25.7 | 29.6 | 4.4 |
| 1.2 රබර් | 669 | 681 | 688 | 2.1 | 1.8 | 1.0 |
| 1.3 පොල් | 2,971 | 2,799 | 3,376 | 5.1 | -5.8 | 20.6 |
| 1.4 වී | 5,882 | 6,447 | 6,750 | -2.0 | 9.6 | 4.7 |
| 1.5 අනෙකුත් (අනෙකුත් කෘෂිකර්ම, වන හා ධීවර) | 18,265 | 18,642 | 18,663 | 1.6 | 2.1 | 0.1 |
| 2. පතල් සහ කැනීම් | 3,300 | 3,693 | 3,915 | -6.0 | 11.9 | 6.0 |
| 3. නිමැවුම් කර්මාන්ත | 26,059 | 28,806 | 31,418 | 8.8 | 10.5 | 9.1 |
| 3.1 තේ, රබර් හා පොල් නිෂ්පාදන සැකසීම් | 2,912 | 3,157 | 3,567 | -12.6 | 8.4 | 13.0 |
| 3.2 අනෙකුත් | 23,147 | 25,649 | 27,851 | 12.3 | 10.8 | 8.6 |
| 4. තැනීම් | 9,765 | 10,400 | 11,024 | 8.1 | 6.5 | 6.0 |
| 5. සේවා | 71,776 | 76,330 | 80,319 | 5.3 | 6.3 | 5.2 |
| 6. ද. දේ. නි | 140,990 | 150,783 | 159,269 | 4.3 | 6.9 | 5.6 |
| 7. විදේශීය ශුද්ධ සාධක ආදායම් | -2,916 | -2,039 | -2,067 | - | - | - |
| 8. ද.ජා.නි. | 138,074 | 148,744 | 156,662 | 4.4 | 7.7 | 5.3 |

* තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 22.4 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 154 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. එමගින් 1994 වර්ෂයේ ප්‍රාග්ධන තොගයේ කැපී පෙනෙන ඉහළ යාමක් පිළිබිඹු කරනු ලැබිනි. මේ අනුව ආයෝජන/ද.දේ.නි. අනුපාතය 1993 දී පැවති සියයට 25.6 මට්ටමේ සිට 1994 දී සියයට 27 දක්වා ඉහළ ගියේය. මෑත වර්ෂවල පැවති උපනතිය අනුව යමින්, ප්‍රාග්ධන සම්පාදනයට වැඩි දයකත්වයක් සැපයුනේ පෞද්ගලික අංශයෙනි. පෞද්ගලික ආයෝජන වැඩි වශයෙන් යොමු වූයේ යන්ත්‍රෝපකරණ, ප්‍රවාහන උපකරණ, නිවාස හා නිවාස නොවන ඉදිකිරීම් යන ක්ෂේත්‍රයන්ටය. මේ අතර, රජයේ ආයෝජන වැඩි වශයෙන් යොමු වී තිබුණේ වරාය සේවා, සංනිවේදන, මහා මාර්ග හා නල ජලය සැපයීම වැනි යටි තල පහසුකම් සංවර්ධනය කෙරෙහිය. රාජ්‍ය ආයෝජනයන් ද. දේ. නි. යට සාපේක්ෂව 1993 දී සියයට 8 ක මට්ටමක සිට 1994 දී සියයට 7 දක්වා අඩු විය.

දේශීය ඉතුරුම් 1993 දී පැවති රුපියල් බිලියන 80 සිට 1994 දී රුපියල් බිලියන 88 දක්වා සියයට 9.5 කින් වර්ධනය විය. එහෙත් 1993 දී සියයට 15 සිට සියයට 16 දක්වා වැඩි වූ ඉතුරුම්/ද.දේ.නි. අනුපාතය, 1994 දී රජයේ ඉතුරුම් උත්සාහය අඩපන වීම නිසා සියයට 15.2 දක්වා පහත වැටුණි. ද. දේ. නි. ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ඉතුරුම් සියයට 0.8 සෘණ අනුපාතයක සිට සියයට 2.9 ක් දක්වා පහත වැටුණි. මෙමගින් 1993 දී සියයට 16.8 ක්ව පැවති පෞද්ගලික ඉතුරුම්/ ද. දේ. නි. අනුපාතය 1994 දී සියයට 17.9 දක්වා වැඩිවීම තහවුරු කෙරුණි. මේ අතර, සමස්ත දේශීය ඉතුරුම් ප්‍රමාණය අඩු මට්ටමක පැවතීමේ හේතුවෙන්, ශුද්ධ පෞද්ගලික සංක්‍රාම සහ විදේශීය ශුද්ධ සාධක ආදායම දේශීය ඉතුරුම් සමඟ ගැලපීම තුළින් ලබා ගන්නා ජාතික ඉතුරුම් ප්‍රමාණය, ද. දේ. නි. යට සාපේක්ෂව 1993 දී සියයට 20.3 සිට 1994 දී සියයට 19.1 දක්වා පහත වැටුණි. ආර්ථිකයේ පැවති ඉහළ සමස්ත ඉල්ලුම පිළිබිඹු කරමින් ඉතුරුම් ආයෝජන පරතරය 1993 දී ද. දේ. නි. යෙන් සියයට 5.3 ක සිට 1994 දී. ද. දේ. නි. යෙන් සියයට 7.9 දක්වා පුළුල් විය.

## දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) උපනතීන්


මූර්ත වටිනාකම අනුව දළ දේශීය නිෂ්පාදිතය 1993 දී පැවති සියයට 6.9 ක වර්ධනයට සාපේක්ෂව 1994 දී සියයට 5.6 කින් වර්ධනය විය. ආර්ථිකයේ සෑම අංශයක්ම 1994 දී සිය වර්ධන ප්‍රවනතාවයන් තවදුරටත් පවත්වා ගැනීමට සමත් විය. එසේ වුවද ජාතික මැතිවරණ මධ්‍යයේ ප්‍රතිපත්ති ලිහිල් කිරීම් සහ සාර්ව ආර්ථික වාතාවරණයෙන් ඇති වූ අහිතකර වර්ධනයන් නිසා මෙම වර්ධනයන්ගේ වේගය අඩු මට්ටමක පැවතුණි. සේවා අංශය (ඉදිකිරීම් ද ඇතුළත්ව) ආර්ථිකයේ වැදගත් ස්ථානයක් ගනු ලැබූ අතර, 1994 දී. ද. දේ. නි. වර්ධනයෙන් සියයට 54.3 කට දයක වෙමින් මෙම අංශය තවදුරටත් ආර්ථික වර්ධනයේ ප්‍රධානතම දයකයා ලෙස පැවතුනි. මෑත වර්ෂ වලදී ආර්ථික වර්ධනය සඳහා සැළකිය යුතු දයකත්වයක් සැපයූ කර්මාන්ත අංශය 1994 දී සියයට 9.1 වර්ධනයක් වාර්තා කළ අතර, එය ද. දේ. නි. වර්ධනයෙන් සියයට 30.8 ක දයකත්වයක් සැපයිය. කෘෂිකාර්මික අංශය, පතල් සහ කැනීම් කටයුතු ද ඇතුළත්ව, 1994 දී. ද. දේ. නි. වර්ධනය සඳහා සියයට 14.9 ක දයකත්වයක් සැපයීය.

## ප්‍රාථමික අංශය

1993 දී සියයට 4.9 ක වර්ධන වේගයක් වාර්තා කරමින් ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වූ කෘෂිකාර්මික අංශය 1994 දී සියයට 3.3 කින් වර්ධනය විය. මුළු කෘෂිකාර්මික නිෂ්පාදනයෙන් සියයට 50 කට පමණ දයක වන අනෙකුත් කෘෂිකාර්මික උප අංශය සියයට 0.1 කින් පමණ පහත වැටීමක් වාර්තා කරනු ලැබුවත්, අඛණ්ඩව වර්ධනය වූ තේ, වී සහ පොල් නිෂ්පදනයෙන් 1994 දී කෘෂිකර්මික අංශයේ සමස්ත වර්ධනය සඳහා දයක වී ඇත. තේ සහ වී නිෂ්පාදනයන්හි ඉහළ වර්ධන මට්ටමක් පැවතීමට මූලික වශයෙන් හේතු වී ඇත්තේ නොකඩවා පැවති යහපත් කාලගුණික තත්ත්වය වේ. වතු වගා අංශය තුළ තේ, රබර් සහ පොල් නිෂ්පාදනයන් පිළිවෙලින් සියයට 4.8, සියයට 1.0 සහ සියයට 20.6 ක වර්ධන වේගයක් වාර්තා කොට ඇත. පෙර වර්ෂයේ පැවති යහපත් කාලගුණයේ පසුකාලීන ප්‍රතිඵලයක් ලෙස පොල් නිෂ්පාදනයේ සැළකියුතු වර්ධනයක් වාර්තා විය. මේ අතර, වී නිෂ්පාදනය සියයට 4.7 කින් වර්ධනය විය. සැළකියුතු වර්ධනයක් වාර්තා කළ මෙම ප්‍රධාන බෝග වර්ග තුනේ නිෂ්පාදන ප්‍රතිලාභ සියයට

# කාර්මික සම්භවය අනුව දළ ජාතික නිෂ්පාදිතය

ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව




ශ්‍රී ලංකා මහ බැංකුව.

0.1 කින් පහත වැටුණු අනෙකුත් කෘෂිකාර්මික උප අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වය නිසා යම් දුරකට අඩුවිය. අනෙකුත් කෘෂිකාර්මික උප අංශය තුළ අතුරු ආහාර බෝග, උක්, සත්ව පාලනය සහ කිරි නිෂ්පාදන යන අංශ වල නිෂ්පාදන වර්ධනයක් වාර්තා විය. නමුත් සුළු අපනයන බෝග, එළවළු සහ පළතුරු යන අංශ වල නිෂ්පාදනය පසුබෑමකට ලක් විය. 1993 දී වාර්තා කළ සියයට 7.1 වර්ධනයට සාපේක්ෂව, ධීවර උප අංශය 1994 දී සියයට 1.4 ක් දක්වා අඩු විය. මෑත වර්ෂයන්හිදී පැවති දැව සම්පත් වල අධි භාවිතය නිසා ක්‍රමයෙන් දැව සම්පත් හින වීම පිළිබිඹු කරමින් දැව ආදි වන ද්‍රව්‍ය උප අංශය තුළ සුළු වැටීමක් වාර්තා විය.

මැණික් අපනයන ප්‍රමාණයන් වැඩිවීම සහ නිෂ්පාදන සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා යොදා ගන්නා කැනීම් නිෂ්පාදන සඳහා පැවති ඉල්ලුම වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස පතල් සහ කැනීම් කටයුතු 1994 දී සියයට 6 ක වර්ධනයක් වාර්තා කළේය.

## කර්මාන්ත අංශය

මෑත කාලීනව ආර්ථිකයේ ප්‍රධාන වර්ධන අංශය ලෙස නැඟී ආ වූ කර්මාන්ත අංශය, පසුගිය වර්ෂයේ වාර්තා කළ සියයට 10.5 ක වර්ධනයට සාපේක්ෂව 1994 දී සියයට 9.1 ක අඩු වර්ධන වේගයක් පෙන්නුම් කරනු ලැබීය. කෙසේ වෙතත්, පසුගිය වර්ෂයේදී මෙන්ම, ආර්ථික වර්ධනයේ ප්‍රධාන පිටුබලය වූයේ කර්මාන්ත අංශයයි. එකතු කළ වටිනාකමට සහ නිර්යාත ආදයමට දායකත්ව සැපයූ ඉතා වැදගත්ම උප අංශය වූයේ කර්මාන්ත අංශය යටතේ ගැනෙන කම්හල් කර්මාන්ත උප අංශයයි. මෙම අංශය පසුගිය වසරේ වාර්තා කළ සියයට 11.3 ක වර්ධනයට සාපේක්ෂව 1994 දී සියයට 8.8 කින් වර්ධනය විය. කාර්මික කටයුතු සඳහා ඇති වූ බාධාවන්, ඇ. එ. ජ. ඇඟළුම් පංගු සම්බන්ධව පැන නැගුණු අවිනිශ්චිතතාවයන් සහ වර්ෂය තුළදී ප්‍රතිපත්ති ලිහිල් වීම නිසා ආයෝජකයින්ගේ විශ්වාසය බිඳ වැටීම වැනි සාධක කම්හල් කර්මාන්ත වර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. කම්හල් කර්මාන්ත උප අංශය තුළ 1994 දී ඉහල ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරනු ලැබූ කාර්මික උප ගණයන් වූයේ ආහාර හා පාන වර්ග; රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදන සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන වේ. වතු කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස තේ, රබර් සහ පොල් සම්බන්ධ සැකසුම් කර්මාන්ත වල එකතු කළ වටිනාකම මූර්ත වශයෙන් 1993 දී පැවති සියයට 8.4ක වර්ධනයට සාපේක්ෂව 1994 දී සියයට 13 ක වර්ධනයක් වාර්තා කළේය. ඉහල නැගුණු ආර්ථික කටයුතු සහ කම්හල් කර්මාන්ත අංශයේ සිදුවූ වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස සුළු කර්මාන්ත උප අංශය 1994 දි සියයට 5.7 කින් වර්ධනය වු බව ඇස්තමේන්තු කොට ඇත. අනෙකුත් කර්මාන්ත උප අංශය 1993 වාර්තා කළ සියයට 6.4 ක වර්ධනයට සාපෙක්‍ෂව 1994 දී සියයට 6.8 කින් වර්ධනය විය. මෙම කාර්මික අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපානු ලැබූයේ සහල් සැකසීමේ කර්මාන්තයේ සිදුවූ වර්ධනය වේ.

## ඉදිකිරීම්

1994 දී එකතු කළ වටිනාකමේ සියයට 6.0 වර්ධනයක් වාර්තා කරමින් ඉදිකිරීම් අංශය නොකඩවා තුන්වන වර්ෂයටත් ඉහළ වර්ධන වේගයක් වාර්තා කළේය. පෞද්ගලික අංශයේ නිවාස, වාණිජ සහ කාර්මික ගොඩනැගිලි ඉදිකිරීම් වල සිදුවූ වැඩිවීම මගින් මෙම අංශයේ අඛණ්ඩ වර්ධනය පිළිබිඹු විය. පසුගිය වසර හා සසඳන විට 1994 දී රාජ්‍ය අංශයේ ඉදිකිරීම් වල සිදුවූ ව්‍යාප්තිය මගින් මෙම අංශයේ අඛණ්ඩ වර්ධනය පිළිබිඹු විය. පසුගිය වසර හා සසඳන විට 1994 දී රාජ්‍ය අංශයේ ඉදිකිරීම් කටයුතු සාපේක්ෂව පහළ මට්ටමක පැවතුනි.

## සේවා අංශය

1993 වසරේ සියයට 6.3 ක් වූ සේවා අංශයේ වර්ධනය 1994 දී සියයට 5.2 ක් දක්වා සුළු වශයෙන් පහත වැටීමට හේතු වූයේ කෘෂිකාර්මික හා කාර්මික අංශවල පැවති මන්දගාමී වර්ධනයයි. සේවා අංශයෙහි ප්‍රවාහන, ගබඩා සහ සන්නිවේදන අංශයේ වර්ධනය සියයට 3.1 ක් විය. ආනයන සහ අපනයන වෙළෙඳාම පුළුල් වීම හේතුවෙන් තොග සහ සිල්ලර වෙළෙඳ අංශය සියයට 6.4 ක වර්ධනයක් වාර්තා කළේය. 1994 වසරේදී ලැබුණු අධික වර්ෂාපතනය

නිසා ජල විදුලිබල උත්පාදනය සියයට 7.7 කින් ඉහළ ගිය අතර මෙම ඉහලයාම සහ නල ජල සැපයුමේ ව්‍යාප්තිය, විදුලිය, ජලය ගෑස් සහ සනීපාරක්ෂක සේවා අංශයේ ඉහළ වර්ධනයට ප්‍රධාන වශයෙන් දයක විය. 1993 වසරේ සියයට 10.8 ක් වූ බැංකු, මූල්‍ය සහ නිශ්චල දේපල අංශයේ වර්ධනය 1994 වසරේදී සියයට 9.5 ක් විය. සලකා බලන වසර තුල සිදුවූ මූල්‍ය සේවාවන්හී විවිධාංගීකරණයත් සමඟම බැංකු සේවා අංශයද ඉතා සක්‍රීය තත්ත්වයක පැවතිණ. පසුගිය වසරේ තරමක පසුබෑමකට ලක්ව තිබූ සංචාරක කර්මාන්තය 1994 වසරේදී, සංචාරක ආගමනය සහ විදේශිය විනිමය ඉපැයීම් අතින් යථාතත්වයට පත්වෙමින් පැවතුනි. සංචාරක ආගමනය හා විදේශ විනිමය ඉපැයීම් පිළිවෙලින් සියයට 3.9 කින් සහ සියයට 10.2 කින් වැඩිවිණි. 1993 වසරේ සියයට 2.0 ක්වූ අනිකුත් අංශවල වර්ධන වේගය පසුගිය වසරේ සියයට 2.5 දක්වා වැඩි වූයේ සංචාරක කර්මාන්තයේ ඇති වූ මෙම ප්‍රගතිය නිසාය.

## කෘෂිකර්මය

1994 වර්ෂයේ තේ නිෂ්පාදනය පසුගිය වර්ෂයට වඩා සියයට 4 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් කිලෝග්‍රෑම් දශලක්ෂ 242 ක් විය. මෙය මෙතෙක් වාර්තා වී ඇති ඉහළම තේ නිෂ්පාදනය වේ. වර්ෂය තුල පැවති යහපත් කලගුණික තත්ත්වය, පෞද්ගලික කළමනාකරණ සමාගම් යටතේ වැඩිදියුණු වූ කළමනාකාරිත්වය සහ කලින් වසරේ වැඩි වූ පොහොර භාවිතයේ පසුකාලීන බලපෑම මෙම ඉහළ නිෂ්පාදනයට හේතු විය. 1993 වර්ෂයේ පහත් බිම් තේ නිෂ්පාදනය සියයට 28 කින් වැඩි වී කිලෝග්‍රෑම් දශලක්ෂ 112 ක් වූ අතර, 1994 වර්ෂයේ එය තවදුරටත් සියයට 5 කින් වර්ධනය වී කිලෝග්‍රෑම් දශලක්ෂ 118 ක් විය. උස්බිම් තේ නිෂ්පාදනය සියයට 6 කින් වැඩි වී කිලෝග්‍රෑම් දශලක්ෂ 77 ක් ලෙස වාර්තා වූ අතර, මැදිබිම් තේ නිෂ්පාදනය 1993 වර්ෂයේ පැවති මට්ටමෙහිම නොවෙනස්ව පැවතිණි. මේ අතර සී.ටී.සී. (කපා, ඉරා, අඹරන ලද) තේ නිෂ්පාදනය සියයට 40 කින් වැඩි වී 1994 වර්ෂයේ කිලෝග්‍රෑම් දශලක්ෂ 11.2 ක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මුළු තේ නිෂ්පාදනයට සී.ටී.සී. තේ නිෂ්පාදනයේ දයකත්වය 1993 වර්ෂයේ සියයට 3 සිට 1994 වර්ෂයේ සියයට 4 දක්වා වැඩිවිය.

කොළඹ තේ වෙන්දේසියේ සියළුම වර්ගවල තේ සඳහා වූ සාමාන්‍ය දළ මිළ 1993 වර්ෂයේ කිලෝග්‍රෑමයකට රුපියල් 68.88 සිට 1994 වර්ෂයේදී කිලෝග්‍රෑමයකට රුපියල් 65.12 ක් දක්වා සියයට 5 කින් පහත වැටුණි. 1993 දී කිලෝග්‍රෑමයකට රුපියල් 91.16 ක්ව පැවති සාමාන්‍ය අපනයන මිළ (නැ. වි. ස.) සුළු වශයෙන් වැඩි වී 1994 දී කිලෝග්‍රෑමයකට රුපියල් 91.32 ක් විය. මේ අතර, සකස් කරන ලද තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 1994 වර්ෂයේදී රුපියල් 73.83 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය පසුගිය වර්ෂයේ නිෂ්පාදන පිරිවැයට වඩා සියයට 3 ක අඩුවීමකි.

1994 වර්ෂයේදී කිලෝග්‍රෑම් දශලක්ෂ 105 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති රබර් නිෂ්පාදනය පසුගිය වසරට වඩා සියයට 1 ක වර්ධනයක් පෙන්නුම් කළේය. රබර් වගාව යටතේ ලියාපදිංචි වී ඇති මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 794 කින් සුළු වශයෙන් අඩුවී හෙක්ටයාර 1,91,554 ක් වුවද කිරි කැපීම යටතේ වූ මුළු බිම් ප්‍රමාණය සියයට 4 කින් වැඩි වී හෙක්ටයාර 1,51,600 ක් විය. වර්ෂය තුළදී ෂීට් රබර් සහ ක්‍රේප් රබර් නිෂ්පාදනය වැඩි විය. මුළු නිෂ්පාදිතයෙන් සියයට 42 ක් ලෙස ගණනය කොට ඇති ෂීට් රබර් නිෂ්පාදනය සියයට 1 කින් ඉහළ ගොස් කිලෝග්‍රෑම් දශලක්ෂ 44 ක් වූ අතර, ක්‍රේප් රබර් නිෂ්පාදනය සියයට 4 කින් ඉහළ ගොස් කිලෝග්‍රෑම් දශලක්ෂ 35 ක් විය. මීට එරෙහිව යමින්, තාක්ෂණිකව විශේෂණය කරන ලද රබර් නිෂ්පාදනය සියයට 6 කින් පහත වැටී කිලෝග්‍රෑම් දශලක්ෂ13 ක් විය. 1993 වර්ෂයේ කිලෝග්‍රෑම් 714 ක් වූ හෙක්ටයාරයක සාමාන්‍ය එලදව 1994 වර්ෂයේදී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 692 දක්වා පහත වැටුණි. පුහුණු කිරි කපන්නන්ගේ හිඟය හේතුකොටගෙන කිරි කැපීමේ දින ගණන අඩුවීම රබර් එලදව පහත වැටීමට මූලික වශයෙන් හේතු විය. රබර් පරිභෝජනය කරන ප්‍රධාන රටවල ඉල්ලුම වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස සියළුම රබර් වර්ගයන්හී සාමාන්‍ය අපනයන (නැ.වි.ස.) මිළ 1993 වර්ෂයේ දී පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 44.34 සිට 1994 දී කිලෝග්‍රෑමයකට රුපියල් 51.81 දක්වා සියයට 17 ක වර්ධනයක් වාර්තා කළේය. 1994 වර්ෂයේ කොළඹ රබර් වෙන්දේසියේ ආර්. එස්. එස්. 1 හි සාමාන්‍ය මිළ කිලෝග්‍රෑමයකට රුපියල් 50.48 දක්වා සියයට 42 කින් වැඩි වූ අතර ආර්. එස්. එස්. 2 හි සාමාන්‍ය මිළ කිලෝග්‍රෑමයකට රු. 49.57 දක්වා සියයට 47 කින්

වැඩි විය. මේ අතර කුඩා රබර් වතු හිමියන් ද ඇතුළු පුද්ගලික අංශයේ රබර් නිෂ්පාදන පිරිවැය සියයට 8 කින් වැඩි වී 1994 දී කිලෝග්‍රෑමයකට රුපියල් 24.90 ක් විය. එසේ වුවද, මෙම අංශය නිෂ්පාදන ආන්තිකයේ වර්ධනයක් වාර්තා කරමින් සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කරන ලදී.

1985 වර්ෂයේ සිට ක්‍රමවත් ලෙස වර්ධනය වූ දේශීය රබර් පරිභෝජනය 1994 දී කිලෝග්‍රෑම් දශලක්ෂ 34 දක්වා සියයට 3 කින් තවදුරටත් වර්ධනය විය. මෙය එම වසරෙහි මුළු නිෂ්පාදිතයෙන් සියයට 32 ක් ලෙස ගණන් බලා ඇත. දේශීය රබර් පරිභෝජන මට්ටම වැඩිවීම කෙරෙහි රබර් ආශ්‍රිත කර්මාන්තවල ඇති වූ සැලකිය යුතු වර්ධනය හේතු විය.

1994 වර්ෂයේ පොල් ගෙඩි නිෂ්පාදනය, පසුගිය වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 21 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් පොල් ගෙඩි දශලක්ෂ 2,610 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. මෙය 1986 න් පසු වාර්තා වී ඇති වැඩිම නිෂ්පාදන මට්ටම වේ. 1993 වර්ෂයේ පැවති යහපත් කාලගුණික තත්ත්වයේ පසු කාලීන බලපෑම පොල් නිෂ්පාදනය වැඩිවීමට හේතු විය. පොල් ගෙඩි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස කපාපු පොල් නිෂ්පාදනයේ ගෙඩි සමානය සියයට 41 කින් වර්ධනය වී ගෙඩි දශලක්ෂ 380 ක් වූ අතර, එය 1986 න් පසු වාර්තා වූ වැඩිම ප්‍රමාණය විය. 1990 වර්ෂයේ සිට අඩුවන ප්‍රවනතාවයක් පෙන්නුම් කළ පොල් තෙල් නිෂ්පාදනයේ ගෙඩි සමානය 1994 වර්ෂයේදී තෙගුණයකින් වර්ධනය වී ගෙඩි දශලක්ෂ 480 ක් විය. කොප්පරා අපනයනයේ ගෙඩි සමානය හා ගෙඩි පොල් අපනයනය පිළිවෙලින් සියයට 29 කින් හා සියයට 18 කින් වර්ධනය වී 1994 වර්ෂයේ ගෙඩි දශලක්ෂ 31 ක් හා ගෙඩි දශලක්ෂ 26 ක් විය. දේශීය පොල් පරිභෝජනය සියයට 1 කින් වර්ධනය වී ගෙඩි දශලක්ෂ 1,687 ක් වූ අතර, එය 1994 වර්ෂයේ මුළු පොල් නිෂ්පානයෙන් සියයට 65 ක් ලෙස ගණන් බලා ඇත.

කෝපි සහ කරදමුංගු හැර අනෙකුත් සුළු අපනයන බෝග බොහොමයක නිෂ්පාදනය ඉකුත් වසර හා සසඳන කළ නොවෙනස්ව පැවතුණි. පසුගිය වසරෙහි සියයට 39 ක පහත වැටීමක් වාර්තා කළ කෝපි නිෂ්පාදනය 1994 වසරේදී මෙට්‍රික් ටොන් 3,687 ක් දක්වා සියයට 83 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගියේය. හිතකර කාලගුණික තත්ත්වය සහ පොහොර භාවිතය වැඩිවීම 1994 දී කෝපි නිෂ්පාදනය ඉහළ යෑම කෙරෙහි බලපෑවේය. 1993 දී සියයට 30 කින් පහත වැටුණු කරදමුංගු නිෂ්පාදනය 1994 දී මෙට්‍රික් ටොන් 40 දක්වා සියයට 33 කින් ඉහළ ගියේය. කරුඳු පොතු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 9,696 දක්වා සියයට 2 ක වර්ධනයක් වාර්තා කළ අතර, කොකෝවා නිෂ්පාදනයද මෙට්‍රික් ටොන් 1,463 දක්වා සුළු වශයෙන් වැඩි විය.කරාබු නැටි සහ සාදික්කා නිෂ්පාදනය 1993 වර්ෂයේ පැවති මට්ටමෙහිම පැවතුණි. 1993 වර්ෂයේදී ඉහළම වාර්තාගත නිෂ්පාදනයක් පෙන්නුම් කළ ගම්මිරිස් 1994 දී මෙට්‍රික් ටොන් 4,694 දක්වා සුළු අඩුවීමක් වාර්තා කළේය.

1994 වර්ෂයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශලක්ෂ 2.68 (බුසල් දශලක්ෂ 129) වූ අතර මෙය පසුගිය වසරේ නිෂ්පාදනයට වඩා සියයට 4.4 ක වැඩිවීමකි. මෙය 1985 වර්ෂයෙහි වාර්තාගත වූ ඉහළම වී නිෂ්පාදනයට වඩා මෙට්‍රික් ටොන් 23,000 ක (බුසල් දශලක්ෂ 1.1) වැඩිවීමක් වන අතර මේ දක්වා වාර්තාගත වූ වැඩිම වී නිෂ්පාදනය වේ. මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.67 ක් (බුසල් දශලක්ෂ 80) ලෙස ඇස්තමේන්තු කරන ලද 1993/94 මහ කන්නයෙහි වී නිෂ්පාදනය පසුගිය මහ කන්නයෙහි නිෂ්පාදනයට වඩා සියයට 1 ක අඩුවීමක් පෙන්වූයේ සාමාන්‍ය ඵලදාවේ පහත වැටීම හේතුවෙනි. 1993 වර්ෂයේ දී සියයට 24 කින් ඉහළ ගිය යල කන්නයේ වී නිෂ්පාදනය 1994 වර්ෂයේදී තවදුරටත් සියයට 16 කින් වැඩි වී මෙට්‍රික් ටොන් දශලක්ෂ (බුසල් දශලක්ෂ 49) ඉක්මවීය. සාමාන්‍ය ඵලදාවෙහි අඩුවීමක් දක්නට ලැබුණ ද, වපුරන ලද සහ අස්වනු කපා ගන්නා ලද බිම් ප්‍රමාණය වැඩිවීම හේතුකොටගෙන යල කන්නයෙහි වී නිෂ්පාදනය ඉහළ ගියේය. අපතේ යෑම් සහ බීජ අවශ්‍යතා සඳහා වූ වෙන් කිරීමෙන් අනතුරුව වී නිෂ්පාදනයෙහි සහල් සාමානය මෙට්‍රික් ටොන් 1,606,000 කි. මෙය ඇස්තමේන්තුගත වාර්ෂික පරිභෝජනය හා සසඳන කල ස්වයංපෝෂිත අනුපාතයෙන් සියයට 87 කි. පසුගිය වසරේ ස්වයංපෝෂිත අනුපාතය සියයට 84 ක් විය. ඉහළ ගිය වී නිෂ්පාදනය හේතුවෙන් 1993 දී මෙට්‍රික් ටොන් 209,000 ක් වූ ආනයනික සහල් ප්‍රමාණය 1994 දී මෙට්‍රික් ටොන් 58,000 දක්වා පහත වැටුනි.

1994 වර්ෂයේ සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 72,275 ක් විය. මෙය මෙතෙක් වාර්තාගත ඉහළම නිෂ්පාදනය වන අතර, 1993 වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 5 ක වැඩිවීමකි. ඉකුත් වසරෙහිදී මෙන් හිඟුරාන, පැල්වත්ත සහ සෙවනගල යන කම්හල් තුනම සීනි නිෂ්පාදනය වැඩිකිරීමට දයක විය. මෙට්‍රික් ටොන් 14,058 ක් වන හිඟුරාන කම්හලෙහි නිෂ්පාදනය සියයට 9 කින්ද 1993 වර්ෂයේදී සියයට 17 කින් ඉහළ ගිය සෙවනගල කම්හලෙහි සීනි නිෂ්පාදනය 1994 දීද, එම ප්‍රතිශතයෙන්ම ඉහළ යමින් මෙට්‍රික් ටොන් 18,535 දක්වා වර්ධනයක් වාර්තා කළේය. පැල්වත්ත කම්හලෙහි නිෂ්පාදනය 1994 දී මෙට්‍රික් ටොන් 39,682 දක්වා සුළු වශයෙන් වැඩිවිය. විමසුමකට ලක්වන කාලය තුළදී කන්තලේ සීනි කම්හලෙහි නිෂ්පාදනයක් වාර්තා වී නොමැත. සීනි නිෂ්පාදනය වැඩිවීමට හේතු වූයේ ඇඹරීමට යොද ගත් උක්දඩු ප්‍රමාණයේ වැඩිවීමයි.

අතුරු ආහාර බෝග අංශය 1994 වර්ෂයේ දී මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්විය. ලොකු ළූණු නිෂ්පාදනය දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වැඩිවී මෙට්‍රික් ටොන් 81,000 ක් වූ අතර, සෝයාබෝංචි, රටකජු සහ කුරක්කන් නිෂ්පාදනය පිළිවෙලින් සියයට 46 කින්, සියයට 33 කින් සහ සියයට 9 කින් වැඩිවිය. ලොකුළූණු , සෝයා බෝංචි සහ රටකජු යන බෝගයන්හි අස්වැන්න වැඩිවීමට හේතු වූයේ වගා කරන ලද බිම් ප්‍රමාණයේ ඇති වූ සැළකිය යුතු වැඩිවීමයි. මේ අතර අනෙකුත් අතිරේක ආහාර බෝගයන් වන මිරිස්, අර්තාපල්, රතුළූණු, මුං ඇට, උඳු, කව්පි, තල සහ බඩ ඉරිඟු නිෂ්පාදනයන්හි අඩුවීමක් 1994 වසරේදී වාර්තා විය.

1994 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය පසුගිය වර්ෂයට වඩා සියයට 1 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 224,000 ක් විය. මුළු මත්ස්‍ය නිෂ්පාදනයට සියයට 78 කින් දයක වූ වෙරළබඩ මත්ස්‍ය නිෂ්පාදනය 1993 වර්ෂයේ මෙට්‍රික් ටොන් 169,900 සිට සියයට 3 ක වැඩිවීමක් පෙන්වමින් 1994 වර්ෂයේ මෙට්‍රික් ටොන් 174,500 ක් විය. ගැඹුරු මුහුද සහ දියඹ යන අනු අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 14 කින් වර්ධනය වී මෙට්‍රික් ටොන් 37,500 ක් විය. මෙයට වෙනස්ව යමින් 1994 වර්ෂයේදී මිරිදිය ධීවර අනු අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 33 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 12,000 ක් විය. මිරිදිය ධීවර අංශයේ 1989වසරේදී මුළු මත්ස්‍ය නිෂ්පාදනයට සියයට 19 කින් දයක වීමත් සමඟ සසඳන විට මෙම වර්ෂයේ දී මුළු නිෂ්පාදනයට දයක වී ඇත්තේ සියයට 5 කින් පමණි.

## කර්මාන්ත

ජාතික මැතිවරණ කටයුතු මධ්‍යයේ පැවති රටේ අසතුටුදයක සාර්ව ආර්ථික වාතාවරණය, ඇමරිකා එක්සත් ජනපදයෙන් රටට ලැබුණු ඇඟළුම් පංගු ප්‍රමාණය පිළිබඳ පැවති අවිනිශ්චිත තත්ත්වය සහ වසර අවසානයේ කර්මාන්ත අංශයේ පැවති බාධාකාරී තත්ත්වයත් නිසා 1994 වසරේ කර්මාන්ත අංශය මධ්‍යස්ත වර්ධනයක් පෙන්නුම් කළේය. 1993 වර්ෂයේ දී මූර්ත වශයෙන් සියයට 14 කින් වර්ධනය වූ කාර්මික නිමැවුම් වල වටිනාකම සමඟ සසඳා බලන විට 1994 දී සියයට 9 කින් වර්ධනය විය. 1994 වර්ෂයේ දී පෞද්ගලික අංශයේ කාර්මික නිමැවුම් සියයට 11 කින් වර්ධනය වෙමින් රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙහි සියයට 5 ක පහත වැටීම අභිබවා ගියේය.

1993 දී මූර්ත වශයෙන් සියයට 13 කින් වර්ධනය වූ පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිෂ්පාදන වටිනාකම 1994 දී තවදුරටත් සියයට 11 කින් වර්ධනය විය. මුළුමනින්ම පෞද්ගලික අංශයේ කර්මාන්තවලින් සමන්විත වූ රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන උප අංශයෙහි නිෂ්පාදනය පසුගිය වසරේ වාර්තා කළ සියයට 17 වර්ධනය හා සසඳන විට 1994 දී සියයට 6 කින් වර්ධනය විය. ලබා ගතහැකි සලාක පිළිබඳ තිසි ඇගයීමක් නොමැති කමින් ඇඟළුම් අංශයේ අධි ධාරිතාවක් පැවතීම, 1994 වර්ෂයේදී එම අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. අපනයනය මුල් කරගත් කර්මාන්ත සඳහා පැවති අඩු මිළ ගනන් සහ ප්‍රධාන රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්ත කිහිපයක පැවති කම්කරු ආරවුල් ද ඇඟළුම් අංශයේ නිෂ්පාදන වටිනාකම පහත වැටීමට හේතු විය. වර්ෂය තුළදී සම් භාණ්ඩ නිෂ්පාදනයන්හි කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආයෝජන ප්‍රවර්ධන කලාපයට අයත් සම් භාණ්ඩ නිෂ්පාදන ව්‍යවසායයන්හි ඉහළ ක්‍රියාකාරීත්වය නිසාය. 1994 දී පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදනයෙන් සියයට 26 කට පමණ දයක වූ ආහාර, පාන වර්ග හා දුම්කොළ කාණ්ඩයෙහි සියයට 8 ක වර්ධනයක් ඇති විය. මෙම කාර්මික උප අංශයෙහි වර්ධනය කිරි

නිෂ්පාදන විස්කෝතු, රස කැවිලි, සැකසූ පළතුරු, එළවළු සහ මාංශ නිෂ්පාදන යන නිෂ්පාදනවල, ඉහළ ක්‍රියාකාරිත්වය තුළින් නිරූපනය විය. එහෙත් ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩයෙහි මුළු නිෂ්පාදනයට ප්‍රධාන වශයෙන් දයක වූ දුම්කොළ නිෂ්පාදනයෙහි පැවති කම්කරු ආරවුලත්, දේශීය ඉල්ලුම පහළ යෑමත් නිසා 1994 දී නිෂ්පාදනයෙහි සුළු වශයෙන් අඩුවීමක් වාර්තා විය. ප්‍රධාන සත්ව ආහාර නිෂ්පාදන ආයතනයක පැවති කම්කරු ආරවුල් නිසා කුකුල් ආහාර නිෂ්පාදනයේ අඩුවීමක් වාර්තා විය.

1994 වසරේදී රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත ගණයෙහි මුළු නිෂ්පාදිතයෙන් අඩකට පමණ දයක වූයේ පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිෂ්පාදනයයි. කෘෂි රසායන, ඖෂධ වර්ග, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන, සබන් සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි නියැළුණු පෞද්ගලික අංශයේ කර්මාන්ත ඉහළ නිෂ්පාදන මට්ටමක් වාර්තා කර ඇත. 1994 දී කාර්මික හා චිකිත්සක අත්වැසුම් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනයෙහි නියැළුණු අපනයනය මුල් කරගත් ආයෝජන ප්‍රවර්ධනය කලාපයට අයත් කර්මාන්ත ද ඉහළ ක්‍රියාකාරිත්වයක් වාර්තා කර ඇත.

ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන උප අංශයෙහි මුළු නිෂ්පාදිතයෙන් පහෙන් හතරකට පමණ දයක වූ පෞද්ගලික අංශයේ කර්මාන්ත 1994 දී අඛණ්ඩව වර්ධනය විය. ඉදිකිරීම් කටයුතුවල වර්ධනය නිසා ජනිත වූ ඉහළ ඉල්ලුම් ප්‍රමාණය සපුරාලීම සඳහා සිමෙන්ති, වීදුරු හා වීදුරු නිෂ්පාදන සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදනයෙහි නියැලි පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හී ඉහළ නිෂ්පාදන මට්ටමක් වාර්තා විය. කෙසේ වෙතත් පිඟන් භාණ්ඩ නිෂ්පාදනය කම්කරු ආරවුල් හේතුවෙන් පහත වැටිනි. ඩොලමයිට් නිෂ්පාදන, කුඩා පෝසිලේන් ප්‍රතිමා සහ කපා ඔප දැමූ කළුගල් නිෂ්පාදයෙහි නියැළුණු ආයෝජන ප්‍රවර්ධන කලාපයට අයත් කර්මාන්තයන්හි නිෂ්පාදනවල වර්ධනයක්පෙන්නුම් කර ඇත.

කඩදසි හා කඩදසි නිෂ්පාදන උප අංශයේ වූ පෞද්ගලික කර්මාන්ත 1994 වර්ෂය තුළදී සියයට 16 ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම වර්ධනයට විශාල වශයෙන් මුද්‍රණ කටයුතු, කඩදසි හා කඩදසි නිෂ්පාදන, ලේබල් සහ ඇසුරුම් ද්‍රව්‍ය නිෂ්පාදනයේ නියැළුණු කර්මාන්තයන් මුල් විය. පසුගිය වසරේ දුර්වල ක්‍රියාකාරිත්වයක් වාර්තා කළ සකස් කළ, ලෝහ නිෂ්පාදන උප අංශය 1994 දී සියයට 14 ක සැළකිය යුතු නිෂ්පාදන වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙම වර්ධනයට විශාල වශයෙන් හේතු වූයේ සකස් කළ ලෝහ, විද්‍යුත් උපකරණ, බැටරි, කේබල් සහ විදුලි බුබුළු නිෂ්පාදනයේ නියැළුණු පෞද්ගලික අංශයේ කර්මාන්තයන්ගේ වර්ධනයයි. බස් සහ ලොරි බොඩි තැනීමේ කර්මාන්තයේ නියුක්ත පුද්ගලික අංශයේ කර්මාන්තද ඉහළ නිෂ්පාදන මට්ටමක් වාර්තා කර ඇත.

මූර්ත වටිනාකම අනුව පසුගිය වර්ෂයේ සියයට 20 ක වර්ධනය හා සැසැඳීමේ දි 1994 වර්ෂයේදී රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 5 කින් පහත වැටුනි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රාජ්‍ය අංශය යටතේ තිබූ සිමෙන්ති සහ පිඟන් භාණ්ඩ නිෂ්පාදන ආයතනවල අයිතිය පෞද්ගලික අංශයට මාරු කිරීම හේතුකොටගෙන ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාර්මික ගණයේ නිමැවුම තියුණු ලෙස පහත වැටීමය. රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදිත වටිනාකමෙන් සියයට 78 කට පමණ දයක වූ ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ නිෂ්පාදිත වටිනාකම 1994 වර්ෂයේ දි සියයට 4 කින් වැඩි විය. ඛනිජ තෙල් නිෂ්පාදිත වටිනාකම බැහැර කළවිට රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 33 කින් පහත වැටුණු බවට ඇස්තමේන්තු කර ඇත.

## මිළ

කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය මගින් මනිනු ලබන සාමාන්‍ය මිළ මට්ටම ඉහළ යාමේ අනුපාතය, 1993 වසරේ වූ සියයට 11.7 ක වැඩිවීම සමහ සසඳන විට 1994 වසරේදී වැඩිවීම සියයට 8.4 ක් විය. ආහාර, රෙදිපිළි, ඉන්ධන හා විදුලිය සහ විවිධ යන උප කාණ්ඩවල වර්ධන වේගය 1993 ට වඩා 1994 දී අඩුවීම මෙයට හේතුවිය. පරිපාලන මිළ ගණන්වල පහත හෙලීම නිසා ආහාර සඳහා වූ උප දර්ශකය නනි සංඛ්‍යාවක් දක්වා පහත වැටුනි. වසරේ අග භාගයේ, සීනි, කරවල සහ පරිප්පු සඳහා වූ ආනයනික තීරුබදු ගාස්තුවල ඉවත් කිරීම් හා අඩුකිරීම්

සිදු වූ අතර පාන් සහ පිටි මිළ ගණන් ද පහත දමන ලදි. භූමිතෙල් සහ ඩීසල් මිළ ගණන්ද අඩු කරන ලදි. රෙදිපිළි හා විවිධ කාණ්ඩයේ මිළ ගනන් ඉහළ යන ප්‍රවණතාව අඩුවීමත්, මිරිස් සහ පොල්වල වෙළෙඳපොළ මිළ ගනන් පහත වැටීමත්, සහල් මිළ ස්ථාවර තත්වයක පැවතිම සහ ආහාර ද්‍රව්‍යවල තීරුබදු අඩු කිරීමත් නිසා 1994 වර්ෂයේ උද්ධමන වේගය පාලනය කර ගැනීමට හැකිවිය. කෙසේ වෙතත්, පුළුල් මුදල් සැපයුම සියයට 19.6 කින් වැඩිවීමත් සමඟ සාමාන්‍ය මිළ මට්ටම මත ඉල්ලුම් පීඩනය නොවෙනස්ව පැවතුණි.

1993 වර්ෂයේ දී මෙන්ම 1994 වර්ෂයේදී ද මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකය කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයට වඩා අඩු වර්ධනයක් පෙන්නුම් කලේය. මිළ දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම 1993 වර්ෂයේ සියයට 8.4 සමඟ සසඳන කළ 1994 වර්ෂයේදී ද සියයට 4.8 ක් විය. මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයට අනුව, පසුගිය වර්ෂයේ 8.7 කින් වර්ධනය වූ ආහාර මිළ ගණන් වර්ෂය තුළදී සියයට 4 කින් වර්ධනය විය. මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයේ ඉන්ධන සහ ආලෝක කාණ්ඩයේ මිළ ගණන් පසුගිය වර්ෂයේදී මෙන්ම සියයට 17 කින් වැඩිවිය. රෙදිපිළි සහ පාවහන් අංශයේ මිළ ගණන්වල වැඩිවීම පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 8.2 කට වඩා සැළකිය යුතු ලෙස අඩුවී සියයට 3.9 ක් විය. මත්පැන්, දුම්කොළ, බුලත් හා පුවක්, පෞද්ගලික සාත්තු හා සෞඛ්‍ය සේවා, ගෘහස්ථ භාණ්ඩ සේවා සහ ප්‍රවාහන හා සංනිවේදන අංශයන්හි මිළ ගණන්වල වැඩිවීම පිළිවෙලින් සියයට 8.2 කින්, සියයට 6.7 කින් සහ සියයට 0.5 වූ අතර මේවා පසුගිය වර්ෂයේ පෙන්නුම් කළ වැඩිවීම්වලට වඩා අඩුවිය.

ප්‍රාථමික වෙළෙඳ මට්ටම්වල මිළ වෙනස්වීම් ගණනය කරනු ලබන තොග මිළ දර්ශකය 1993 වර්ෂයේ සියයට 7.6 ක වැඩිවීම සමඟ සසඳන කල 1994 වර්ෂයේ දි සියයට 5 කින් වැඩි විය. වර්ෂය තුළදී පවතින මිළ ගණන් වැඩිවීමේ අනුපාතය අඩුවීම කෙරෙහි විශාල ලෙස දයක වූයේ ප්‍රධාන අපනයන බෝග වන තේ සහ පොල් වල මිළ ගණන් පහත වැටීමයි. වර්ෂය තුළදී ආහාරවල මිළ ගණන් සුළු වශයෙන් පහත වැටුණු අතර මධ්‍යසාර අඩංගු බීම, රෙදිපිළි සහ පාවහන්, රසායනික සහ රසායනික නිෂ්පාදන සහ ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි මිළ ගනන් පසුගිය වර්ෂයේ වාර්තාගත වැඩිවීම් සමඟ සසඳන කළ විශාල වශයෙන් පහත වැටුණි. වර්ෂය තුළදී ලෝහ නොවන නිෂ්පාදන, ඉන්ධන හා ආලෝක සහ විවිධ අංශයන්හි මිළ ගණන්වල තියුණු වැඩිවීමක් දක්නට ලැබුණි.

## වැටුප්

රාජ්‍ය අංශයේ වැටුප් වෙනස්වීම් මනිනු ලබන්නේ රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් දර්ශක වලිනි. 1994 වර්ෂය තුළදී සියලුම මධ්‍යම රජයේ සේවකයන් සඳහා වූ නාමික වැටුප් දර්ශකය සියයට 8.9 කින් වැඩිවිය. මෙම අංශයේ මූර්ත වැටුප් දර්ශකය සියයට 0.5 කින් සුළු වශයෙන් වැඩිවිය. කෙසේ වෙතත් නව වැටුප් තලයන් ක්‍රියාත්මක කිරීම නිසා 1993 වසරේ දී නාමික වැටුප් දර්ශකය සහ මූර්ත වැටුප් දර්ශකය පිළිවෙලින් සියයට 21.1 කින් සහ සියයට 8.3 කින් තීව්‍ර ලෙස වැඩිවිණි. 1994 දී විධායක නොවන නිලධාරීන්ගේ නාමික වැටුප් දර්ශකය සියයට 11.3 කින් ඉහළ ගිය අතර මූර්ත වැටුප් දර්ශකය වැඩි වූයේ සියයට 2.8 කිනි. මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවයේ සහ ලිපිකරු හා ඊට සමාන ශ්‍රේණිවල තිබූ වැටුප් විෂමතා 1994 අගෝස්තු මස නිවැරදි කිරීම මෙම විධායක නොවන නිලධාරීන්ගේ වැටුප් වැඩිවීමට හේතු විය. 1994 වසරේදී සුළු සේවකයින්ගේ වැටුප් දර්ශකය සියයට 6 කින් වර්ධනය වූ අතර එය මූර්ත වැටුප් දර්ශකයේ සියයට 2.2 අඩුවීමක් පෙන්නුම් කළේය. වසර තුළදී රජයේ පාසැල් ගුරුවරුන්ගේ වැටුප් දර්ශකය සියයට 5 කින් ඉහළ ගිය ද මූර්ත වටිනාකම අනුව එය වැටුප් දර්ශකයේ සියයට 3 ක පහළ බැසීමක් පෙන්නුම් කළේය.

1994 වසරෙහි දී, වැටුප් පාලක මණ්ඩලය යටතේ ආවරණය වන සේවකයින්ගේ වැටුප් වර්ධනය 1993 වසරෙහිදි සියයට 16.2 හි සිට සියයට 3.9 දක්වා පසුබැසීමක් දක්නට ලැබුණි. පඩි පාලක මණ්ඩලය යටතේ වන සේවකයින්ගේ මූර්ත වැටුප් 1994 වර්ෂය තුළදී සියයට 4.2 කින් අඩු විය. මෙය ඉකුත් වසරෙහිදී සියයට 4.1 කින් වර්ධනය වීය. 1994 වර්ෂයේදී කෘෂිකාර්මික අංශයේ සේවකයින් ලත් සියයට 2.2 ක නාමික වැටුප් වර්ධනය, සියයට 5.7 කින් මූර්ත වැටුප

පහත වැටීමක් පිළිබිඹු කළේය. ඉකුත් වසරෙහිදී කෘෂිකාර්මික අංශයේ සේවකයින්ගේ නාමික වැටුප් සියයට 21.1 කින් සැළකියයුතු ලෙස ඉහල ගිය අතර මූර්ත වැටුප් සියයට 8.3 කින් වැඩි විය. 1993 ජනවාරි මාසයේ දී සේවකයින්ට ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව වෙනුවට රුපියල් 12 ක් වූ අයවැය ප්‍රතිපාදන දීමනාවක් ලබා දීම නිසා රාජ්‍ය වැවිලි අංශයේ වැටුප් නොවෙනස්ව පැවතුණි. වර්ෂය තුළදී සේවා අංශයේ සේවකයින්ගේ නාමික වැටුප් තියුණු ලෙස සියයට 17.9 කින් වැඩි වූ අතර ඔවුන්ගේ මූර්ත වැටුප් වැඩිවූයේ සියයට 8.7 කිනි. කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයින්ගේ වැටුප් වර්ධනය පසුගිය වර්ෂයේ ලියාපදිංචි වූ වැඩිවීමටත් (සියයට 3.4) වඩා වැඩි වී 1994 වර්ෂයේ සියයට 5.2 ක් විය. 1994 වර්ෂයේදී සාත්තු නිවාස, රෙදිපිළි කර්මාන්ත ශාලා සහ වෙළෙඳ ප්‍රවාහන අංශයන්හී සේවකයින්ගේ අවම වැටුප් ඉහළට ප්‍රතිශෝධනය විය.

1994 වර්ෂය තුළදී සංවිධානය නොවූ අංශයන්හී සියළුම කාර්යයන් සඳහා වූ නාමික වැටුප් වර්ධනය විය. මෙම වර්ධනය වී වගා අංශය තුළ සියයට 8 ත් සියයට 17 ත් අතර විය. වී වගා අංශයේ සියලුම කාර්යයන්ගේ මූර්ත වැටුප් වර්ධනය විය. පොල් වගා අංශයේ නාමික වැටුප් විශාල වශයෙන් වැඩිවීම නිසා මූර්ත වැටුප්ද වර්ධනය විය. සංසන්දනාත්මකව බලන කල තේ සහ රබර් වගා අංශයන්හි වැටුප් වර්ධනය වීම ඉතා සුළු වශයෙන් සිදු වූ නිසා මේ අංශවල මූර්ත වැටුප් පහත වැටීමක් ඇතිවුණි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියළුම ශ්‍රමිකයින්ගේ නාමික වැටුප් සියයට 10 සිට සියයට 11 අතර ප්‍රමාණයකින් වැඩිවිය.

## සේවා නියුක්තිය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලැබූ වාර්ෂික සේවා නියුක්ති සමීක්ෂණයකට අනුව, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශ ඇතුලත් වන රාජ්‍ය අංශයෙහි මුළු සේවා නියුක්තිය 1994 දී දශලක්ෂ 1.32 දක්වා සියයට 2 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය විය. මධ්‍යම රජය, අමාත්‍යංශ සහ දෙපාර්තමේන්තු, පලාත් සභා සහ පලාත් පාලන අධිකාරියන් ඇතුලත් රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය 699,898 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1993 ට වඩා සියයට 3.5 ක වර්ධනයක් වාර්තා කළේය. මෙම වැඩිවීම, විශාල වශයෙන් පිළිබිඹු වූයේ වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය සේවයේ නිරත පුද්ගල කාණ්ඩයෙහි සහ ලිපිකරු හා අදළ සේවක කාණ්ඩයෙහිය. මෙම කාණ්ඩයන් ඉකුත් වසරට වඩා පිළිවෙලින් සියයට 8 ක හා සියයට 6 ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබින. ප්‍රධාන වශයෙන් ආරක්ෂක සේවයේ නිරත පුද්ගලයන්ගෙන් සමන්විත වන සේවා අංශ සේවක කාණ්ඩය සියයට 4 කින් වැඩි විය. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල රාජ්‍ය අයිතිය ඇති ව්‍යාපාර සහ රාජ්‍ය බැංකු වලින් සමන්විත අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය සියයට 1 ක සුළු ප්‍රමාණයකින් 1994 තුලදී වැඩි විය. ලිපිකරු, වෘත්තීමය හා කාර්මික කාණ්ඩයන්හි වැඩිවීම මෙ මගින් පිළිබිඹු විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 1994 අවසානය වන විට පුද්ගලයන් 134,572 කට රැකියා සපයන ලදී. මෙය 1993 ට වඩා සියයට 10 ක වැඩිවීමකි. මෙම රැකියා වලින් සියයට 43 ක ප්‍රමාණයක් සැපයුනේ කටුනායක අපනයන ප්‍රවර්ධන කලාපය තුළ වූ වෙළෙඳ ආයතනවලය. බියගම සහ කොග්ගල අපනයන ප්‍රවර්ධන කලාප මගින් මුළු රැකියා ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 16 ක් සහ සියයට 4 ක් සපයනු ලැබින.

## වෙළෙඳම සහ ගෙවුම් තුලනය

1994 දී විදේශ වෙළෙඳ අංශය අහිතකර වර්ධනයන් කිහිපයක බලපෑමට ලක්විණි. ඇමරිකා එක්සත් ජනපදයට රෙදිපිළි අපනයන පංගු ලබා ගැනීම පිළිබඳ පැවති අවිනිශ්චිතභාවය, කාර්මික අංශයේ කටයුතු අඩාලවීම, සාර්ව ආර්ථික තත්වයන්හි පැවති පිරිහීම සහ ආර්ථිකයෙහි පැවති අධි ඉල්ලුම් පීඩනය යනාදියෙහි බලපෑම නිසා 1994 අපනයන වර්ධනය සියයට 9 ක මධ්‍යස්ථ වූ අතර ආනයන සියයට 16 කින් වැඩි විය. විදේශීය වෙළෙඳ අනුපාතයෙහි 1993 පැවති සියයට 2 ක වර්ධනයට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් පෙන්නුම් කරමින් 1994 දි සියයට 4.7 කින් පිරිහීමද, අපනයන වටිනාකමෙහි අඩු වර්ධනයට සහ ආනයනවල ඉහළ වර්ධනයකට දායක විය. මෙම වර්ධනයන්, වෙළෙඳ හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස 1993 සියයට 11 සිට 1994 සියයට 13 දක්වා වැඩි වීමට හේතු විය.

තේ අපනයන පරිමාව 1993 කිලෝග්‍රෑම් දශලක්ෂ 218 සිට කිලෝග්‍රෑම් දශලක්ෂ 230 දක්වා වැඩිවීමක් තිබියදීත් සාමාන්‍ය අපනයන මිළ 1994 දී කිලෝග්‍රෑමයකට විගැහි 1.29 දක්වා සියයට 4 කින් අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් තේ අපනයන වටිනාකම 1993 විගැහි දශලක්ෂ 295 (රුපියල් දශලක්ෂ 19,911 ) සිට 1994 විගැහි දශලක්ෂ 296 (රුපියල් දශලක්ෂ 20,964) දක්වා සුළු වැඩිවීමක් පමණක් පෙන්විය. කෙසේ වුවද, රබර් අපනයන පරිමාවෙහි කිලෝග්‍රෑම් දශලක්ෂ 69 දක්වා සුළු අඩුවීමක් තිබියදීත් ස්වභාවික රබර් සඳහා ජාත්‍යන්තර මිළ ගණන්හී පැවති යහපත් තත්ත්වය නිසා සාමාන්‍ය අපනයන මිළ කිලෝග්‍රෑමයකට විගැහි 0.73 (කිලෝග්‍රෑමයකට රුපියල් 51.81) දක්වා සියයට 11 කින් වැඩිවීම හේතුවෙන් 1994 දී රබර් අපනයන වටිනාකම විගැහි දශලක්ෂ 51 (රුපියල් දශලක්ෂ 3,582) දක්වා සියයට 11 කින් වර්ධනය විය.

පොල් අපනයන පරිමාව 1993 දී ගෙඩි දශලක්ෂ 293 සිට 1994 දි ගෙඩි දශලක්ෂ 436 දක්වා සියයට 49 ක කැපී පෙනන වැඩිවීමක් පිළිබිඹු කරමින් පොල් නිෂ්පාදිතයන්ගේ මුළු අපනයන ඉපැයීම් 1993 විගැහි දශලක්ෂ 41 (රුපියල් දශලක්ෂ 2,796) සිට 1994 විගැහි දශලක්ෂ 53 (රුපියල් දශලක්ෂ 3,761) දක්වා සියයට 29 කින් වැඩිවිය. කෙසේ වුවද,ලෝක වෙළෙඳපලෙහි පොල් සැපයුම වැඩිවීම හේතුවෙන් පොල් ගෙඩියක සාමාන්‍ය අපනයන මිළ 1993 විගැහි 0.09 සිට 1994 විගැහි 0.08 දක්වා සියයට 11 කින් අඩුවිය. කොහු කෙදි සහ කොහු ලණු ඇතුලත් පොල් අතුරු නිෂ්පාදිතයන්ගෙන් ලත් අපනයන ඉපැයීම් ද 1994 දී සියයට 29 කින් වැඩිවිය.

සුළු කෘෂිකාර්මික අපනයන වටිනාකම 1993 විගැහි දශලක්ෂ 86 (රුපියල් දශලක්ෂ 5,825) සිට 1994 විගැහි දශක්ෂ 90 ( රුපියල් දශලක්ෂ 6,385) දක්වා වැඩිවිය. අපනයන පරිමාවෙහි සියයට 57 ක වැඩිවීමක් පැවතුනද සුළු කෘෂිකාර්මික නිෂ්පාදිතවල සාමාන්‍ය අපනයන මිළ 1994 දී සියයට 33 ක තියුණු පහත වැටීමක් වාර්තා කළ බැවින් අපනයන ඉපැයීම් වැඩිවූයේ සියයට 5 කින් පමණි.

1994 දී විගැහි දශලක්ෂ 1,646 (රුපියල් දශලක්ෂ 116,744) ක් වූ කාර්මික අපනයන වටිනාකම, 1993 විගැහි දශලක්ෂ 1,487 (රුපියල් දශලක්ෂ 100,420) හා සැසඳීමේදී සියයට 11 ක වැඩිවීමක් පෙන්වනු ලැබිනි. 1993 දී කාර්මික අපනයන වටිනාකම සියයට 20 කින් වැඩිවිය. රෙදිපිළි සහ ඇහළුම් අපනයන ඉපැයීම් 1993 දී විගැහි දශලක්ෂ 1,009 (රුපියල් දශලක්ෂ 68,150) සිට 1994 දී විගැහි දශලක්ෂ 1,080 (රුපියල් දශලක්ෂ 76,614) දක්වා සියයට 7 කින් ඉහල නැගුණි. 1993 හි පැවති සියයට 17 ක වැඩිවීම හා සසඳන විට 1994 දි රෙදිපිළි හා ඇහළුම් ඉපැයීම්වල වර්ධනය අඩු වූ අතර මෙය 1994 අග භාගයේදී ඇමෙරිකා එක්සත් ජනපදයට රෙදිපිළි අපනයන පංගු ලබාගැනීම පිළිබඳව පැවති අවිනිශ්චිතභාවය සහ ඇහළුම් අපනයන සංයුතියෙහි අඩු වටිනාකම්වලින් යුත් අයිතමයන්වල කොටස වැඩිවීම තුළින් ඇති වූ බලපෑම ආංශික වශයෙන් පිළිබිඹු කිරීමක් විය.

ඉහල මට්ටමක දේශිය එකතු කල වටිනාකමකින් යුක්ත වූ වෙනත් කාර්මික අපනයන 1994 දී විගැහි දශලක්ෂ 510 දක්වා (රුපියල් දශලක්ෂ 36,171) සියයට 21 කින් ඉහළ නැගුණි. මෙම කාණ්ඩයෙහි සැළකියයුතු වර්ධනයක් වාර්තා වූ භාණ්ඩ අතර ස්වර්ණාභරණ (සියයට 96), සම්, රබර්, කඩදාසි, දැව සහ පිහන් භාණ්ඩ (සියයට 33), ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 29) සහ යන්ත්‍ර සූත්‍ර, යාන්ත්‍රික සහ විද්‍යුත් උපකරණ (සියයට 19) විය. ඛනිජ තෙල් නිෂ්පාදිත සහ දියමන්ති අපනයන වටිනාකම් බොහෝදුරට 1993 මට්ටමේම පැවතුණි. ඛනිජමය අපනයන ඉපැයිම් 1993 දී විගැහි දශලක්ෂ 54 (රුපියල් දශලක්ෂ 3,653) සිට 1994 දී විගැහි දශලක්ෂ 60 (රුපියල් දශලක්ෂ 4,293) දක්වා සියයට 11 ක වැඩිවීමක් පෙන්විය. මෙය, බොහෝදුරට ,මැණික් අපනයන ඉපැයීම් 1993 විගැහි දශලක්ෂ 50 (රුපියල් දශලක්ෂ 3,402) සිට 1994 විගැහි දශලක්ෂ 55 (රුපියල් දශලක්ෂ 3,917) දක්වා සියයට 10 කින් වැඩිවීම නිසා සිදු විය. ඉල්මනයිට්, ලෝපස් සහ යකඩ පයිරයිට්ස් නිර්යාතයන් වැඩිවීම නිසා වෙනත් ඛනිජමය අපනයන වලින් ලත් ඉපැයීම් විගැහි දශලක්ෂ 4 (රුපියල් දශලක්ෂ 251) සිට විගැහි දශලක්ෂ 5 (රුපියල් දශලක්ෂ 375) දක්වා ඉහළ නැගුණි.

සියළුම ප්‍රධාන ආනයන කාණ්ඩයන්හී වැඩිවීම පිළිබිඹු කරමින් මුළු ආනයන වියදම 1993 විගැහි දශලක්ෂ 2,870 (රුපියල් දශලක්ෂ 193,550) සිට 1994 විගැහි දශලක්ෂ 3,328 (රුපියල් දශලක්ෂ 236,030) දක්වා සියයට 16 කින් වැඩිවිය.

ආර්ථිකයෙහි අධි ඉල්ලුම් පීඩනය පිළිබිඹු කරමින් පරිභෝජන භාණ්ඩ ආනයන වියදම 1993 විගැහි දශලක්ෂ 555 (රුපියල් දශලක්ෂ 37,372) සිට 1994 විගැහි දශලක්ෂ 650 (රුපියල් දශලක්ෂ 45,983) දක්වා සියයට 17 කින් තියුණු ලෙස වැඩිවිය. පරිභෝජන භාණ්ඩ වැඩිවීමට ප්‍රධාන වශයෙන් දයක වූ සාධකය වූයේ සියයට 21 ක වර්ධනයක් පෙන්වූ කල්පවත්නා පරිභෝජන භාණ්ඩ සඳහා වූ වියදමයි. කල්පවත්නා පරිභෝජන භාණ්ඩ කාණ්ඩයෙහි ඉහළ වර්ධන අනුපාතිකයන් මෝටර් රථ සහ සයිකල් (සියයට 79) සහ ගුවන් විදුලි සහ රූපවාහිනී යන්ත්‍ර (සියයට 10) යන අයිතමයන්හි වාර්තා විය. ආහාර සහ පාන වර්ග ආනයන වියදම ද සියයට 13 කින් වැඩි විය.

ආර්ථික කටයුතුවල වර්ධනය හේතුවෙන් අතරමැදි භාණ්ඩ ආනයන වියදම 1994 විගැහි දශලක්ෂ 1,694 ( රුපියල් දශලක්ෂ 119,970) දක්වා සියයට 10 කින් ඉහළ නැගුණි. රෙදිපිළි හා ඇහළුම් 1993 විගැහි දශලක්ෂ 617 (රුපියල් දශලක්ෂ 41,740) සිට 1994 විගැහි දශලක්ෂ 724 ( රුපියල් දශලක්ෂ 51,299) දක්වා සියයට 17 කින්ද, පොහොර විගැහි දශලක්ෂ 46 (රුපියල් දශලක්ෂ 3,108) සිට විගැහි දශලක්ෂ 56 (රුපියල් දශලක්ෂ 3,885) දක්වා සියයට 21 කින්ද වැඩි වෙමින් ප්‍රධාන වර්ධනයන් වාර්තා කළ අංශයන් විය. ඩයි වර්ග, පදම් කිරීමේ හා වර්න ද්‍රව්‍ය වැනි වෙනත් කාර්මික අමුද්‍රව්‍ය (සියයට 7), වෙනත් අතරමැදි භාණ්ඩ (සියයට 12) සහ කඩදසි හා සන කඩදසි (සියයට 13) ද වැඩිවීම් වාර්තා කළේය. මෙම වැඩිවීම්වල බලපෑම, තිරිඟු ඇට සහ ඛනිජ තෙල් ආනයන වියදම, පිළිවෙලින් සියයට 12 ක සහ සියයට 7 කින් පහත වැටීම තුලින් තරමක් දුරට සමනය විය. තිරිඟු ඇට ආනයන වියදමෙහි අඩුවීම, ආනයන පරිමාවෙහි සියයට 7 ක වැඩිවීම තරමක් දුරට සමනය කරමින් ආනයන මිළ සියයට 18 කින් පහත වැටීම මගින් පිළිබිඹු විය. ඛනිජ තෙල් ආනයන වියදම අඩුවීමට විශාල වශයෙන් හේතු වූයේ බොර තෙල් වල සාමාන්‍ය ආනයන මිළ සියයට 10 කින් පහත වැටීමය.

ආයෝජන භාණ්ඩ ආනයන වියදම 1993 විගැහි දශලක්ෂ 750 (රුපියල් දශලක්ෂ 50,508) සිට 1994 විගැහි දශලක්ෂ 949 ( රුපියල් දශලක්ෂ 67,525) දක්වා සියයට 27 ක සැළකියුතු ප්‍රමාණයකින් වැඩි වූ අතර ඒ සඳහා විශාල වශයෙන් හේතු වූයේ විගැහි දශලක්ෂ 150 (රුපියල් දශලක්ෂ 11,260) ක වටිනාකමකින් යුත් ගුවන්යානා දෙකක් ආනයනය කිරීමය. මෙම විශේෂ අයිතමය ඉවත් කළ විට 1994 මුළු ආයෝජන භාණ්ඩ ආනයන සියයට 16 ක වැඩිවීමක් වාර්තා කළේය. ගුවන් යානා වල වටිනාකම ඉවත් කළවිට ප්‍රවාහන උපකරණ වටිනාකම සියයට 2 කින් වැඩිවිය. මේ අතර, තීරු බදු අඩුකිරීමෙන් ආනයන ඉහළ යාමට ඇති වූ බලපෑම තරමක් දුරට පිළිබිඹු කරමින් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයන වියදම 1993 විගැහි දශලක්ෂ 332 (රුපියල් දශලක්ෂ 22,377) සිට 1994 විගැහි දශලක්ෂ 390 (රුපියල් දශලක්ෂ 27,635) දක්වා සියයට 18 කින් වැඩි විය. දෙවසර තුළදී ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය විගැහි දශලක්ෂ 138 ( රුපියල් දශලක්ෂ 9,342) සිට විගැහි දශලක්ෂ 168 (රුපියල් දශලක්ෂ 11,898) දක්වා සියයට 21 කින් ඉහළ නැගුණි. මුළු ආයෝජන භාණ්ඩ වලින් සියයට 8 ක ප්‍රමාණයක් වූ වෙනත් ආයෝජන භාණ්ඩ 1994 දී විගැහි දශලක්ෂ 78 (රුපියල් දශලක්ෂ 5,566) දක්වා සියයට 40 කින් වැඩි විය.

සේවා ගිණුමෙහි ලැබීම් 1993 විගැහි දශලක්ෂ 535 සිට 1994 විගැහි දශලක්ෂ 627 දක්වා වැඩි වූ අතර ගෙවීම් විගැහි දශලක්ෂ 507 සිට විගැහි දශලක්ෂ 615 දක්වා ඉහළ නැගුණි. ගෙවීම් අඩු අනුපාතයකින් වැඩි වූ 1993 වර්ධනයන් හා සසඳන විට මෙය තියුණු ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් විය. මේ අනුව සේවා ගිණුමෙහි අතිරික්තය 1993 විගැහි දශලක්ෂ 28 (රුපියල් දශලක්ෂ 1,821) සිට 1994 විගැහි දශලක්ෂ 12 (රුපියල් දශලක්ෂ 820) දක්වා අඩුවිය. ලැබීම් අංශයෙහි විශේෂයෙන් වරාය, ප්‍රවාහන හා රක්ෂණය, සංචාරක සහ වෙනත් සේවා ඇතුලත් සියළුම ප්‍රධාන කාණ්ඩයන්හී වැඩිදියුණු වූ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කෙරිණි. 1994 වර්ෂයේදි සංචාරකයින් පැමිණීමේ ප්‍රමාණය 1982 පැවති වාර්තාගත මට්ටම ඉක්මවූ අතර, සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමෙහි වැඩිවීමක් සිදුවිය. ඒ අනුව 1993 වර්ෂයේදි වාර්තා වූ සියයට 5 ක සංචාරක ඉපැයීම්වල වර්ධනය හා සැසඳීමේදී 1994 වර්ෂයේදී සංචාරක ඉපැයීම් විගැහි දශලක්ෂ 161 දක්වා සියයට 10 කින් වැඩි විය. කෙසේ වුවද, ශ්‍රී ලංකිකයින්ගේ විදේශීය සංචාරය කිරීම්වල වැඩිවීමක් පිළිබිඹු කරමින් සංචාරක ගෙවීම් වලද සැලකිය යුතු වැඩිවීමක් වාර්තා විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සංචාරක කටයුතු වෙතින් වූ ශුද්ධ ලැබීම් විගැහි දශලක්ෂ 60 සිට විගැහි දශලක්ෂ 43 දක්වා පහත වැටින. ශ්‍රී ලංකා මහ බැංකුව සතු විදේශීය වත්කම් සඳහා වූ ආයෝජන ආදයම්

16 JUN 2009
LIBRARY & INFORMATION CENTRE
Communications Department



22777

ඉපැයීම්1993 විගැහි දශලක්‍ෂ 1,194 සිට 1994 විගැහි දශලක්‍ෂ 1,373 දක්වා වැඩිවීම පිළිබිඹු කරමින් ආයෝජන ආදායම් ගලාඒම් 1994 දී විගැහි දශලක්‍ෂ 100 දක්වා සියයට 27 කින් ඉහළ නැගුණි. විදේශීය විනිමය ගලායම් පිළිබඳව සැළකීමේදී පොළී ගෙවීම් විගැහි දශලක්ෂ 161 දක්වා විගැහි දශලක්‍ෂ 17 කින්ද, ලාභ හා ලාභාංශ ගෙවීම් විගැහි දශලක්‍ෂ 51 දක්වා විගැහි දශලක්‍ෂ 28 කින්ද වැඩිවිය. ඉහළ ආයෝජන ප්‍රතිලාභ අනුපාතිකය නිසා ලාභ හා ලාභාංශ වලින් විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළම රඳවා ගැනීමේ නැඹුරුවක් පිළිබිඹු වූ පසුගිය වසරට වඩා ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් මෙයින් පෙන්නුම් කෙරිණි.

සංක්‍රාම ගිණුමෙහි ශුද්ධ ලැබීම් විශේෂයෙන්ම පෞද්ගලික සංක්‍රාම තවදුරටත් රටෙහි ප්‍රධාන විදේශීය විනිමය මාර්ගයක් වශයෙන් පැවතුණි. භාණ්ඩ, සේවා හා සංක්‍රාමවල මුළු ඉපැයීම්වලින් සියයට 14 ක් පමණ වන පෞද්ගලික සංක්‍රාම 1993 වර්ෂයේදී විගැහි දශලක්‍ෂ 454 (රුපියල් දශලක්‍ෂ 30,592) සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්‍ෂ 499 (රුපියල් දශලක්ෂ 35,345) දක්වා වැඩි වූ අතර, මෙය විශේෂයෙන්ම මැද පෙරදිග සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විසින් එවන ලද සංක්‍රාම ද ඇතුලත් පෞද්ගලික සංක්‍රාමවල වැඩිවීම නිසා සිදුවිය. කෙසේ වුවද, පෞද්ගලික සංක්‍රාම ගලාඒම් වැඩිවීමේ අනුපාතිකය 1993 දී සියයට 17 සිට 1994 දී සියයට 10 දක්වා අඩුවිය. මෙම අඩුවීම, බොහෝදුරට 1994 වර්ෂයේදී දේශීය පොළී අනුපාත අඩුවීම සහ ප්‍රධාන ජාත්‍යන්තර වෙළෙඳපොළවල් වල පොළී අනුපාත වැඩිවීම නිසා පොළී අනුපාතිකයන්හි වෙනස්කම්වලට සංවේදීතාවයක් දක්වන සංක්‍රාමයන්හී මධ්‍යස්ථවීමක් නිසා සිදුවූවා විය හැක. මේ අතර, ශ්‍රී ලාංකික විගමනිකයන්ගේ වත්කම් පැවරීම සම්බන්ධව තිබූ සීමාවන් 1993 දි ලිහිල් කිරීමේ පූර්ණ ප්‍රතිඵල 1994 වර්ෂයේදි දක්නට ලැබුණු බැවින් පෞද්ගලික සංක්‍රාමවල ගලායෑම් 1993 වර්ෂයේදී විගැහි දශලක්‍ෂ 52 (රුපියල් දශලක්‍ෂ 3,501) සිට 1994 වර්ෂයේදි විගැහි දශලක්‍ෂ 61 (රුපියල් දශලක්‍ෂ 4,357) දක්වා වර්ධනය විය. නිල සංක්‍රාම 1993 වර්ෂයේදී පැවති විගැහි දශලක්‍ෂ 115 මට්ටමේම පැවතුණි. පෞද්ගලික හා නිල සංක්‍රාම යන දෙකෙහිම ප්‍රතිඵලයක් ලෙස සංක්‍රාම ගිණුමේ ශුද්ධ ගලාඒම් 1993 දී විගැහි දශලක්‍ෂ 517 (රුපියල් දශලක්‍ෂ 34,839) සිට 1994 දි විගැහි දශලක්‍ෂ 552 (රුපියල් දශලක්‍ෂ 39,057) දක්වා වැඩිවිය.

වෙළෙඳ ගිණුමෙහි පිරිහීම සහ සේවා සහ සංක්‍රාම ගිණුමෙහි අතිරික්තය අඩුවීම පිළිබිඹු කරමින් ජංගම ගිණුමෙහි හිඟය 1993 විගැහි දශලක්‍ෂ 281 (රුපියල් දශලක්‍ෂ 18,825) සිට 1994 විගැහි දශලක්‍ෂ 531 ( රුපියල් දශලක්‍ෂ 37,767) දක්වා පුළුල් විය. ද. දේ. නි. ප්‍රතිශතයක් ලෙස, හිඟය 1993 සහ 1994 අතර සියයට 3.8 සිට සියයට 6.5 දක්වා වැඩිවිය. නිල සංක්‍රාම රහිතව ගත්කළ මෙම අනුපාතිකය 1993 සියයට 5.3 සිට 1994 සියයට 7.9 දක්වා වැඩිවිය. ජංගම ගිණුමෙහි වසර දෙකක් තුළ අඛණ්ඩව පැවති යහපත් තත්ත්වයකින් පසුව ඇති වූ මෙම තියුණු පිරිහීම 1994 වර්ෂයේදි ගෙවුම් තුලනයෙහි අසතුටුදයක තත්ත්වයක් පෙන්නුම් කළ අතර, එය විශාල වශයෙන් 1994 ආර්ථිකය තුළ වර්ධනය වුණු අධි ඉල්ලුම් පීඩනය නිසා සිදු විය.

1993 දී ප්‍රාග්ධන ගිණුමෙහි ප්‍රාග්ධන ගලාඒම්වල සීඝ්‍ර වැඩිවීම හා සලකන විට, දේශීය දේශපාලන සහ ආර්ථික වාතාවරණයේ පැවති අස්ථාවර තත්ත්වය විශාල වශයෙන් පිළිබිඹු කරමින් 1994 ප්‍රාග්ධන ගලාඒම්වල සැලකිය යුතු මධ්‍යස්ථ වීමක් පැවතුණි. 1993 දි සියයට 61 ක වැඩිවීමක් වාර්තා කල මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 1994 දී විගැහි දශලක්‍ෂ 674 දක්වා සියයට 10 ක වැඩිවීමක් පමණක් පෙන්විය. සෘජු විදේශීය ආයෝජන හා කොටස් වෙළෙඳපොළ ආයෝජන වශයෙන් පෞද්ගලික අංශයට ලැබුණු ප්‍රාග්ධන ගලාඒම්වල හා රාජ්‍ය අංශය වෙත මුදහරින ලද ණයවල සැළකිය යුතු අඩුවීමක් විය.

ආයෝජන මණ්ඩලය යටතේ වාණිජමය වශයෙන් ක්‍රියාත්මකව පැවති නව ව්‍යවසායයන් 1993 වර්ෂයේ දී ඒකක 94 සිට 1994 වර්ෂයේ දී ඒකක 137 දක්වා වැඩිවුවද,1993 දී විගැහි දශලක්‍ෂ 134 ක් වූ සෘජු විදේශීය ආයෝජන 1994 තාවකාලික ඇස්තමේන්තුවලට අනුව විගැහි දශලක්‍ෂ 111 දක්වා අඩුවිය. කොටස් වෙළෙඳපල ආයෝජන සඳහා වූ විදේශීය ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් ද 1993 වර්ෂයේදී විගැහි දශලක්‍ෂ 48 සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්‍ෂ 20 දක්වා අඩුවිය. 1994 වර්ෂයේ මාර්තු, අප්‍රේල් මාසවල හා අවසාන කාර්තුවේදි කොළඹ කොටස් වෙළෙඳපොළෙහි අනේවාසිකයින් විසින් විකුණන ලද කොටස් ප්‍රමාණය ඔවුන් විසින් මිළදී ගත් කොටස් ප්‍රමාණයට වඩා වැඩි විය. කොටස් වෙළඳපල ආයෝජනයන්හී ඇති වූ මෙම සැළකිය යුතු අඩුවීම සංවර්ධිත රටවල ආයෝජන සඳහා පැවති වාතාවරණය වඩා යහපත් වීමත්, ජාතික

මැතිවරණ මධ්‍යයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම් කැපී පෙනෙන ලෙස ගිලිහී යාම නිසා ආයෝජකයින් සුපරීක්ෂාකාරී ආකල්පයක් දැරීමත් තුළින් පිළිබිඹු විය.

සහනදායි නොවන ණය සඳහා ඇති රුදියාවෙහි අඩුවීමක් පිළිබිඹු කරමින් වැඩි ප්‍රමාණයක් සහනදායි මූල්‍ය ආධාර වලින් සමන්විත රජයේ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් ද 1993 දී විගැහි දශලක්ෂ 190 ( රුපියල් දශලක්ෂ 12,579) සිට 1994 දී විගැහි දශලක්ෂ 146 (රුපියල් දශලක්ෂ 10,348) දක්වා සියයට 23 කින් අඩුවිය. රජයට ලැබුණු මුළු විදේශීය ප්‍රාග්ධන ගලාඒම් (දළ) 1993 දී විගැහි දශලක්ෂ 334 සිට 1994 දී විගැහි දශලක්ෂ 283 දක්වා අඩු වුවත්, ව්‍යාපෘති ණය මුදා හැරීම් විගැහි දශලක්ෂ 192 සිට විගැහි දශලක්ෂ 259 දක්වා වැඩි විය.

මෙම තත්ත්වයන්ට ප්‍රතිවිරුද්ධව දිගු හා කෙටිකාලින පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් තවදුරටත් සැළකිය යුතු ලෙස වැඩිවිය. 1994 දී පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධන ගලාඒම් විගැහි දශලක්ෂ 281 දක්වා විගැහි දශලක්ෂ 64 කින් වැඩි විය. එයාර් ලංකා අභ්‍යයානා ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල යටතේ සපයන ලද විදේශීය මූල්‍යනය කිරීම්, රාජ්‍ය අනුග්‍රහය යටතේ බස් ගෙන්වීම සඳහා ලබාගත් ණය සහ ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති සඳහා ණය ප්‍රාග්ධනය වශයෙන් වූ ප්‍රධාන විදේශීය විනිමය ගලාඒම් මෙහි අඩංගු විය. පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධන ගලායාම් 1993 විගැහි දශලක්ෂ 83 සිට 1994 විගැහි දශලක්ෂ 65 දක්වා අඩුවිය.

### 1.3 සංඛ්‍යා සටහන
## ගෙවුම් තුලන සාරාංශය 1991 - 1994

රුපියල් දශලක්ෂ (වරහන් තුල විගැහි දශලක්ෂ)

| ශීර්ෂය | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩ (ශුද්ධ) | -41,252 | -45,785 | -55,486 | -77,644 |
| | (-726) | (-740) | (-825) | (1,095) |
| සාධක නොවන සේවා (ශුද්ධ) | 3,594 | 6,391 | 7,800 | 8,848 |
| | (65) | (104) | (116) | (125) |
| සාධක සේවා | -7,367 | -7,821 | -5,979 | -8,028 |
| | (-130) | (-127) | (-85) | (-113) |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 16,623 | 20,253 | 27,090 | 30,989 |
| | (293) | (328) | (402) | (438) |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 8,407 | 8,027 | 7,749 | 8,069 |
| | (148) | (130) | (115) | (115) |
| ජංගම ගිණුමේ ශේෂය | -19,995 | -18,935 | -18,825 | -37,767 |
| | (-352) | (-306) | (-281) | (-531) |
| සමස්ත ශේෂය | 10,140 | 9,469 | 24,149 | 17,166 |
| | (152) | (133) | (375) | (173) |
| **ප්‍රධාන දර්ශක සමහරක්** | | | | |
| වෙළෙඳ අනුපාතය (1985 = 100) | 85.7 | 89.1 | 90.9 | 86.6 |
| ශුද්ධ බනිජතෙල් ආනයන | 9,598 | 11,167 | 11,119 | 10,682 |
| | (170) | (180) | (165) | (151) |
| ජංගම ගිණුමේ හිඟය ද.දේ.නි.යේ. ප්‍රතිශතයක් වශයෙන් | -5.4 | -4.5 | -3.8 | -6.5 |
| දළ ජාත්‍යන්තර සංචිත | 49,223 | 66,236 | 105,258 | 130,340 |
| | (809) | (1,047) | (1,544) | (1,792) |
| ජාත්‍යන්තර සංචිතවලින් කළ හැකි ආනයන මාස ගණන | 4.4 | 5.1 | 6.5 | 6.5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

පෞද්ගලික කෙටිකාලීන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 1993 දී විගැහි දශලක්ෂ 105 සිට 1994 දී විගැහි දශලක්ෂ 182 දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවිය. 1994 වර්ෂයේ කෙටිකාලීන ප්‍රාග්ධන ගලාඒම්, විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්ට අමුද්‍රව්‍ය ආනයනයන් මූල්‍යනය කිරීම සඳහා දුන් ණය ද ඇතුලත්ව, වෙළෙඳ ණය සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ලබාදුන් ණය වලින් සමන්විත විය.

## විදේශීය වත්කම්

වර්ෂය තුළදී මධ්‍යස්ථ වර්ධනයක් පෙන්වූ විදේශීය ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින පුළුල් කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබුණු විගැහි දශලක්ෂ 48 ක ශුද්ධ ලැබීමක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම් 1993 වර්ෂාවසානයේදී විගැහි දශලක්ෂ 1,544 (රුපියල් දශලක්ෂ 105,258) සිට 1994 වර්ෂාවසානයේදී විගැහි දශලක්ෂ 1,792 (රුපියල් දශලක්ෂ 130,340) දක්වා සියයට 16 ක වැඩිවීමක් වාර්තා කළේය. ශ්‍රී ලංකා මහ බැංකුව හා රජය සතු විදේශීය වත්කම් වලින් සමන්විත දළ නිල සංචිත වර්ෂ දෙක අතර විගැහි දශලක්ෂ 1,389 දක්වා විගැහි දශලක්ෂ 172 කින් වැඩිවිය. 1994 වර්ෂාවසානයේදි පැවති දළ විදේශීය වත්කම් 1995 සඳහා තක්සේරු කරන ලද මාස 5.9 ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වූ අතර, දළ නිල සංචිත ප්‍රමාණය මාස 4.6 ක තක්සේරුගත ආනයන වලට සමාන විය.

## විනිමය අනුපාතික සංචලනයන්

ශ්‍රී ලංකා රුපියලෙහි විදේශීය අගය, 1994 වර්ෂය පුරාම ජපන් යෙන් වලට සාපේක්ෂව අවප්‍රමාණයක් පෙන්නුම් කළ අතර අනිකුත් ප්‍රධාන ජාත්‍යන්තර මුදල් වර්ගවලට ප්‍රතිමුඛව උච්චාවචනය විය. ජාත්‍යන්තර විදේශීය විනිමය හා මූල්‍ය වෙළෙඳපොලෙහි පැවති අස්ථාවර තත්ත්වයන් නිසා ප්‍රධාන විදේශීය ව්‍යවහාර මුදල් අතර විනිමය අනුපාතයන්හි උච්චාවචනය වීම මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශීය විනිමය වෙළෙඳපොළෙහි පැවති තත්ත්වයන්ද රුපියලෙහි සංචලනයන් තුලින් පිළිබිඹු විය. 1993 වර්ෂය අග පැවති විනිමය අනුපාත හා සසඳන විට 1994 දී ජපන් යෙන්, ජර්මන් මාර්ක්, ප්‍රංශ ප්‍රැන්ක් සහ බ්‍රිතාන්‍ය පවුම්වලට ප්‍රතිමුඛව එ. ජ. ඩොලරය තියුණු ලෙස අවප්‍රමාණය විය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශීය විනිමය වෙළෙඳපලේ මැදිහත්වීම සඳහා භාවිතා කරන එ. ජ. ඩොලරයට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියල 1993 වර්ෂාවසානයේ පැවති විනිමය අනුපාතය හා සසඳන විට 1994 වර්ෂාවසානයේදි සියයට 0.8 කින් අවප්‍රමාණය විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා රුපියල, ජාත්‍යන්තර වෙළෙඳපලෙහි සාපෙක්ෂ වශයෙන් ශක්තිමත් මුදල් වර්ග වන ජපන් යෙන්, ජර්මන් මාර්ක්, ප්‍රංශ ප්‍රැනක් හා බ්‍රිතාන්‍ය පවුම්වලට ප්‍රතිමුඛව පිළිවෙලින් සියයට 11.4, 10.7,9.1 සහ 5.8 ක් වැනි ඉහළ අනුපාතයන්ගෙන් අවප්‍රමාණය විය. එය ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව ද සියයට 1 කින් අවප්‍රමාණය විය. ප්‍රධාන මුදල් වර්ගවලට ප්‍රතිමුඛව ඇති වූ වෙනස්කම්වල ප්‍රතිඵලය වූයේ, ශ්‍රී ලංකා රුපියල විගැහි වලට ප්‍රතිමුඛව 1993 දී සියයට 7.1 ක අවප්‍රමාණය හා සැසීමේදී 1994 දී සියයට 6.3 කින් අවප්‍රමාණය වීමය.

ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන්ට සාපේක්ෂව වෙළෙඳාම මත බර තබන ලද නාමික විනිමය අනුපාතය ලෙස නිර්වචනය කරන ලද ලංකාවේ නාමික සඵල විනිමය අනුපාතිකය ලක්ෂිත පදනම අනුව බලන විට, 1993 දෙසැම්බර් සිට 1994 දෙසැම්බර් දක්වා සියයට 5.1 කින් අවප්‍රමාණය විය. වර්ෂය තුළදී එම පදනම මතම, ශ්‍රී ලංකාව හා එහි ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් අතර උද්ධමන අනුපාත අතර වෙනස්කම් සඳහා නාමික විනිමය අනුපාත ගැලපීමෙන් ලබා ගන්නා මූර්ත සඵල විනිමය අනුපාතිකය සියයට 3.2 කින් අවප්‍රමාණයවිය.

## විදේශීය ණය

1993 වර්ෂාවසානයේ සිට 1994 වර්ෂාවසානය දක්වා විගැහි දශලක්ෂ 504 ක වැඩිවීමක් වාර්තා කරමින් 1994 වර්ෂය අවසාන වනවිට ශ්‍රී ලංකාවේ විදේශිය ණය ප්‍රමාණය විගැහි දශලක්ෂ 6,089 ක් ලෙස තක්සේරු කර ඇත. මෙම වැඩිවීම, 1994 වර්ෂය තුළදී පෞද්ගලික අංශයට දුන්

දිගු හා කෙටිකාලීන ණයවල වැඩිවීම තුළින් විශාල වශයෙන් පිළිබිඹු විය. 1994 වර්ෂාවසානයේදී නොගෙවා ඉතිරිව ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 69 ක් පමණ වූ රජයේ මැදි හා දිගුකාලීන ණය විගැහි දශලක්ෂ 69 ක වැඩිවීමක් වාර්තා කළ අතර, මෙය විශේෂයෙන්ම ජපානය, ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය මගින් ප්‍රදානය කරන ලද සහනදායී ආධාර වලින් සමන්විත විය. පුළුල් කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම්වල තෙවන වසර වැඩපිළිවෙලෙහි ප්‍රථම අදියර යටතේ ශ්‍රී ලංකාවට 1994 දී විගැහි දශලක්ෂ 56 ක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබුණි. ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ කලින් ලබාගත් ණය සඳහා කල විගැහි දශලක්ෂ 9 ක ආපසු ගෙවීමක් සමග 1994 වර්ෂාවසානයේදී ජ. මූ. ව නොගෙවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය විගැහි දශලක්ෂ 423 දක්වා විගැහි දශලක්ෂ 47 කින් වැඩිවිය.

## ණය සේවා ගෙවීම්

මැදි හා දිගුකාලීන ණය ආපසු ගෙවීම් හා සියළුම විදේශීය ණය වෙනුවෙන් කරන ලද පොළී ගෙවීම් අඩංගු ණය සේවා ගෙවීම් 1994 දී විගැහි දශලක්ෂ 372 දක්වා සියයට 4 කින් වැඩිවුණි. කෙසේ වුවද, 1994 දී භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම් වැඩිවීම නිසා දෙවසර තුළදී ණය සේවා අනුපාතිකය සියයට 13.8 සිට සියයට 13 දක්වා අඩුවිය. භාණ්ඩ හා සේවා අපනයන සහ පෞද්ගලික සංක්‍රාමවල ඉපැයීම්හි ප්‍රතිශතයක් වශයෙන් ණය සේවා අනුපාතිකය 1993 දී සියයට 11.8 සිට 1994 දී සියයට 11.1 දක්වා අඩු විය.

## රාජ්‍ය මූල්‍ය

1994 වසර ජාතික මැතිවරණ වසරක් බවට පත්වීමත් සමගම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන්හී ලිහිල් වීමක් දක්නට ලැබිණි. රාජ්‍ය මූල්‍ය කටයුතු ශක්තිමත් කිරීම මගින් දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 1.1 ක අතිරික්තයක් ජංගම ගිණුමේ ඇතිකර ගැනුමට සහ සමස්ත අයවැය හිඟය දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 6.8 කට සීමාකර ගැනීමට සහතික වී සිටි නමුදු රජයේ ආදායම් නංවාලීමේ උත්සාහයන් දුර්වලවීමත්, රජයේ වියදම් ප්‍රතිපත්ති ලිහිල් වීමත් හේතුවෙන් ජංගම ගිණුමේ හිඟය දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 2.9 ක් දක්වා සැළකිය යුතු ලෙස වැඩි වූ අතර අයවැය හිඟයද දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 10 ක් විය. මෙම තත්ත්වය යටතේ දේශීය ණය අවශ්‍යතාවයන් ද ඉතා ඉහළ මට්ටමකට නැංවිත.

මීට කලින් වසරේදී සියයට 15 ක වර්ධනයක් පෙන්නුම් කළ රාජ්‍ය ආදායම 1994 වසරේදී සියයට 12 ක වර්ධනයක් දක්වමින් රුපියල් දශලක්ෂ 110,038 ක් විය. ඒ අනුව, රාජ්‍ය ආදායම/ දළ දේශිය නිස්පාදිතය අනුපාතය 1993 වසරේ දී සියයට 19.7 සිට 1994 වසරේ දී සියයට 19.0 දක්වා පහත වැටුණි. 1994 දී රුපියල් දශලක්ෂ 99,417 ක් වූ මුළු බදු ආදායම රාජ්‍ය ආදායමෙන් සියයට 90 ක් විය. බදු ආදායම් ව්‍යුහය තුළ භාණ්ඩ හා සේවා මත වූ බදු දරණ වැදගත්කම තවදුරටත් ශක්තිමත් කරමින් එකී ආදායම් රුපියල් දශලක්ෂ 47,963 (සියයට 56) සිට රුපියල් දශලක්ෂ 56,685 (සියයට 57) දක්වා 1994 තුළදී වර්ධනය විය. මෙකී වර්ධනය තහවුරු කරමින් ආරක්ෂක බදු හා නිෂ්පාදන බදු මගින් එකතු වූ ආදායමෙහි ද වැඩිවීමක් දක්නට ලැබුණි. රුපියල් දශලක්ෂ 22,598 ක් වූ ආනයන බදු සියයට 9 ක වර්ධනයක් වාර්තා කළ අතර 1994 වසරේ බදු ආදායමෙන් සියයට 23 කට දයක විය. මේ අතර, සියයට 40 පැවති උපරිම ආදායම් බදු අනුපාතය 1994 අප්‍රේල් මාසයේදී සියයට 35 දක්වා අඩු කළද, 1993 දී රුපියල් දශලක්ෂ 12,543 වූ ආදායම් බදු වලින් ලත් ආදායම සංවේදී වර්ධනයක් පෙන්වමින් 1994 දී රුපියල් දශලක්ෂ 15,277 දක්වා වැඩිවිය.

රුපියල් දශලක්ෂ 10,621 ක් වූ බදු නොවන ආදායම, පෙර වසරට වඩා සියයට 15 ක අඩුවීමකි. පොළී ආදායම, බදු නොවන ආදායම් වලින් සියයට 43 ට දයක වූ අතර ශ්‍රී ලංකා මහ බැංකු ලාභ පැවරීම්, මූල්‍ය පනත යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතන රජය වෙත පැවරිය යුතු ලාභාංශ ද ඇතුලත් වූ ලාභ හා ලාභාංශ සහ ගාස්තු හා අයකිරීම්, බදු නොවන ආදායමේ තවත් සියයට 37 ට 1994 දී දායක විය.

1.4 සංඛ්‍යා සටහන

## රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

රුපියල් දශලක්‍ෂ

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 තාවකාලික |
|---|---|---|---|---|---|
| මුළු ආදයම් | 67,964 | 76,179 | 85.781 | 98,339 | 110,038 |
| බදු ආදයම් | 61,206 | 68,157 | 76,353 | 85,891 | 99,417 |
| බදු නොවන ආදයම් | 6,758 | 8,022 | 9,428 | 12,448 | 10,621 |
| මුළු වියදම සහ ශුද්ධ ණයදීම් | 99,814 | 119,527 | 116,973 | 140,460 | 167.768 |
| වර්තන | 71,771 | 83,756 | 89,639 | 102,288 | 127,084 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණයදීම් | 28,043 | 35,771 | 27,334 | 38,172 | 40,684 |
| ජංගම ගිණුම් අතිරික්තය / හිඟය (-) | -3,807 | -7,577 | -3,858 | -3,949 | -17,046 |
| හිඟය (දීමනාවලට පෙර) | -31,850 | -43,348 | -31,192 | -42,121 | -57,730 |
| මූල්‍යනය | 31,850 | 43,348 | 31,192 | 42,121 | 57,730 |
| විදේශ ප්‍රධාන | 6,697 | 7,870 | 8,280 | 8,025 | 8,257 |
| විදේශ ණය ගැනීම් | 11,645 | 19,329 | 7,361 | 9,855 | 11,778 |
| දේශීය ණය ගැනීම් | 13,508 | 16.149 | 15,551 | 24,241 | 37,696 |
| බැංකු නොවන | 13,251 | 16,114 | 17,873 | 30,320 | 36,539 |
| බැංකු | 257 | 35 | -2,322 | -6,079 | 1,157 |
| **දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්** | | | | | |
| මුළු ආදායම | 21.1 | 20.4 | 20.2 | 19.7 | 19.0 |
| බදු ආදායම් | 19.0 | 18.3 | 17.9 | 17.2 | 17.2 |
| බදු නොවන ආදයම් | 2.1 | 2.2 | 2.2 | 2.5 | 1.8 |
| මුළු වියදම් හා ශුද්ධ ණයදීම් | 31.0 | 32.1 | 27.5 | 28.1 | 29.0 |
| වර්තන | 22.3 | 22.5 | 21.1 | 20.5 | 22.0 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණයදීම් | 8.7 | 9.6 | 6.4 | 7.6 | 7.0 |
| වර්තන ගිණුම් අතිරික්තය / හිඟය (-) | -1.2 | -2.0 | -0.9 | -0.8 | -2.9 |
| හිඟය (ප්‍රදානයන්ට පෙර) | -9.9 | -11.6 | -7.3 | -8.4 | -10.0 |
| මූල්‍යනය | 9.9 | -11.6 | -7.3 | -8.4 | -10.0 |
| විදේශ ප්‍රදාන | 2.1 | 2.1 | 1.9 | 1.6 | 1.4 |
| විදේශ ණය ගැනීම් | 3.6 | 5.2 | 1.7 | 2.0 | 2.0 |
| දේශීය ණය ගැනීම් | 4.2 | 4.3 | 3.7 | 4.9 | 6.5 |
| බැංකු නොවන | 4.1 | 4.3 | 4.2 | 6.1 | 6.3 |
| බැංකු | 0.1 | ... | -0.5 | -1.2 | 0.2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

රුපියල් දශලක්ෂ 167,768 ක් වූ (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 29) රජයේ මුළු වියදම, පෙර වසරේ රුපියල් දශලක්ෂ 1,40,460 (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 28.1) වඩා සියයට 19 ක වැඩිවීමක් වාර්තා කළේය. 1994 දී රුපියල් දශලක්ෂ 1,27,084 ක් වූ වර්තන වියදම, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 22 කි. මෙය පෙර වසරේදී සියයට 20.5 ක පැවතියේය. මේ අතර, රුපියල් දශලක්ෂ 40,455 ක්ව පැවති රාජ්‍ය ආයෝජනය, දළ දේශීය නිෂපාදිතයට සාපේක්ෂව ගත්කළ 1993 වූ සියයට 8 ක සිට 1994 දි සියයට 7 දක්වා පහත වැටිණි.

පෙර වසරේ සියයට 14 ක වර්ධනය හා සසඳන කල 1994 දී රුපියල් දශලක්ෂ 127,084 ක් වූ වර්තන වියදම සියයට 24 ක තියුණු වර්ධනයක් පෙන්නුම් කර ඇත. ආරක්ෂක වියදම් හි වූ වැඩිවීමත්, සාමාන්‍ය පරිපාලන වියදම් හි පුළුල් වීමත් හේතුවෙන් වැටුප්, ගමන් වියදම්, සැපයුම් හා අවශ්‍යතා වැනි දෑ වලට වූ රුපියල් දශලක්ෂ 54,700 ක වියදම සියයට 22 ක වැඩිවීමක් වාර්තා කළ අතර සංසන්දනාත්මකව පෙර වසරේ මෙකී වියදම් වර්ධනය වූයේ සියයට 13 කිනි. සෑම වසරකම ඉහළ මට්ටමක ණය ගැනීම්වලට පාදක වූ දිගින් දිගටම පැවති අයවැය හිඟයන්හි අධික පිරිවැය පෙන්වාලමින්, 1994 දි රුපියල් දශලක්ෂ 38,031 ක් වූ රාජ්‍ය ණය මත පොලී ගෙවීම්, සියයට 26 ක වැඩිවීමක් වාර්තා කළේය. විශ්‍රාම වැටුප් ගෙවීම් සහ වසර තුලදී විවිධ සුභසාධක වැඩසටහන් හි පුළුල් කිරීමෙන් ඇති වූ වියදමෙහි බලපෑම් යටතේ ද විශේෂයෙන්ම, 1994 මැයි මාසයේ ප්‍රකාශයට පත් කළ සහන පියවර වලින් පසුව කුටුම්භවලට කරන ලද පැවරුම් වියදම (විශ්‍රාම වැටුප් හා සුභසාධන වැඩසටහන්වල වියදමද ඇතුලත්ව) රුපියල් දශලක්ෂ 28,263 ක්ව සියයට 27 ක වර්ධනයක් සනිටුහන් කරනු ලැබිණ.

ආදායම් නැංවීමේ උත්සාහය දුර්වලවූත්, විශාල වර්තන වියදමක් සහිතවූත් තත්ත්වයක් තුළ අයවැයෙහි ජංගම ගිණුම රුපියල් දශලක්ෂ 17,046 ක පෙර නොවූ විශාල හිඟයක් ජනිත කරන ලදි. මෙය, මෙවැනි අසමතුලිතතා අඩු කිරීමේ මෑතක පැවැති ප්‍රවනතාවය තදබල ලෙස ආපසු හැරවීමකි. මේ අනුව රාජ්‍ය මූල්‍ය කටයුතුවල පරිභෝජන වියදම් කෙරෙහි වූ දැඩි නැම්යාව පෙන්නුම් කරමින් 1991 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.0 ක් තිබී 1993 දී සියයට 0.8 දක්වා පහත වැටුන ජංගම ගිණුමේ හිඟය 1994 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.9 දක්වා ඉහළ නැගුණි.

1994 දී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණයදීම් රුපියල් දශලක්ෂ 40,684 ක් විය. මෙය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.1 කි. පෙර වසරේදී රුපියල් දශලක්ෂ 38,172 ක් වූ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණයදීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.6 කි. 1994 වසරේ රාජ්‍ය ආයෝජන රුපියල් දශලක්ෂ 40,455 ක් (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.0) විය. මෙය 1993 වසරේදි රුපියල් දශලක්ෂ 39,927 (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.0) කි. 1989 වසරේදී රාජ්‍ය ආයෝජන/ දළ දේශීය නිෂ්පාදිත අනුපාතය සියයට 10.5 ක්ව පැවත 1994 දී එය සියයට 7 දක්වා නොකඩවා පහත වැටීම මගින් අඩු මට්ටමක පැවතින. රාජ්‍ය ආයෝජන මෑත අවුරුදුවල රාජ්‍ය මූල්‍ය වර්ධනයන්හි අහිතකර ලක්ෂණයක් බව පෙන්නුම් කරයි. යටිතල පහසුකම් සඳහා වූ දැඩි අවශ්‍යතාවය මධ්‍යයේ සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයෝජනවලට සැළකියුතු ආධාර ලැබෙන තත්ත්වයක් යටතේ රාජ්‍ය ආයෝජන යහපත් මට්ටමක පවත්වා ගැනිම අතිවාර්ය අවශ්‍යතාවයකි.

ආදායම් සහ වියදම් ප්‍රවාහයන් රුපියල් දශලක්ෂ 57,730 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10 ක හිඟයක් ජනිත කරන ලදී. මෙය 1993 වසරේදී රුපියල් දශලක්ෂ 42,121 ක හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.4 ක හිඟයකි. පෙර වසරේ රුපියල් දශලක්ෂ 34,096 ක් වූ අයවැය හිඟය, සියයට 45 කින් වැඩි වී, 1994 දී රුපියල් දශලක්ෂ 49,473 ක් (ප්‍රදානයන්ට පසුව) විය. විදේශීය මූලාශ්‍ර වලින් ශුද්ධ ණය ගැනීම් 1994 දී රුපියල් දශලක්ෂ 11,778 ක් වූ අතර, 1993 දී රුපියල් දශලක්ෂ 9,855 ක් විය. විදේශ ණය ගැනීම් දළ දේශීය නිෂ්පාදිතයනට සාපේක්ෂව පෙර වසරේදී මෙන්ම සියයට 2.0 කි. විශේෂිත වශයෙන් ජංගම ගිණුමේත් පොදු වශයෙන් මුළු අයවැය කටයුතු වලත් පැවති විශාල සම්පත් ඌණතාවය විදහා දක්වමින් රුපියල් දශලක්ෂ 37,696 ක පැවති දේශීය ණය ගැනිම්, 1994 දී සියයට 56 ක නැගීමක් පෙන්නුම් කළේය. ඒ අනුව, අයවැය මත පැටවුණ ණය බර තවත් වැඩි කරමින්, 1993 දී දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 4.9 ක්ව පැවති දේශීය මූල්‍යකරණය 1994 දී සියයට 6.5 දක්වා වැඩිවිය.

1994 වසරේ රාජ්‍ය මූල්‍ය කටයුතුවල පැවති විශාල සම්පත් ඌනතා තත්ත්වය තුල රජයට අයවැය හිඟය මූල්‍යකරණය කිරීම පිණිස බැංකු ක්‍රමය වෙත යොමුවීමට සිදු විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ රජයේ ගිණුම්වල රජයේ මුදල් ශේෂ රුපියල් දශලක්ෂ 1,011 කින් වැඩි වී තිබුණද, රුපියල් දශලක්ෂ 1,864 ක ප්‍රමාණයකට රජය විසින් ශ්‍රී ලංකා මහ බැංකු තාවකාලික අත්තිකාරම් ප්‍රයෝජනයට ගැනීම, තවදුරටත් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් රුපියල් දශලක්ෂ 1,145 ක් භාණ්ඩාගාර බිල්පත් මගින් ණයට ගැනීම හා අනෙකුත් ගණුදෙනුවල ප්‍රතිඵලය වූයේ 1994 වසරේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ගත් ශුද්ධ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,157 ක් වීමය. මෙය, ආර්ථිකයේ සංචිත මුදල්වල (අධි බලැති මුදල්) ප්‍රසාරණයකට දයක විය. කෙසේ වෙතත්, වාණිජ බැංකුවලින් රජයේ ණය ගැනිම් රුපියල් දශලක්ෂ 2, 381 කින් වර්ධනය වී තිබියදීත් රජයේ තැන්පතු ශේෂය 1994 දී රුපියල් දශලක්ෂ 2,986 කින් ගොඩ නැඟීමේ හේතුවෙන් වාණිජ බැංකුවලින් රජය ලත් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 605 කින් අඩුවිය.

1994 වර්ෂාවසානයේදි රුපියල් දශලක්ෂ 5,49,292 ක් වූ නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය, වසර තුළදී සියයට 14 ක වැඩිවීමක් පෙන්වනු ලැබීය. 1993 වසරේ සියයට 97 ක් වූ මුළු ණය දළ දේශිය නිෂ්පාදිතය අනුපාතය 1994 දි සියයට 95 ක් විය. මුළු දේශීය ණය ප්‍රමාණය, රාජ්‍ය ණය වලින් සියයට 45 ක් වූ අතර 1993 දී රුපියල් දශලක්ෂ 213,685 ක් වූ දේශිය ණය ප්‍රමාණය සියයට 17 කින් ඉහළ නැඟී 1994 වර්ෂාවසානයේදී රුපියල් දශලක්ෂ 2,49,118 ක් විය. මේ අතර, විදේශිය ණය ප්‍රමාණය සියයට 11 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 2,70,224 සිට රුපියල් දශලක්ෂ 3,00,174 බවට පත්විය. මැදි හා දිගුකාලීන දේශීය ණය, රුපියල් දශලක්ෂ 28,552 කින් ඉහළ නැඟ 1994 වර්ෂාවසානයේදි රුපියල් දශලක්ෂ 1,40,392 ක් වූ අතර කෙටිකාලීන ණය රුපියල් දශලක්ෂ 6,881 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 1,08,726 ක් බවට පත් වූයේ, රාජ්‍ය ණයවල මැදි හා දිගුකාලීන ණය වෙත කෙරුණු ව්‍යුහාත්මක විතැන්වීමක් පෙන්නුම් කරමිනි. එහි ප්‍රතිඵලයක් ලෙස මුළු දේශීය ණය ප්‍රමාණයෙහි මැදි හා දිගු කාලීන ණය ප්‍රමාණය 1993 වූ සියයට 52 සිට 1994 දි සියයට 56 දක්වා වැඩිවිය. ද.දේ. නි.ට සාපේක්ෂව මුළු දේශිය ණය සියයට 43 ක්ව පෙර වසරේ මට්ටමේම පැවතුනි.

රුපියල් දශලක්ෂ 22,671 ක් වූ ණය ආපසු ගෙවීම් වලින්ද, රුපියල් දශලක්ෂ 38,031 ක් වූ පොළී ගෙවීම් වලින්ද සමන්විත වූ රජයේ ණය සේවා වියදම ඉකුත් වසරට වඩා සියයට 6 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 60,702 ක් විය. ණය සේවා වියදම ද. දේ. නි. යෙන් අනුපාතයක් සේ 1993 දී සියයට 11.5 සිට 1994 දී සියයට 10.5 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. මෙයට ප්‍රධාන හේතුව පරිනත වන රුපියල් ණය ප්‍රමණය අඩුවීමයි. රුපියල් දශලක්ෂ 7, 606 ක් වූ විදේශීය ණය ආපසු ගෙවීම් 1993 ට වඩා සියයට 9 වැඩිවීමක් වාර්තා කරන ලදි.

## මුදල් සැපයුම

ආර්ථිකය තුළ අඛණ්ඩ අධි ඉල්ලුම් පීඩනයක් සනිටුහන් කරමින් 1994 වර්ෂය තුළ දී මුදල් සැපයුමෙහි වර්ධන වේගය නොකඩවා ඉහල මට්ටමක පැවතුණි. පටු මුදල් සැපයුම ($M_1$) වර්ෂය අවසාන වන විට සියයට 19 ක වාර්ෂික වර්ධනයක් වාර්තා කරමින්, 1993 වර්ෂයේ පැවති වර්ධන මට්ටමෙහිම පැවති අතර පුළුල් මුදල් සැපයුමෙහි ($M_2$) වර්ධන වේගය පසුගිය වර්ෂයෙහි පැවති සියයට 23.5 ක මට්ටමෙහි සිට 1994 වර්ෂයේ දී සියයට 19.6 දක්වා තරමක් පහළ ගියේය. 1994 ජනවාරි සිට මැයි දක්වා කාලය තුළදී මුදල් සැපයුමේ වර්ධනයෙහි තරමක පහළ යාමක් පෙන්නුම් කළද සාමාන්‍ය වශයෙන් මූල්‍ය වර්ධනය වර්ෂය පුරාම අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතියේය.

1994 වර්ෂය තුළදී ඉහළ මට්ටමක පැවති මූල්‍ය ප්‍රසාරණයට මූලික හේතුව වූයේ දේශීය ණය නොකඩවා ඉහළ යාමයි. පෞද්ගලික අංශයට දුන් ණය සියයට 21 කින් හා රාජ්‍ය අංශයට දුන් ශුද්ධ ණය සියයට 4 කින් ප්‍රසාරණය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ණය, පසුගිය වර්ෂයෙහි සියයට 3.5ක වර්ධනය හා සසඳා බලන කල 1994 දී සියයට 14.7 කින් තියුණු ලෙස ඉහළ ගියේය. එහෙත් සමස්ත ගෙවුම් ශේෂයෙහි අඩු අතිරික්තයක් පිළබිඹු කරමින් ශුද්ධ විදේශිය වත්කම් 1993 වසරෙහි සියයට 87.9 ක තියුණු වර්ධනයට වෙනස්ව 1994 වසරෙහි මූල්‍ය ප්‍රසාරණය කෙරෙහි ඇති කරන බලපෑම අඩු කරමින් සියයට 37.7 ක අඩු වර්ධනයක් වාර්තා කළේය.

පසුගිය වසරෙහි සියයට 25.9 (රුපියල් දශලක්ෂ 11,609) ක ඉහළ වර්ධනය හා සසඳන කල මූල්‍ය පදනම 1994 දි සියයට 20.5 (රුපියල් දශලක්ෂ 11,588) කින් ඉහළ ගිය අතර, එය වසර අවසානය වන විට රුපියල් දශලක්ෂ 68,055 ක් විය. සංචිත මුදල් ප්‍රසාරණයට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ මහ බැංකුව වෙත ශුද්ධ විදේශ වත්කම් ඒකරාශී වීමයි. මෙම ශුද්ධ විදේශ වත්කම් 1994 දී රුපියල් දශලක්ෂ 14,288 කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම හා මහ බැංකු ප්‍රතිමූල්‍ය පහසුකම් ක්‍රමයෙන් පහළයෑම මගින් මහ බැංකුවෙහි ශුද්ධ දේශීය වත්කම් රුපියල් දශලක්ෂ 2,700 කින් අඩුවීම 1994 වසරෙහි සංචිත මුදල්හි වැඩිවීම රුපියල් දශලක්ෂ 11,588 මට්ටමක පවත්වා ගැනීමට උපකාරී විය. පසුගිය වසරෙහි සංචිත මුදල්හි ඉහළයාම රුපියල් දශලක්ෂ 11,609 ක් විය. මුදල් සැපයුමේ ($M_2$) වර්ධනයට සාපේක්ෂව සංචිත මුදල් හි වර්ධනයේ අධික ලෙස ඉහළයාම හේතුකොට ගෙන මුදල් සැපයුම සහ මූල්‍ය පදනම අතර අනුපාතිකය වන මූල්‍ය ගුණකය 1993 අග දී 2.86 ක සිට 1994 අග වන විට 2.84 දක්වා සුළු වශයෙන් පහළ ගියේය. මූල්‍ය ගුණකයේ මෙම පහත වැටීම සහ ව්‍යවහාර මුදල් තැන්පතු අතර අනුපාතිකය 1993 දී සියයට 24.8 සිට 1994 දී සියයට 25.2 දක්වා ඉහළ යාම මගින් පිළිබිඹු වනුයේ ගණුදෙනු චේතනාව මත මුදලට ඇති ඉල්ලුම කෙරෙහි දැඩි කැමැත්තයි.

### 1.5 සංඛ්‍යා සටහන

## මූල්‍ය කටයුතු පිළිබඳ සංඛ්‍යා 1989 - 1994

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1989 | 1990 | 1991 | 1992 | 1993 | 1994 |
|---|---|---|---|---|---|---|
| දේශීය ණයෙහි වෙනස | 5,454 | 17,543 | 14,362 | 19,121 | 5,362 | 23,336 |
| රජයට දෙනලද ශුද්ධ ණය වැඩිවීම | 54 | 3,078 | 2,595 | 558 | -7,346 | 1,393 |
| රාජ්‍ය සංස්ථාවලට දෙනලද ණය වැඩිවීම | 3,075 | 1,774 | -1,559 | 673 | -6,975 | -2,612 |
| සමුපකාර ආයතනවලට දෙන ණය වැඩිවීම | -140 | 418 | 161 | 264 | -118 | 638 |
| අනෙකුත් පුද්ගලික අංශයට දෙනලද ණය වැඩිවීම | 2,465 | 12,273 | 13.165 | 17,626 | 19,800 | 23,917 |
| බැංකු විදේශ වත්කම් ශුද්ධ වෙනස | -2,326 | 5,474 | 7,225 | 6,731 | 21,238 | 17.102 |
| මුළු වත්කම් වගකීම්හි වෙනස | 3,128 | 23,017 | 21,587 | 25,852 | 26,599 | 40,438 |
| පුළුල් මුදල් සැපයුම වැඩිවීම ($M_2$) | 8,487 | 14,584 | 21,080 | 18,604 | 30,661 | 31,628 |
| අනෙකුත් වගකීම් (ශුද්ධ) වැඩිවීම | -5,359 | 8,433 | 507 | 7,248 | -4,062 | 8,810 |
| **මූල්‍ය කටයුතුවල වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන්** | | | | | | |
| මුළු දේශීය ණය වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් | 5.6 | 17.1 | 12.0 | 14.2 | 3.5 | 14.7 |
| මුළු වත්කම් / වගකීම් වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් | 3.0 | 17.7 | 16.6 | 17.0 | 15.0 | 19.8 |
| මුළු දේශීය ණය වැඩිවීමෙහි රාජ්‍ය අංශයේ දයකත්වය ප්‍රතිශතයක් වශයෙන් | 1.0 | 17.5 | 18.1 | 2.9 | -137.0 | 6.0 |
| මුළු දේශීය ණය වැඩිවීමෙහි රාජ්‍ය නොවන අංශයේ දයකත්වය ප්‍රතිශතයක් වශයෙන් | 99.0 | 82.5 | 81.9 | 97.1 | 237.0 | 94.0 |
| ප්‍රතිශත වැඩිවීම | | | | | | |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 12.4 | 19.1 | 23.2 | 16.6 | 23.5 | 19.6 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 9.1 | 12.8 | 18.0 | 7.3 | 19.0 | 19.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

මහජනතාව විසින් දරණු ලබන ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතුවලින් සමන්විත පටු මුදල් සැපයුම ($M_1$) 1994 අගවන විට සියයට 19 (රුපියල් දශලක්ෂ 11,416) කින් ඉහළ යමින් රුපියල් දශලක්ෂ 71,520 ක් විය. සියයට 19 (රුපියල් දශලක්ෂ 9,614) ක මෙවැනිම ඉහල යෑමක් පසුගිය වසරහි දි ද දක්නට ලැබිණ. ගණුදෙනු චේතනාව මත මුදලට ඇති ඉල්ලුම කෙරෙහි දැඩි කැමැත්තක් පෙන්නුම් කරමින් සංසරණයේ පවත්නා මුදල් 1993 දි සියයට 18 (රුපියල් දශලක්ෂ 4,853) කින් ඉහල යාම හා සසඳා බලන කළ 1994 දි සියයට 21 (රුපියල් දශලක්ෂ 6,773) කින් ඉහළ ගිය අතර පසුගිය වසරේදී සියයට 21 (රුපියල් දශලක්ෂ 4,761) කින් ඉහළ ගිය ඉල්ලුම් තැන්පතු සියයට 17(රුපියල් දශලක්ෂ 4,643) කින් වැඩි විය. ඒ අනුව $M_1$ හි සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් ප්‍රමාණය 1993 දි සියයට 53 සිට 1994 අවසාන වන විට සියයට 54 දක්වා ඉහළ ගියේය.

මේ අතර වාණිජ බැංකු දැරූ දැඩි තැන්පතු රාශීකරණ ප්‍රයත්නයට ප්‍රතිචාරීව වාණිජ බැංකුවල මහජනතාව විසින් දරණු ලැබූ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු, (ආසන්න මුදල්) 1993 දී වූ සියයට 26 (රුපියල් දශලක්ෂ 21,047) ක ඉහළයෑමට සාපේක්ෂව 1994 දී සියයට 20 (රුපියල් දශලක්ෂ 20,212) කින් ඉහළ ගියේය. පසුගිය වර්ෂයේ දී මෙන්ම , තැන්පතුවල ඉහළ යාමට විශාල වශයෙන් දායක වූයේ පෞද්ගලික අංශයේ තැන්පතුවල ඉහළයාම වන අතර එම අංශයේ තැන්පතු සියයට 19 (රුපියල් දශලක්ෂ 16,768) කින් ඉහල ගියේය. රාජ්‍ය සංස්ථා හා සමුපකාර ආයතනවල තැන්පතු පිළිවෙලින් සියයට 29 (රුපියල් දශලක්ෂ 2,949) කින් හා සියයට 15 (රුපියල් දශලක්ෂ 495) කින් ඉහළ ගියේය. මේ අනුව ($M_1$)සහ කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු වලින් සමන්විත වූ පුළුල් මුදල් සැපයුම ($M_2$) 1994 දී සියයට 19.6 කින් ප්‍රසාරණය විය.

1994 වසරේ ඉහළ මුල්‍ය ප්‍රසාරනයට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ පෞද්ගලික අංශයට දෙන ලද ණය විශාල ලෙස ඉහළ යාමයි. රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද ණයෙහි පහළ යාමක් පැවතිය ද පෞද්ගලික අංශයට දෙන ලද ණය සියයට 21 (රුපියල් දශලක්ෂ 23,917) කින් විශාල ලෙස ඉහළ යාම හේතුකොට ගෙන පසුගිය වසරෙහි සියයට 3.5 (රුපියල් දශලක්ෂ 5,362) ක වැඩිවීම හා සසඳා බලන කළ දේශීය ණය සියයට 14.7 (රුපියල් දශලක්ෂ23,336) ක ඉහළ වර්ධනයක් වාර්තා කරනු ලැබිණ.

බැංකු ක්‍රමය මගින් රජයට දෙන ලද ශුද්ධ ණය 1993 දි සියයට 17 (රුපියල් දශලක්ෂ 7,346) ක සැලකිය යුතු පහළ යාමට ප්‍රතිවිරුද්ධව 1994 දි සියයට 4 (රුපියල් දශලක්ෂ 1,393) කින් ඉහළයාම මගින් දේශිය ණය ප්‍රසාරණය තවදුරටත් තීව්‍ර කරනු ලැබිණ. රාජ්‍ය තැන්පතු රුපියල් දශලක්ෂ 1,011 කින් වර්ධනය වී එකතු වෙමින් පවත්වනා මුදල් ශීර්ෂයන් රුපියල් දශලක්ෂ 237 කින් පහළ යාමක් පැවතියද 1994 වර්ෂය තුළ අයහපත් රාජ්‍ය මුල්‍ය තත්ත්වයක් පිළිබිඹු කරමින් මහ බැංකුව මගින් දරණු ලබන භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශලක්ෂ 1,145 කින් ඉහළයාම හා රජයට දෙනලද තාවකාලික අත්තිකාරම් රුපියල් දශලක්ෂ 1,863 කින් ඉහළ යාම හේතුකොටගෙන මහ බැංකුව විසින් රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශලක්ෂ 1,760 කින් ඉහළ ගියේය. මේ අතර වාණිජ බැංකු මගින් රජයට දෙන ශුද්ධ ණය ,සලකා බලන කාලය තුළදී පහළ ගියේය. වාණිජ බැංකු මගින් දෙන ලද දළ ණය රුපියල් දශලක්ෂ 2,382 කින් ඉහළ ගියද රාජ්‍ය තැන්පතු ශේෂ රුපියල් දශලක්ෂ 2,986 කින් ඉහළ යාම නිසා වාණිජ බැංකු මගින් රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශලක්ෂ 604 කින් පහළ ගියේය.

1994 වර්ෂය තුළ දි රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද ණය සියයට 33.6 (රුපියල් දශලක්ෂ 2,612) කින් පහළ වැටිණ. බොරතෙල් සඳහා වූ පහළ ජාත්‍යන්තර මිළ ගණන් හේතුකොටගෙන මූල්‍ය තත්ත්වයෙහි වැඩි දියුණුවක් පෙන්නුම් කරමින් රාජ්‍ය ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබාගත් ණය 1993 දි පැවති රුපියල් දශලක්ෂ 416 ක වැඩිවීමට වෙනස්ව 1994 දී රුපියල් දශලක්ෂ 2,400 කින් පහළ ගියේය. 1994 ජූලි හා අගෝස්තු මාසවලදි තිරිඟු පිටිවල තොග මිළෙහි පහත වැටීමක් තිබියදීත්, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවෙහි (ස. තො. ස.) බැංකු ණය 1994 දි රුපියල් දශලක්ෂ 67 කින් සුළු වශයෙන් පමණක් ඉහළ ගියේය. මෙයට හේතු වූයේ විශේෂයෙන්ම වර්ෂයෙහි මුල් කාලය තුළ දි තිරිඟු සඳහා වූ සතුටුදායක ජාත්‍යන්තර මිළ ගණන් හා සහනදායී වැඩපිළිවෙලවල් යටතේ තිරිඟු ලබාගත හැකිවීමය. ලංකා සිමෙන්ති සංස්ථාවේ නොපියවා පැවති අත්තිකාරම් ප්‍රමාණය සංස්ථාව පෞද්ගලීකරණය කිරීම නිසා රුපියල් දශලක්ෂ 384 කින් පහළ

ගියේය. මේ අතර සමුපකාර ආයතනයන්ට දෙන ලද මුළු බැංකු ණය ප්‍රමාණය 1993 දී රුපියල් දශලක්ෂ 1,903 ක සිට 1994 දී රුපියල් දශලක්ෂ 2,541 දක්වා ඉහළ ගියේය.

නොකඩවා පස්වන වසරට ද සමස්ත ගෙවුම් ශේෂයෙහි අතිරික්තයක් පෙන්නුම් කරන තත්ත්වයක් තුළ බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් 1993 වර්ෂයෙහි දී වූ සියයට 87.9 (රුපියල් දශලක්ෂ 21,238) ක විශාල වර්ධනය හා සසඳා බලන කල වර්ෂය තුළදී සියයට 37.7 (රුපියල් දශලක්ෂ 17,102) කින් තවදුරටත් ඉහළ ගියේය. මහ බැංකුවෙහි ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශලක්ෂ 14,288 කින් ඉහළ ගිය අතර වාණිජ බැංකුවල එම වත්කම් රුපියල් දශලක්ෂ 2,814 කින් ඉහළ යනු ලැබිණ.

තැන්පතු වගකීම් විශාල ලෙස ඉහළ යාම නිසා වාණිජ බැංකුවල ද්‍රවශීලතා තත්ත්වය 1994 වර්ෂය තුළදී ද ඉහළ මට්ටමක පැවතුණි. වාණිජ බැංකුවල ද්‍රවශීල වත්කම් පසුගිය වසරෙහි සියයට 23.4 (රුපියල් දශලක්ෂ 12,504) ක ඉහළ යෑම හා සසඳා බලන කළ 1994 වර්ෂය තුළදී සියයට 18.5 (රුපියල් දශලක්ෂ 12,204) ක අඩු වේගයකින් වර්ධනය විය. ද්‍රවශිල වත්කම් හි ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් ම සිදු වූයේ විදේශීය ශේෂයන්, අතැති මුදල් හා භාණ්ඩාගාර බිල්පත් හි ආයෝජනයන් මගින්ය. වර්ෂය තුළ දී වූ තැන්පතු වගකීම්හි වැඩිවීමට වඩා ද්‍රවශිල වත්කම් හි මන්දගාමී ඉහළ යාමක් පෙන්නුම් කරමින් ද්‍රවශීල වත්කම් හා තැන්පතු අතර අනුපාතය 1993 දී සියයට 190.8 ක සිට 1994 අග වන විට සියයට 187.4 දක්වා පහළ වැටිණ. මේ අතර, ද්‍රවශීල වත්කම් හා මුළු තැන්පතු වගකීම් අතර අනුපාතය මෙම කාලය තුළදී සියයට 40.6 සිට 40.2 දක්වා සුළු වශයෙන් පහත වැටිණ.

වාණිජ බැංකුවල මුළු වත්කම් හා වගකීම් ප්‍රමාණය (ප්‍රති සටහන් හැර) පසුගිය වසරෙහි පැවති සියයට 32 (රුපියල් දශලක්ෂ 59,397) ක ඉහළ වැඩිවීම හා සසඳා බලන කළ වර්ෂය තුළදී සියයට 15 (රුපියල් දශලක්ෂ 37,262) කින් ප්‍රසාරණය විය. කෙසේ වෙතත් වාණිජ බැංකුවල වත්කම් හා වගකීම් ව්‍යුහයෙහි වෙනස්කම් කීපයක්ම දක්නට ලැබිණ. වාණිජ බැංකුවල මුළු වත්කම්වලින් ද්‍රවශීල වත්කම් ප්‍රමාණය 1993 දී සියයට 27.0 ක සිට 1994 සියයට 27.8 දක්වා ඉහළ ගියේය. විදේශ වත්කම් ප්‍රමාණය හා රජයේ සුරැකුම්පත් හි හා අනෙකුත් ආයෝජන පිළිවෙලින් 1993 දී සියයට 8.4 හා සියයට 8.0 සිට 1994 දී සියයට 9.5 හා 9.3 දක්වා ඉහළ ගියේය. ස්ථාවර වත්කම් හි ප්‍රමාණය 1993 දී සියයට 21 ක සිට 1994 දී සියයට 17.9 දක්වා පහළ වැටුණ අතර, ණය සහ අත්තිකාරම් හි ප්‍රමාණය සියයට 51 ක මට්ටමෙහි නොවෙනස්ව පැවතිණි. වගකීම් අංශයෙහි ඉල්ලුම් තැන්පතු වල ප්‍රමාණය සියයට 14.2 සිට සියයට 14.8 දක්වා ඉහළ ගිය අතර, කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු සියයට 51.1 සිට සියයට 53 දක්වා ඉහළ ගියේය. මේ අතර, මුළු වගකීම්වලින් ගෙවා නිමි ප්‍රාග්ධනයෙහි ප්‍රමාණය සියයට 1 සිට සියයට 10 දක්වා ඉහළ ගිය අතර, අනෙකුත් වගකීම් හි ප්‍රමාණය සියයට 21.1 සිට සියයට 17.6 දක්වා පහළ වැටිණ.

## මූල්‍ය ප්‍රතිපත්තිය

සමස්ත මූල්‍ය අගයන් හි පැවති අඛණ්ඩ ඉහළ වර්ධනය හේතුවෙන් 1994 වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවට දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට සිදු වූ නමුත් මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් අඩුවීම නිසා විවට වෙළෙඳපොළ කටයුතුවල යෙදීමේ හැකියාව සීමා විය. භාණ්ඩාගාර බිල්පත් මගින් විවට වෙළෙඳපොළ කටයුතුවල නිරතවීමට ඇති ඉඩ ප්‍රස්ථා සීමා කෙරුණ වාතාවරණය තුළ අධි ද්‍රවශීලතාවය ඉවත් කිරීම සඳහා මහ බැංකුව මාස 3-6 කල්පිරීමකින් යුත් මහ බැංකු සුරැකුම්පත් නිකුත් කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මහ බැංකු සුරැකුම්පත්වල ප්‍රමාණය 1993 අග දී රුපියල් දශලක්ෂ 2,155 ක සිට 1994 අග වන විට රුපියල් දශලක්ෂ 3,740 දක්වා ඉහළ ගියේය. අඛණ්ඩව කරගෙන යනු ලැබූ විවට වෙළෙඳ පොළ කටයුතු නිසා මහ බැංකුවට තම භාණ්ඩාගාර බිල්පත් දැරීමේ ප්‍රමාණය 1993 අග දී රුපියල් දශලක්ෂ 3,949 ක සිට 1994 සැප්තැම්බර් අග වන විට රුපියල් දශලක්ෂ 31 දක්වා අඩු කර ගැනීමට හැකි විය. කෙසේ වෙතත් රාජ්‍ය මූල්‍ය කටයුතුවල පිරිහීම නිසා මහ බැංකුවෙහි භාණ්ඩාගාර බිල්පත් දැරීමේ ප්‍රමාණය 1994 දෙසැම්බර් මස දී රුපියල් දශලක්ෂ 5,093 දක්වා වැඩි විය. සංචිත මුදල් හි ප්‍රසාරණය තවදුරටත් සීමා කිරීමේ පියවරක් ලෙස මහ බැංකුව සිය කෙටිකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් නවතා දමනු ලැබිණ.

නව සපිරි ග්‍රාමීය ණය වැඩපිළිවෙල යටතේ දෙනු ලැබූ ප්‍රතිමූල්‍ය පහසුකම් 1994 මාර්තු 31 වන දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවනු ලැබිණ. එසේ වුවද න. ස. ග්‍රා. ණය වැඩපිළිවෙල යටතේ සපයනු ලබන කෘෂිකාර්මික ණය සඳහා න. ස. ග්‍රා. ණය වැඩ පිළිවෙලට සම්බන්ධ වන මූල්‍ය ආයතනයන්ට රජය මගින් පොළී සහනාධාරයක් ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කරනු ලැබිණ. වාණිජ බැංකු මගින් සපයනු ලැබූ පෙර නැව්ගත කිරීමේ ණය සඳහා සපයන ලද අපනයන ණය ප්‍රතිමූල්‍ය පහසුකම් 1994 මැය 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නවතා දමනු ලැබිණ. මෙම වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙසින් මහ බැංකුව මගින් සපයනු ලැබූ කෙටිකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් 1993 දෙසැම්බර් මස දී රුපියල් දශලක්ෂ 753 ක සිට 1994 දෙසැම්බර් මස දී රුපියල් දශලක්ෂ 72 දක්වා පහත වැටිණ.

මහ බැංකුව මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ නව මූල්‍ය පහසුකම් ප්‍රදානයෙන් වැළකුන ද, අර්බුදවලට ලක් වූ මූල්‍ය සමාගම් මගින් ප්‍රතිමූල්‍ය සඳහා කරනු ලබන ඉල්ලීම් වලට ඉඩ සලසා දෙනු ලැබූ අතර සපයනු ලැබූ ණය ප්‍රමාණය සීමා කරනු ලැබිණ. 1994 වර්ෂයේ දී මේ සඳහා රුපියල් දශලක්ෂ 263 ක මුදලක් ප්‍රදානය කරනු ලැබූ අතර, රුපියල් දශලක්ෂ 4 ක ප්‍රමාණයක් ආපසු අයකර ගනු ලැබිණ. මෙහි ප්‍රතිඵලයක් ලෙස මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ විපතට පත් මූල්‍ය සමාගම්වලට ප්‍රදානය කළ ප්‍රතිමූල්‍ය ණයෙහි නොපියවා පැවති ප්‍රමාණය 1993 අග දී රුපියල් දශලක්ෂ 2,045 ක් සිට 1994 අග වන විට රුපියල් දශ 2,304 දක්වා ඉහළ ගියේය. මේ සියල්ලෙහි අවසාන ප්‍රතිඵලය වූයේ මෙම ක්‍රියාමාර්ගයන් මගින් කෙටිකාලීන, මැදි හා දිගුකාලීන පහසුකම් යටතේ ප්‍රදානය කරන ලද ප්‍රතිමූල්‍ය ණයෙහි නොපියවා ඇති ප්‍රමාණය 1993 දෙසැම්බර් අග දී පැවති රුපියල් දශලක්ෂ 4,903 ක සිට 1994 අග දී රුපියල් දශලක්ෂ 3,376 දක්වා ණය අහිමිවීම් ප්‍රතිපාදයන් හි බොල් ණය සඳහා වූ ප්‍රතිපාදනයන්හි වැඩිවීම වූ රුපියල් දශලක්ෂ 271 ලැපබූ පසු රුපියල් දශලක්ෂ 1,256 කින් පහළ යාමයි.

දේශීය ණය ප්‍රසාරණය සීමා කිරීම සඳහා මහ බැංකුව වාණිජ බැංකු තැන්පතු වගකීම් සඳහා සියයට 15 ක ඉහළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතියක් පවත්වාගනු ලැබිණ. එසේ වුවද, වාණිජ බැංකුවල විදේශ සංචිතය පුළුල් කර ගැනීමට බැංකු දිරිමත් කිරීමත් සඳහා හා එමගින් සංචිත මුදල් ඇති කරන බලපෑම අඩු කිරීම සඳහා විදේශයන් හි ඇති විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 1994 පෙබරවාරි 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 5 දක්වා අඩු කරනු ලැබිණ. ඉහළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයක් පවත්වා ගැනීම මූල්‍ය ගුණකය 1993 දෙසැම්බර් මස දී පැවති 2.86 ක සිට 1994 දෙසැම්බර් මසදී 2.84 දක්වා පහත වැටීමට හේතු විය.

## පොළී අනුපාතයන්හි වෙනස්වීම්

විදේශ සම්පත් ගලා ඒමේ සැළකිය යුතු විචලනය, රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය අඩුවීම යන කරුණු 1994 වර්ෂය තුළදී පොළී අනුපාතිකයන් හි සැළකිය යුත , උච්චාවචනයකට තුඩු දෙනු ලැබිණ. දේශීය මුදල් වෙළෙඳපොළෙහි සැළකිය යුතු ද්‍රවශීලතා තත්ත්වයක් ඇති කරමින් 1993 වසර තුළදී අත් දකිනු ලැබූ විදේශීය ප්‍රාග්ධනය විශාල ලෙස ගලා ඒම 1994 මුල් භාගය තුළ දී ද අඛණ්ඩව පැවතිණ. මහ බැංකුව වෙතැති සීමිත භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය නිසා අධි ද්‍රවශීලතාවය ඉවත් කිරීම සඳහා මහ බැංකුවට විවට වෙළෙඳපොළ කටයුතුවල නිරතවීමට ඇති ඉඩකඩ දැඩි ලෙස සීමා විය. මේ අනුව 1994 පෙබරවාරි අග වන විට ශුද්ධ වශයෙන් රුපියල් දශලක්ෂ 635 ක් වටිනා මහ බැංකු සුරැකුම්පත් නිකුතුවත් මහ බැංකුව විසින් දරණු ලබන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 3,908 කින් පහළ යාමක් සිදු වුවද වෙළෙඳ පොළෙහි පැවති අධි ද්‍රවශීලතා තත්ත්වය භාණ්ඩාගාර බිල්පත්වල සාමාන්‍ය ඵලද අනුපාතිකය පහළ දැමීමට හේතු විය. මේ අනුව ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් වල සාමාන්‍ය ඵලද අනුපාතිකය වර්ෂය ආරම්භයේ ද පැවති සියයට 18.09 ක සිට 1994 පෙබරවාරි අග වන විට සියයට 14.43 දක්වා ද, හය මාසික භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය සියයට 18.47 සිට 14,88 දක්වාද දොළොස් මාසික භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය සියයට 19.38 සිට 15.63 දක්වා ද පහත වැටුණි. මාස දෙකක පමණ කාලයක් තුළදී සිදු වූ මෙම පහළයාම මගින් භාණ්ඩාගාර බිල්පත්වල සාමාන්‍ය ඵලද අනුපාතිකයෙහි සියයට 3.75 ක පමණ පහළ යාමක් පෙන්නුම් කරනු ලැබිණ.

පොළී අනුපාතිකයන්හි මෙම පහළ වැටීම මාර්තු මැද දක්වා පැවතිණ. කෙසේ වුවද, 1994 මාර්තු මාසයේදී රුපියල් දශලක්ෂ 1,400 ක් වටිනා නව භාණ්ඩාගාර බිල්පත් නිකුතුව සහ රුපියල් දශලක්ෂ 686 ක් වටිනා මහ බැංකු සුරැකුම්පත් නිකුතුව මෙම පහළ යෑමේ නැඹියාව වැළැක්වීමට හේතු විය. අප්‍රියෙල් සහ මැයි මාසවල දි තවදුරටත් නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 600 ක් වූ භාණ්ඩාගාර බිල්පත් හා රුපියල් දශලක්ෂ 275 ක් වූ මහ බැංකු සුරැකුම්පත් නිසා පොළී අනුපාතිකයන් ඉහළ යෑමේ නැඹියාවකට නැඹුරු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජූනි මස අවසානයේදී ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් හි සාමාන්‍ය ඵලද අනුපාතිකය සියයට 15.39 කින් ද, පිළිවෙලින් භාණ්ඩාගාර බිල්පත් හි හය මාසික සහ දොළොස් මාසික සාමාන්‍ය ඵලද අනුපාතිකයන් සියයට 15.62 සහ 15.87 වශයෙන්ද ඉහළ නැගිණ.

ජූලි මාසය තුළ දී දක්නට ලැබුණු අධි ද්‍රවශීලතා තත්ත්වය ඉන්පසුව එළඹි මාසවල දී පොළී අනුපාතිකයන්හී පහළ යාමට මූලික විය. මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය පහළ යාමත්, කල්පිරෙන කෙටිකාලීන මහ බැංකු සුරැකුම්පත් සඳහා නැවත සුරැකුම්පත් නිකුත් නොකිරීමත් හේතුවෙන්, 1994 ඔක්තෝම්බර් මාසයේදී ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් ඵලදව සියයට 11.58 කින් සහ දොළොස් මාසික බිල්පත් අනුපාතය සියයට 12.20 කින් පහත වැටිණ. විදේශ ප්‍රාග්ධන ගලාඒම් හි පහළ යාමත්, සිය මූල්‍ය අවශ්‍යතාවයන් පියවා ගැනීම සඳහා රුපියල් දශලක්ෂ 3,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් සඳහා රජයෙන් ඇති වූ ඉල්ලුමත් මෙම නැඹියාව මුළුමනින්ම වෙනස් කිරීමට හේතු විය. මූල්‍ය සමස්තයන් හි අධි වර්ධන අනුපාතය අඩු කිරීම සඳහා මහ බැංකුව වට රුපියල් දශලක්ෂ 2,510 ක් වටිනා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම මගින් විවට වෙළෙඳපොළ කටයුතු ශක්තිමත් කිරීමට සිදුවිය. මෙම සාධකයන් මගින් 1884 දෙසැම්බර් මස දි පොළී අනුපාතිකයන්හි තියුණු වැඩිවීමක් පෙන්නුම් කරනු ලැබිය. දෙසැම්බර් මස අග වන විට ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත්වල ඵලද අනුපාතිකය සියයට 18.73 දක්වා ඉහළ ගිය අතර, හභය මාසික හා දොළොස් මාසික භාණ්ඩාගාර බිල්පත්හි ඵලද අනුපාතිකය පිළිවෙලින් සියයට 19.29 හා 19.43 දක්වා ඉහළ ගියේය. මේ අනුව ඔක්තෝබර් අවසානයේ සිට දෙසැම්බර් අවසානය දක්වා වූ මාස දෙකක කාලය තුළ දී පොළී අනුපාතික සියයට 7.15 - 7.58 දක්වා වැඩි විය. කෙසේ වුවද භාණ්ඩාගාර බිල්පත්හි ඵලද අනුපාතිකයන් තියුණු ලෙස ඉහළ ගියද සංචිත මුදල් ප්‍රසාරණයකට තුඩු දෙමින් මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය ඔක්තෝම්බර් අග දී රුපියල් දශලක්ෂ 1,433 සිට දෙසැම්බර් අග වන විට රුපියල් දශගක්ෂ 5,093 දක්වා ඉහළ ගියේය. 1994 භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ බොහෝ අවස්ථාවල දී ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙනදේසියේ දී අධිද්‍යකත්වයක් පෙන්නුම් කිරීමයි.

මේ අතර අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි අධි විචලනයන් වැළැක්වීම සඳහා 1993 ඔක්තෝබර් මස මහ බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබූ ප්‍රතිමිළදී ගැනීමේ වෙළෙඳපොළ පොදුවේ පොළී අනුපාතයන් හී තදබල පහළයාම් වළක්වා ලීමට සමත්විය. කෙසේ වෙතත් බොහෝවිට මහ බැංකුව වෙතැති බිල්පත් ප්‍රමාණය අවසන් වූ කල්හි ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාතයන්හි සැළකිය යුතු පහත වැටීම් දැකිය හැකි විය. 1993 දෙසැම්බර් අග දී සියයට 16.50-18.50 අතර පොළී පරාසයක් තුළ පැවති ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාතයන් පහත වැටුණා පමණක් නොව මාර්තු අග වන විට සියයට 5.00 - 15.00 අතර පුළුල් පරාසයක් තුළ පැවතිණ. මහ බැංකුවෙහි එක් දින ප්‍රති මිළදී ගැනීමේ පොළී අනුපාතිකයන් 1993 අග දි සියයට 16.5 සිට මාර්තු අග භාගයේදී සියයට 12 දක්වා ක්‍රමයෙන් පහත වැටිණ. මෙම අනුපාතයන් වෙළෙඳපොළෙහි තත්ත්වයන්ට අනුරූපව යමින් සැප්තැම්බර් මැද භාගය දක්වා සුළු විචලනයන් සහිතතව එම මට්ටමෙහිම පවත්වා ගනු ලැබිණ. මේ වන විට ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පොළී අනුපාතිකයන් ඉතා පහල මට්ටමක පැවති බැවින් ඒ අනුව යමින් එක් දින ප්‍රතිමිළදී ගැනි මේ අනුපාතිකයන් ඔක්තෝබර් මැද භාගය වන විට සියයට 7.00 දක්වා පියවර ගණනකින් පහළ වැටිණ. සැප්තැම්බර් මැද භාගය වන විට සියයට 4.00-8.00 පොළී පරාසයක් තුළ පැවති ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පොළී අනුපාතිකයන් ඔක්තෝබර් අග වන විට සියයට 12.25-13.50 ක පොළී පරාසයක් කරා ක්‍රමයෙන් ඉහළ ගියේය. වසරෙහි අවසාන මාස දෙක තුළ දී පැවති අඩු ද්‍රවශිල තත්වය ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පොළී අනුපාතිකයන් නොවැම්බර් මස දි සියයට 13.00-17.00 දක්වා ද දෙසැම්බර් මස දී සියයට 20.00-23.00 දක්වා ද ඉහළ යාම මගින් පිළිබිඹු කෙරිණ. මහ බැංකුවෙහි එක්දින ප්‍රති මිළදී ගැනීමේ අනුපාතිකයන් නොවැම්බර් මස දි සියයට 13.75 දක්වා ද, දෙසැම්බර් මස අග දී සියයට 20.00 දක්වා ද ඉහළ යනු ලැබිණ.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ඉතිරිකිරීමේ තැන්පතු සඳහා පිරිනමනු ලබන පොළී අනුපාතිකය වසර පුරාම සියයට 14.00 ක් වශයෙන් පැවතුණි. සියයට 16-17 ත් අතර පොළී පරාසයක් තුළ පැවති ස්ථාවර තැන්පතු සඳහා ගෙවන පොළී අනුපාතිකයන් දෙසැම්බර් මස දී සියයට 14.00 දක්වා පහළ දමන තෙක් එම මට්ටමෙහි ම නොවෙනස්ව පවත්වාගනු ලැබිණ. 1993 අග වන විට පහළයමින් තිබූ වාණිජ බැංකු පොළී අනුපාතිකයන් 1994 වසර තුළ දී ද නොකඩවා පහත වැටිණ. වාණිජ බැංකුවල කාලීන තැන්පතු පොළී අනුපාතිකයන් 1993 අග දී පැවති සියයට 10.00-19.00 පොළී අනුපාතිකය හා සසඳා බලන කළ 1994 අග වන විට සියයට 8.00-18.25 ත් අතර පොළී පරාසයක් තුළ විචලනය වූ අතර ඉතිරි කිරීමේ තැන්පතු අනුපාතිකයන් 1993 අග දී සියයට 6.00-15.00 ක් වූ පොළී පරාසය හා සසඳා බලන කල සියයට 5.05-13.00 ක් වූ අතර වූපොළී පරාසයක් තුළ පැවතිණ. පොළී අනුපාතයන්හී ඇති වූ මෙම වෙනස්කම් පිළිබිඹු කරමින් බරතැබූ සාමාන්‍ය තැන්පතු පොළී අනුපාතිකය 1993 දෙසැම්බර් මස දී සියයට 13.6 කි සිට 1994 දෙසැම්බර් මස දී සියයට 12.6 දක්වා පහත වැටිණ. වාණිජ බැංකුවල බරතැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය 1993 අග දී සියයට 20.4 ක සිට 1994 ඔක්තෝබර් අග වන විට සියයට 16.9 දක්වා පහළ ගිය ද වසර අග වනවිට භාණ්ඩාගාර බිල්පත්වල එලද අනුපාතිකයට සරිලන පරිදි සියයට 17.8 දක්වා පහළ ගියේය. මේ අතර කෙටිකාලීන පොළී අනුපාතයන්හි දක්නට ලැබුණු පහළට නැඹුරු වූ උපනතිය අනුව යමින්, දිගුකාලීන පොළී අනුපාතිකයන්ද 1994 වර්ෂයේදී 1993 වර්ෂයට වඩා පහළ මට්ටමක පැවතුණි. වර්ෂ 3-5 අතර කාලයකින් යුතු රජයේ සුරැකුම්පත් සඳහා පැවති පොළී අනුපාතිකයන් 1993 දී පැවති සියයට 16.0 -17.0 සමඟ සසඳන කල මෙම වර්ෂයේදී සියයට 14.00-16.00 ක්ව පැවතුණි. මෙම වර්ෂය තුළදී පරිනත කාලය වර්ෂ 6 සහ 7 කින් යුතු සියයට 14.00-15.75 පරාසයක පැවති පොළී අනුපාතිකයන් සහිත දිගුකාලීන රුපියල් සුරැකුම්පත් ද නිකුත් කරන ලදි.

## ගැටළු සහ ප්‍රතිපත්ති

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින විනිමය සහ වෙළෙඳ සීමා, ඉවත් කිරීම්, 1994 වසරෙහිදි තවදුරටත් ප්‍රගතියක් පෙන්නුම් කරන ලදි. 1994 මාර්තු මස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම් ප්‍රතිපත්තිවල VIII වැනි වගන්තියෙහි වගකිම් පිළිගැනීමත් සමඟම ජාත්‍යන්තර ජංගම ගණුදෙනු සඳහා වූ විනිමය සීමාකිරීම් මුළුමනින්ම ඉවත් කිරීම මගින් මෑත වර්ෂවලදී විනිමය පාලන ලිහිල් කිරීම සහ ශ්‍රී ලංකා රුපියලේ පූර්ණ ප්‍රතිවර්ත්‍යතාව පවත්වා ගැනීම සඳහා ලබාගත් ප්‍රගතියෙහි සංධිස්ථානයක් සලකුණු කරන ලදි. ගිවිසුම් වගන්තිවල අටවැනි වගන්ති පිළිගැනීමත් සමඟ, සියළුම ජාත්‍යන්තර ජංගම ගණුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියල නිදහසේ පරිවර්තනය කළ හැකි විය. තවද, මෙම ගිවිසුමෙහි කොන්දේසි පිළිගැනීමෙන් ජාත්‍යන්තර ගණුදෙනුවල ගෙවීම් සහ පැවරුම් මත සීමාවන් පැනවීමේ අවශ්‍යතාවයන් ඉවත් කෙරෙන, ශක්තිමත් ආර්ථික ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමට රජය බැඳී සිටී.

පාලනයට යටත්ව පැවති ආනයන භාණ්ඩ බොහෝ සංඛ්‍යාවක බලපත්‍ර අවශ්‍යතා ද 1994 දී ඉවත් කරන ලදි. පුළුල් ව බලන කළ, ශ්‍රී ලංකාවේ ආනයන පාලනයන් සෞඛ්‍ය, ආරක්ෂණ සේවා සහ පාරිසරික හේතු මත අතවශ්‍ය වූ සීමිත භාණ්ඩ ප්‍රමාණයකට පමණක් දැනට සීමා වී ඇත.

මේ අතර 1994 වර්ෂයේදී පාර්ලිමේන්තු මහ මැතිවරණයක් හා ජනාධිපතිවරණයක් පැවැත්වීම හේතුකොට ගෙන ආර්ථිකයේ අනෙකුත් අංශවල පැවති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන්ද පසුබෑමකට ලක්විය. බදු ප්‍රතිසංස්කරණ, පෞද්ගලීකරණය සහ මූල්‍ය අංශයෙහි ප්‍රතිසංස්කරණයන්වලදී සුළු ප්‍රගතියක් පමණක් දක්නට ලැබුණි. භාණ්ඩ විශාල සංඛ්‍යාවක් බද්දෙන් නිදහස් කිරීම හා බදු අනුපාත අඩුකිරීම මගින් භාණ්ඩ හා සේවා මත පදනම් වූ බදු ක්‍රමයක් කරා පරිවර්තනය පහසු කරවනු වස් පිරිවැටුම් බදු ව්‍යුහයෙහි විධිමත් කිරීමෙහිලා මෑත වර්ෂවලදී ලබා තිබූ ප්‍රගතිය, අඩාල කරනු ලැබිණ.

තීරුබදු ප්‍රතිසංස්කරණයන්හි දී සැළකියුතු දුර්වලකම් දක්නට ලැබුණි. 1993 නොවැම්බර් මාසයේදී මෝටර් රථ, මත්පැන් සහදුම්කොළ හැර අනෙකුත් භාණ්ඩ තීරුබදු අනුපාත සියයට 10,20,35,සහ 45 වශයෙන් කාණ්ඩ හතරකට අයත්වන පරිදි විධිමත් කරන ලදි. එසේ වුවද, වෙළෙඳ භාණ්ඩ විශාල සංඛ්‍යාවක් තීරු බද්දෙන් නිදහස් කිරීම, තාවකාලික බදු අඩු කිරීම ප්‍රදානය කිරීම

සහ සියයට 5 ක තීරු බදු කාණ්ඩයක් හඳුන්වාදීම මගින් 1993 නොවැම්බර් මාසයේ සිට බලපැවැත්වුණු තීරුබදු අනුපාත ලේඛණය දැඩි ලෙස ව්‍යාකූල කෙරීන. රජයේ ආදයම සැළකිය යුතු ලෙස අහිමිවීම හැරුන විට මෙම වෙනස්කම් සමානත්වයෙන් පැවතිය යුතු වූ සඵල ආරක්ෂණයෙහි ද සැළකිය යුතු විකෘතිවීම් ඇති කරනු ලැබිය. පරිප්පු වැනි ද්‍රව්‍යයන් මුළුමනින්ම තීරුබදු වලින් නිදහස් කිරීම හේතුවෙන් ඒ හා සමාන ද්‍රව්‍යයන් නිෂ්පාදනය කරනු ලබන දේශිය කෘෂි නිෂ්පාදකයන්ට ජාත්‍යන්තර මිළ ගණන් හා තරඟකාරී ලෙස කටයුතු කිරීමට සිදු විය. මෙලෙස නිමි භාණ්ඩ සඳහා ඉහළ තීරු ගාස්තු පවත්වා ගන්නා අතර, විවිධ අමුද්‍රව්‍ය හා අමතර කොටස් සඳහා තීරුබදු අඩු කිරීම් හා නිදහස් කිරීම් ප්‍රමාදය කිරීමෙන් හැඟීයන්නේ තීරුබදු ව්‍යූහය දේශීය වශයෙන් නිපදවූ අමුද්‍රව්‍ය හා අමතර කොටස් සඳහා කිසිදු ආරක්ෂාවක් නොසලස්වන බවත් එමගින් කාර්මික සංවර්ධනය පසුබිම් කොට අගන ඇති විය හැකි ආර්ථික කටයුතු සඳහා දිරිගැන්වීම් ව්‍යූහය නොසලකා හැර ඇති බවත්ය.

රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය සම්බන්ධ ප්‍රතිපත්තියෙහි ඇතැම් ලිහිල් වීම් දක්නට ලැබුණි. පුරප්පාඩු පිරවීම නතර කොට දැනට පවතින සේවක පිරිස විධිමත් කිරීම මෑතකාලීන රාජ්‍ය අංශ ප්‍රතිසංවිධානයෙහි පැහැදිලි ප්‍රතිපත්තිය වි තිබුණද ජාතික මැතිවරණ මධ්‍යයෙහිදී උපාධිධාරීන් 8000 කට රැකියා සැලසීමට හා රාජ්‍ය සේවයේ අනියම් සේවකයින් ස්ථිර කිරීමට රජය තීරණය කළේය. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය විධිමත් කිරීමට දරණ ලද උත්සාහයන් මෙම තීරණය මගින් දැඩි ලෙස යටපත් කරන ලදි. රජය පාසැල් ගුරුවරුන් සඳහා සැළකිය යුතු වැටුප් වැඩිවීමක් ලබා දීමට තීරණය කරනු ලැබූ අතර එම තීරණයෙහි මූල්‍යමය පිරිවැය 995 අයවැය මත පටවා තිබේ.

සුභසාධන වියදම් පිළිබඳ ඉලක්කම් කිරීමේ ප්‍රතිපත්තිමය උපාය මාර්ගයන්හිදආපසු හැරීමක් 1994 දි දක්නට ලැබිණ. පාසැල් දිවා ආහාර වැඩසටහන, ආහාර මුද්දරලාභී පවුල්වලට පමණක් සීමා කිරීමට ගෙන තිබූ තීරණය 1994 මැයි මාසයේදී ඉවත් කරන ලදී. ඒ අනුව මෙම වැඩසටහන සඳහා වූ වාර්ෂික පිරිවැය, අයවැයෙහි ඉලක්කගත පිරිවැය වූ රුපියල් දශලක්ෂ 900 සිට රුපියල් දශලක්ෂ 2,300 දක්වා ඉහල නැගිණි. 1994 වර්ෂයේ අවසානයට සැලසුම්කොට තිබූ ජනසවිය වැඩපිළිවෙළෙහි පස්වන වටය සැලසුම්ගත දිනට කලින් ආරම්භ කරන ලද අතර ආදයම් පැවරුම, සුදුසු ඉලක්ක කිරීමකින් තොරව පස්වන වටය යටතට ගැණුන සියලුම ප්‍රතිලාභින්ට ලබා දෙන ලදී.

පරිපාලිත මිළ සම්බන්ධයෙන් පැවති ප්‍රතිපත්ති ස්ථාවරයෙහිද වෙනස්වීමක් ගතවූ වර්ෂය තුළ දක්නට ලැබිණි. බලශක්ති අංශයේ ආයෝජනයට ප්‍රමාණවත් ඵලදායි අනුපාතයක් ඉපයෙන පරිදි මෑත වර්ෂවලදී සංශෝධනය කරන ලද විදුලිබල ගාස්තු පහත හෙලිමට තීරණය කිරීමත් සමඟ ආපසු හැරීමකට ලක් විය. වර්ෂ ගණනාවක් පුරා කරන ලද පරිපාලනමය මිළ නිවැරදිකිරීම් මගින් පිරිවැය හා සම තත්වයකට ගෙන එන ලද පිටි මිළ, සහල් වැනි දේශීය ආදේශකයන්ගේ නිෂ්පාදන මිළ හා රාජ්‍ය අයවැය කෙරෙහි අයහපත් ප්‍රතිවිපාකන ඇති කරමින් කිලෝවකට රුපියල් 1.50 බැගින් 1994 ජූලි මාසයේදී ද නැවත කිලෝවකට රුපියල් 4.35 බැගින් 1994 අගෝස්තු මස අවසානයේදී ද පහත හෙලනු ලැබීය. බොහෝදුරට සමාන නිෂ්පාදන පිරිවැයකින් යුතු භූමිතෙල්, ඩීසල් හා පෙට්‍රල් මිළ ව්‍යූහය, තදබල ලෙස ව්‍යාකූල කමින් භූමිතෙල් සහ ඩීසල් සඳහා වූ පරිපාලන මිළ ද පහත හෙලනු ලැබිය. මෙම ව්‍යාකූලතාවයන් විසින් ඇති කරන ලද සාපේක්ෂ මිළ වාසි මගින් දෙනු ලැබූ අනුබලය අනුව ඩීසල් මෝටර් රථ සඳහා වරණය වැඩිවීම හේතුකොට දැනට වාර්ෂිකව සියයට 10 පමණ අනුපාතිකයකින් වර්ධනය වන ඩීසල් පරිභෝජනය ඉහළ නැංවිණ. මෙය රජයේ අයවැය මත පමණක් නොව රටෙහි ආනයන මතද බලපෑම් ඇතිකිරීමට සමත් විය. ජාත්‍යන්තර වශයෙන් පොහොර සඳහා ඉහල මිළක් පවතිද්දීත් 1994 ඔක්තෝබර් මාසයේදි සියයට 30 පොදු පොහොර සහනාධාරයන් හඳුන්වා දෙන ලදි. දේශීය ආහාර මිළ ගණන්මත සැළකියුතු ව්‍යාකූල තත්ත්වයක් ඇති කිරීමට අමතරව, තිරිඟුපිටි, පාන් සහ පොහොර සඳහා වූ සහනාධාරයන් සඳහා ඇස්තමේන්තු කළ පිරිවැය 1995 දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1 ක පමණ ප්‍රමාණයක් වූ අතර එමගින් රාජ්‍ය මූල්‍ය ගැලපුම් කිරීම් ක්‍රියාත්මක කිරීමෙහි දුෂ්කරතාවන් වැඩි කෙරීන.

1994 ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන්හිද කැපී පෙනෙන දුබලතාවයන් වූ බව ඉහත දැක්වූන විශ්ලේෂණයෙන් පෙන්නුම් කරයි. ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, කෙටිකාලීන ජනප්‍රිය ප්‍රතිපත්ති උදෙසා නොසලකා හරින ලදි. නිසැකවම, මෙහි ක්‍රියාමර්ග මගින් මහජනතාවට කෙටිකාලීන වාසි සැලසුණි. එහෙත් මෙබඳු ක්‍රියාමර්ග මගින් ආදයම් සහ සේවා නියුක්ති අවස්ථා වැඩිදියුණු කරගත හැකිද, අවසානයේ ඉහළ ආර්ථික වර්ධනයක් හා මහජනතාවගේ සුභසිද්ධිය ස්ථිරසාර පදනමක් මත පවත්වා ගත හැකිවේද යන්න ප්‍රවේශමෙන් විග්‍රහ කළයුතු කරුණකි. පරිපාලනමය මිළ අඩුකිරීම්, බදු නිදහස් කිරීම හා සෘජු අයවැය ප්‍රදනයන් මගින් විවිධ සහනදයී වැඩපිළිවෙලවල් සඳහා කරන ලද වෙන් කිරීම්,අයවැය හිඟය වැඩි කිරීමට සමත් විය. මෙබඳු වැඩපිළිවෙලවල් නිසා අයවැයෙන් දැරීමට සිදුවන ඉහළ අයවැය, අවසාන වශයෙන් පවත්නා බදු පදනමට ඉහළ බදු පැනවීමට හෝ ඉහළ උද්ධමනය සහ පොළී අනුපාතයන්ට හේතුවේ. මීට අමතරව, මෙබඳු වැඩපිළිවෙලවල්, නිෂ්පාදනය හා අපනයන අධෛර්යමත් කරන අතර පරිභෝජනය හා ආනයන ධෛර්යමත් කරමින් සේවා නියුක්තිය හා ජනතාවගේ සමස්ත සුභසිද්ධියද අඩු කිරීමට ද හේතු වේ.

ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයෙහි මූලික අරමුණ ස්ථිරසාර පදනමක් මත සීඝ්‍ර ආර්ථික වර්ධනයක් ලබා කර ගැනීමය. ඉහළ ප්‍රගතියක් දක්වන ආසියානු ආර්ථිකයන් පෙන්වා දෙනුයේ නිවැරදි ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම මගින් ආදයම් ව්‍යාප්ති අරමුණු සහ ජනතාවගේ සුභසිද්ධිය හා එක්ව යන පරිදි සීඝ්‍ර ආර්ථික වර්ධනයක් ලබාගත හැකි බවයි. ඉහල ප්‍රගතියක් පෙන්වන ආර්ථිකයන්ගේ සීඝ්‍ර වර්ධනය හා මෙම විෂය පිළිබඳව වර්තමාන පර්යේෂණ පැහැදිලිව දක්වනුයේ වර්ධනය හා ආදයම් ව්‍යාප්තිය අතර නොවැලැක්විය හැකි සම්බන්ධයක් නොපවතින බවත්, වර්ධනයත් සමඟ දිළිඳුකමට සිදුවන්නේ කුමක්ද යන්නතීරණය කරන නිර්නායකය ප්‍රතිපත්තීන් බවත්ය. මේ අනුව ආර්ථික ප්‍රතිපත්ති මුහුණපාන ප්‍රශ්න වනුයේ වර්ධනය හා ආදයම් ව්‍යාප්තිය අතර තුලනයක් පවත්වාගෙන යාම නොව, වර්ධනය මගින් දුප්පත්කම හා ආදයම් ව්‍යාප්ති අසමානතාවයන් අඩුකර ගැනීම කරන්නේ කෙසේද යන්නයි. ගුණාත්මක බවින් ඉහළ පුළුල් පදනමක් සහිත තිරසාර ආර්ථික වර්ධනයක් මගින් ඇති කරනු ලබන සේවා නියුක්තිය, දිළිඳුකම හා ආදයම් විෂමතාවයන් සීඝ්‍ර ලෙස අඩු කිරීමේ ප්‍රධාන මග බව වර්තමානයෙහි පුළුල් ලෙස පැතිරෙමින් පවතින මතයකි. එබඳු ආර්ථික ක්‍රියාදමයක අවශ්‍යතම ලක්ෂණයක් වනුයේ දූරදර්ශී සාර්ව ආර්ථික ප්‍රතිපත්තීන්, බාහිර නැඹුරුවකින් යුතු නිෂ්පාදනය, පෞද්ගලික අංශයේ ඉහළ සහභාගිත්වය, නැම්යාවකින් යුතු ශ්‍රම වෙළෙඳපල, කාර්යක්ෂම මූල්‍ය ක්‍රමයක් සහ ශක්තිමත් පදනමකින් යුතු යටිතල පහසුකම් යනාදියයි.

සැපයුම් තත්ත්වයන් වැඩි කිරීම සඳහා වූ ප්‍රතිපත්ති හා ස්ථාවර සාර්ව ආර්ථික වාතාවරණයක් ඇති කිරීම මගින් ආර්ථික වර්ධනයට සහාය විය යුතු වේ. වෙළෙඳපොළ පදනම් වූ ප්‍රතිපත්ති රාමුවක් තුළ, ආර්ථික තීරණයක් පිළිබඳව පුරෝකතනය කිරීමේ හැකියාව වැඩිදියුණු කරනු ලබන ස්ථාවර සාර්ව ආර්ථික පරිසරයක් පැවතිම, ඉතිරිකිරීම් හා ආයෝජන ධෛර්යමත් කිරීමට අවශ්‍ය පූර්ව කොන්දේසියක් වේ. සාර්ව ආර්ථික තත්වයන්ගේ අස්ථායීතාවය, ඉහළ උද්ධමන අනුපාතයන් මගින් ඇති කරවන අනර්ථකාරී ව්‍යාප්තිමය බලපෑම්වලට අමතරව, සෘජු වශයෙන් ආර්ථික වර්ධනය අඩු කර වීමට ද බලපායි. මෙම අවිනිශ්චිත තත්ත්වයන් සම්පත් බෙද හැරීමෙහි කාර්යක්ෂමතාව අඩු කරන අතර, ආයෝජන අඩුකිරීම් මගින් ඵලදයීතා වර්ධන අනුපාතයද අඩු කරයි. වෙළෙඳපොළ ක්‍රියාදමය කාර්යක්ෂමව ක්‍රියාත්මක වීමට ඇති විවිධ බාධාවන් ඉවත් කිරීමෙන් පෞද්ගලික අංශයට හිතකර ආර්ථික පරිසරයක් ගොඩ නැගීමටත් ව්‍යුහාත්මක ගැලපුම් අවශ්‍යවේ. මෙම ගැලපුම් මගින් වෙළෙඳ බාධක, නිෂ්පාදන අවහිරතාවයන්, දේපළ හිමිකම් පිළිබඳ සීමා, වෙළෙඳ ව්‍යවසායන්හී රජයේ ප්‍රබල අයිතිය, පසුතල පහසුකම්වල ඇති අඩුපාඩුකම් සහ ආයතනික දැඩිකම් ආදී විවිධ බාධක ඉවත් කිරීමට අදහස් කරන බැවින් එම ගැලපුම් ආර්ථිකයේ සැපයුම ප්‍රතිචාර සහ සම්පත් බෙදහැරීමෙහි කාර්‍යක්ෂමතාව ශක්තිමත් කරනු ඇත. වෙළෙඳපොළ මූලධර්ම මගින් මෙහෙයවනු ලබන සීඝ්‍ර ආර්ථික වර්ධනයට හිතකර වූ තත්වයන් ඇති කිරීම ව්‍යුහාත්මක ගැලපුම්වල මූඛ්‍යාර්ථය විය.

සාර්ව ආර්ථික ප්‍රතිපත්තියෙහි මූලික පරමාර්ථය වන්නේ මිල ස්ථායිතාවයයි. පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාවේ දැක්වෙන පරිදි, මෑත වර්ෂවල ශ්‍රී ලංකා ආර්ථිකයේ අඛණ්ඩව වැඩි වෙමින් පවතින උද්ධමනකාරී පීඩනයට හේතු වූයේ (අ) ඉහළ අයයැව හිඟය (ආ) මුදල් සැපයුමේ අඛණ්ඩව වර්ධනය (ඇ) අඩු ඵලදයිතාවය (ඈ) මෙම කරුණුවල ප්‍රතිඵලයක් ලෙසින් ඇති වූ

උද්ධමන අපේක්ෂාවන් වේ. රාජ්‍ය මූල්‍ය අසමබරතාවයන්, සාර්ව ආර්ථික ස්ථායිතාවයන් සඳහා යෝග්‍ය මට්ටමට වඩා ඉතා ඉහළ මට්ටමක පැවතුණි. රාජ්‍ය මූල්‍ය මෙහෙයුම්වල ඉහළ පරිභෝජනය අරමුණු කරගත් වියදම් පිළිබිඹු කරමින් අයවැයෙහි ජංගම ගිණුම වසර කිපයක් තිස්සේ හිඟයක්ව පැවතුණි. 1989-1994 කාලපරිච්ඡේදය තුළ අයවැය හිඟයෙහි සාමාන්‍යය, ආසන්න වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10 ව පැවති අතර දේශීය ණය ගැනීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 ක මට්ටමක පැවතුණි. දේශීය ණය ගැනීම් මගින් අයවැය හිඟය පියවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉහළ ණය බරක් රාජ්‍ය අයවැය මත පැවතුණි. ඉහළ මට්ටමක පැවති දේශීය ණය ගැනීම්, දැනට රටෙහි පවත්නා ඉහළ පොළී අනුපාත ව්‍යුහය කෙරේ බලපාන ලද එක් වැදගත් කරුණක් විය. රජය, දේශීය ණය ගැනීම් මත දැඩි ලෙස රඳා පැවැත්ම හේතුවෙන් පෞද්ගලික අංශය වෙත ගලා යා හැකිව තිබූ සම්පත් සීමා වූ අතර මෙයින් රටෙහි වර්ධන හැකියාව මුළුමනින්ම ප්‍රයෝජනයට ගැනීමට ද බාධා පැමිණින. ආර්ථික ප්‍රතිසංස්කරණයන් මගින් ප්‍රාණවත් කරන ලද විශාල ප්‍රාග්ධන ගලාඒම් සහ නැගී එන පෞද්ගලික අංශයෙන් ඉහළ ණය අවශ්‍යතාවය මධ්‍යයේ ඉහළ අයවැය හිඟයක් මගින්, මිළ ස්ථායිතාවය හා අනුකූල වන මට්ටමක ද්‍රවශීලතාවය පවත්වා ගැනීම සඳහා දරණ ලද මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රයත්නයන් අඩපන කරන ලදි.

ශ්‍රී ලංකාවෙහි මනා සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැඩි රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග මගින් අයවැය හිඟය අඩු කළ යුතුව ඇත. මෙවන් ක්‍රියාමාර්ග කෙටිකාලිනව, ආදායම් ඉහළ නැංවීමේ සහ වියදම් සීමා කිරීමේ ප්‍රතිපත්ති වලින් සමන්විත වේ. එසේ වුවද, රටේ උද්ගත වෙමින් පවත්නා සාර්ව ආර්ථික ගැටළු සඳහා ස්ථිර විසඳුම් සෙවීමේදී රාජ්‍ය අයවැය හා අදාළව දූරදර්ශී ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. ආදායම ඉහල නැංවීමේලා දැඩි උත්සාහයක් දැරුවද, විවිධ බදු සහන, නිදහස් කිරීම් සහ තාවකාලික බදු අඩු කිරීම් ආදිය ප්‍රදානය කිරීම නිසා, සැළකිය යුතු ප්‍රමාණයකින් බදු පදනම ඛාදනය වීමේ හේතුවෙන් රජයට පසුගිය වර්ෂවලදී නම්‍ය ආදායම් ව්‍යුහයක් පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. බදු ක්‍රමයෙහි පැවති බොහෝ සංකීර්ණතාවයන් ද, බදු පරිපාලනයෙහි ප්‍රගතියක් ඇති කිරීමට උපකාරි වී නැත. රටෙහි ආදායම් ක්‍රමයෙහි වූ මෙම දුර්වලතාවයන් ආදායම් ද. දේ. නි. අනුපාතය 1989 දි සියයට 21.4 සිට 1994 දි සියයට 19.0 දක්වා ක්‍රමිකව පහත වැටීම තුළින් සනිටුහන් කෙරිණි. මේ අනුව, ආදායම් නම්‍යතාවය යහපත් කෙරෙන, බදු අනුකූලතාවය සහතික කෙරෙන, බදු පරිපාලනය පහසු කෙරෙන, පුළුල් පදනමක් මත වූ සරල බදු ක්‍රමයක් ඇති කිරීම පිණිස ප්‍රතිපත්තිමය ප්‍රතිසංවිධාන ක්‍රියාවට නැවීම අත්‍යවශ්‍යව ඇත.

වර්තන වියදමෙහි සැකස්ම බෙහෙවින් අසතුටුදායක තත්ත්වයක පවතී. වැටුප් සහ විශ්‍රාම වැටුප් වියදම, මුළු වර්තන වියදමෙන් තුනෙන් එකක් පමණ වේ. වැටුප් වැඩිකිරීම් හැරුණ විට, රාජ්‍ය අංශයේ සේවා නියුකතියෙහි වූ අඛණ්ඩ වැඩිවීම තුළින්ද රජයේ වැටුප් වියදම ඉහළ නැඟුණි. මෑත කාලයේදි වූ ප්‍රතිසංස්කරණ යටතේ විශාල වැටුප් වැඩිවීම් ලැබූ අනෙකුත් කාණ්ඩයන් හා සලකා බලන කළ පරිපාලන කාණ්ඩයෙහි වැටුප් ව්‍යුහය සම්පූර්ණයෙන්ම නිසි මගින් බැහැර විය. පහළ වැටුප් තලයන්ට සංකේන්ද්‍රනය වූ රාජ්‍ය අංශයක් පැවතිම නිසා, අනෙකුත් කාණ්ඩයෙහි වැටුප් සැළකිය යුතු ලෙස ඉහළ යාමත් සමඟ වැටුප් පිරිවැය ද ඉහළ නැඟුණි. මේ අතර, ජීවන අපේක්ෂාව ඉහළ යාම මධ්‍යයේ සහ සෑම වසරකට විශ්‍රාමිකයන්ගේ සංඛ්‍යාව විශාල වීම යන කරුණු හේතුවෙන් 1990 සිට 1994 දක්වා කාලය අතර තුර රජයේ විශ්‍රාම වැටුප් හා විශ්‍රාමික ප්‍රතිලාභ තෙගුණයකින් ඉහළ නැගුණි. මේ හා අදාළව, රජයේ අයවැය මත පැටවෙන බර අඩු කිරීම සඳහා රාජ්‍ය අංශයේ සේවා නියුක්ති ප්‍රතිපත්ති සහ විශ්‍රාම ක්‍රමය පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත්ය.

ප්‍රතිසංස්කරණ සඳහා අවධානයට ලක් කළයුතු වෙනත් ක්ෂේත්‍රයක් වනුයේ වර්තන වියදමින් සියයට 22 ක් පමණ වන ශුභසාධන වියදමයි. මෙම වියදම් අයවැයෙහි ඉහල පිරිවැයක් විමට අමතරව, ආදායම් ප්‍රතිව්‍යාප්තියෙහි සතුටුදායක බලපෑම් ඇති කිරීම පිණිස, මනා ලෙස ඉලක්ක කළ ඒකීය ශුභ සාධන වැඩසටහනක් මගින් ශුභසාධන වියදම් විධිමත් කිරීම අවශ්‍ය වේ. රටෙහි සියළුම පුරවැසියන්ට ශුභසාධනය සැපයීමෙන්, එම ක්‍රියාමාර්ග අවශ්‍ය නොකෙරෙන කොටස් සඳහා සම්පත් අපතේ යාමක් සිදු වේ. වැඩිමනත්ව, මනාව ඉලක්ක කළ ඒකීය ශුභසාධන වැඩපිළිවෙලක් මගින්, පවත්නා අයවැය සීමාවන් යටතේම, දුගී ජන කොටස් සඳහා වැඩි ආදායම් සංක්‍රාම සැපයිමට රජයට හැකිවේ. මෙබඳු ආදායම් සංක්‍රාම කිරීමේ ඒකීය වැඩපිළිවෙලක් යටතේ මිළ ගැලපුම් මගින් සියළුම දෙනාටම සහනාධාර සැපයීම අනවශ්‍ය කෙරේ.

අපනයන වැඩි කිරීමටත්, ශක්‍යතාවයෙන් යුතු ආනයන ආදේශ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමටත් යොදා ගත් වෙළෙඳ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සෑහෙන මට්ටමේ ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා තීරු බදු ප්‍රතිසංස්කරණ සහ අපනයන හා ආනයන මත වූ බලපත්‍ර අවශ්‍යතා අහෝසි කිරීම මගින් මෑත වර්ෂයන්හිදී වර්ධනාත්මක ප්‍රවනාවයක් පෙන්වූ අපනයන කර්මාන්ත හා දේශීය කර්මාන්තවල ආයෝජනය කිරීමට දිරි ගන්වනු ලැබිණ. කෙසේ වුවද, නිදහස්කරණය නොකළ කෘෂිකාර්මික අංශ්‍ය සම්බන්ධයෙන් ඉහත කී තත්ත්වය නොපවතී. බලපත්‍ර අවශ්‍යතා අහෝසි කිරීම සහ අව්‍යශය ආරක්ෂණය සහ දිරිගැන්වීම් ව්‍යුහයක් ඇති කිරීමට යෝග්‍ය තීරු බදු ව්‍යුහයක් යොදා ගැනීම වැනි සාධක දේශිය කෘෂිකර්මාන්තයෙහි පූර්ණ වර්ධන හැකියාව උකහා ගැනීමට අත්‍යාවශ්‍ය වේ. දැනට පවත්නා තීරු බදු ව්‍යුහය බොහෝදුරට අවිධිමත්ය. තිරිඟු පිටි, පරිප්පු වැනි කෘෂිකාර්මික භාණ්ඩ ගණනාවක් තීරුබදු වලට යටත් නොවන අතර, එමගින් එම භාණ්ඩයන්ගේ සාපේක්ෂ මිළ ගණන් දේශිය ආදේශක නිෂ්පාදනයන්ට අවාසිදායක වි ඇත. පාරිභෝගික වරනයන් දේශීය නිෂ්පාදනයන්ගෙන් විතැන් කළ, මෑතදී හඳුන්වා දුන් තිරිඟු පිටි සහනාධාරය, කෘෂිකර්මාන්තයෙහි සාපෙක්ෂ මිළ ගණන් විකෘති කර ඇත. විශේෂයෙන්ම නාගරික ප්‍රදේශයන්වල ජිවන වියදමට කෙටිකාලිනව බලපෑමක් ඇති කෙරමින් වුවද, රාටෙහි ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය පෙරදැරි කොට ගෙන මෙම විකෘති කිරීම් යලි නිවැරදි කළ යුතු අතර, නිවැරදි මිළ සංඥා නැවත ස්ථාපිත කළයුතු වේ. සීඝ්‍ර ආර්ථික වර්ධනයක් ලඟා කර ගැනීමත්, දිළිඳු බව පිටු දැකිමත් සඳහා වූ ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් දේශිය කෘෂිකර්මාන්තයේ අඩු ඵලදායිතා ගැටළුව නිරාකරණය කළ යුතුමය. මන්ද යත්, ශ්‍රී ලංකාවේ දුගී ජනතාවගෙන් වැඩි කොටසක් ග්‍රාමීය ප්‍රදේශවල ජිවත් වන අතර, ඔවුන් මූලික වශයෙන් කෘසිකාර්මික කටයුතු වල නිරත වි ඇති බැවින්ය. දේශිය කෘෂිකර්මාන්තයෙහි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා, මෙම අංශය වෙත ප්‍රාග්ධනය ගලා යාමට සැලැස්වීම, තාක්ෂණය සහ වගා කිරීමේ නවින ක්‍රම යොදා ගැනිම අවශ්‍ය වන අතර, භාණ්ඩ අලෙවි කිරීමේ වැඩ පිළිවෙලහි පුළුල් කිරීමක් ද අවශ්‍ය වේ.

කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා අංශයෙහි නිෂ්පාදන ක්‍රියාකාරකම් වල පෞද්ගලික අංශයේ සහභාගීත්වයට බාධා පමුණුවනු ලැබූ සාධකයන් වූයේ, ඉඩම් භාවිතය පිළිබඳ දැනට පවත්නා ප්‍රතිපත්ති, නොනැමෙන සූළු ශ්‍රම වෙළෙඳපල තත්ත්වයන්, විශේෂයෙන්ම යටිතල පහසුකම් සහ සේවා සම්බන්ධව ඇති විශාල පොදු ව්‍යවසායයන්හි අයිතිය රජය සතුවිම, ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම්, සේවක අර්ථ සාධක අරමුදල වැනි ආයතනික ආයෝජකයන්ගෙන් රජයේ අධිකතර ණය ගැනිම් යනාදියයි. දිගුකාලීන ආයෝජනයේදි දේපළ අයිතිය වැදගත් අංශයක් බවට අවධාරණය කෙරෙන වර්තමාන ආර්ථික වාතාවරණය මධ්‍යයේ, අයිතියට සිමා පනවන වත්මන් ඉඩම් ප්‍රතිපත්තිය විමසා බැලිම අවශ්‍යව ඇති අතර එහිදී, දේශීය හා වතු කෘෂිකර්මාන්ත අංශයෙහි පුද්ගලික අංශයේ ආයෝජනය ඉහළ නැංවිමට අවශ්‍ය නම්‍යභාවය හඳුන්වාදීම අරමුණු කොට ගත යුතුය.

ශ්‍රම වෙළෙඳපොළේ නම්‍යභාවය, ආර්ථික වර්ධනය සැළකිය යුතු ලෙසින් ඉහළ නැංවීමට දයක වන අතර, එය සේවා නියුක්තිය ජනනය කිරීමට හේතු වේ. ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපෙංළහි කිප ආකාරයක දුර්වලතාවයන් දක්නට ලැබේ. පළමුවැන්න එහි බෙදුනු ස්වභාවයයි. එමගින් සම්පත් අකාර්යක්ෂම ලෙස බෙදහැරීමත්, රාජ්‍ය අංහයේ සේවා නියුක්ත්යක් මත පිඩනයන් ඇති කිරීමත් සිදු කෙරේ. දෙවනුව, වේතන, සේවා නියුක්තිය සහ සේවා කොන්දේසි බොහෝදුරට තීරණය වනුයේ රජයේ ව්‍යවස්ථාවන් සහ වෘත්තීය සමිති බලපෑම් මතයි. මින් දහස් වන්නේ රටෙහි පුළුල් ලෙස පැතිර පවත්නා සේවා වියුක්ති තත්ත්වයට ප්‍රතිචාරාත්මකව වැටුප් තිරණය කිරීම සඳහා අවශ්‍ය වන නම්‍යභාවය ශ්‍රම වෙළෙඳපොළ තත්ත්වයන්ගෙන් නොසැපයෙන බවය. මෙබදු තත්ත්වයක් යටතේ, සේව්‍ය-සේවක සබඳතාවයන් වඩා නැමෙන සූළු ආකාරයකින් පවත්වාගෙන යා හැකි පරිදි, ශ්‍රම වෙළෙඳපළ හා අදළව, ප්‍රතිපත්මය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අවශය වේ. සාධාරණ කම්කරු ව්‍යවස්ථාවන් එක හා සමානව ක්‍රියාවේ යෙදවෙන බවට සහතික කිරීම කම්කරු ප්‍රතිපත්තිය අරමුණු කොට ගත යුතුයි. එමගින් නව රැකියා සොයා යන ශ්‍රමිකයන් හට ප්‍රමාණවත් සහායක් ලැබෙන අතර, ඵලදයි ශ්‍රම සංචලනන ඇතිවීමට ද ඉඩ කඩ සැලසේ.

නැගී එන පුද්ගලික අංශයට වැඩි ප්‍රමාණයක් සම්පත් මුදා හැරීමට යෝග්‍ය වූ වාතාවරණයක් ඇති කෙරෙන පරිදි ආර්ථික ප්‍රතිසංස්කරණ අරමුණු හැසිරවිය යුතුය. වර්තමානයේදී, සේවක අර්ථ සාධක අරමුදල සහ පුද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් අරමුදල් වැනි ආයෝජනයන් සතුව ඇති දිගු කාලීන අරමුදල් , පුද්ගලික අංශයට ප්‍රයෝජනයට ඇති ඉඩ ප්‍රස්ථා ඉහළ අය වැය හිඟයන් විසින් වළක්වන අතර, එමගින් පුද්ගලික අංශයට මූල්‍ය සම්පත් ගලායෑම අවහිර කර ඇත.

විශාල අය වැය හිඟයක් මගින් දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමද, අත්‍යාවශ්‍ය කෙරුණි. ඉහළ පොළී අනුපාතිකයන්ගෙන් පුද්ගලික ආයෝජනයට ඇති අහිතකර බලපෑම යළි යළිත් අවධාරණය කිරීම අවශ්‍ය නොවේ. අඩු අය වැය හිඟයන් සඳහා කෙරෙන රාජ්‍ය මූල්‍ය ගැලපුම් පුද්ගලික ආයෝජනයට සැළකිය යුතු සහනයක් සපයන අතර, සේවක අර්ථ සාධක අරමුදල වැනි ආයතනික ආයෝජකයන් පුද්ගලික අංශයේ කටයුතු වලදී ආයෝජනය කිරීම වළක්වා දැනට පවත්නා ආයතනික අවහිරතා ඉවත් කිරීම ද අවශ්‍යය. තවද, බැංකු ක්‍රමයේ තරඟකාරී වාතාවරණය දියුණු කිරීම පිණිස, වාණිජ කටයුතුව දි වැඩි ස්වාධීනත්වයකින් යුතුව කටයුතු කළ හැකි පරිදි රාජ්‍ය බැංකු දෙක ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වේ.

යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම මගින් ශ්‍රී ලංකාවේ වර්ධන ප්‍රයත්නයන් දැඩි ලෙස සීමා කර ඇත. මහා මාර්ග, විදුලි සංදේශ, බලශක්ති, වරාය සේවාවන්, ජල සම්පාදනය වැනි ප්‍රධාන යටිතල පහසුකම් සඳහා රජයේ ආයෝජනය දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 4 ක් පමණක් වන අතර, එය වැඩි වෙමින් පවත්නා ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය පරිදි එම පහසුකම් වල සීඝ්‍ර පුළුල් කිරීමක් සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ. නිදසුනක් වශයෙන්, විදුලිබලය සඳහා ඉල්ලුම වර්තමානයේදි වසරකට සියයට 10 කින් ඉහළ යන නමුදු, ධාරිතාවය පසුගිය සිව් වසර තුළම වැඩි කෙරී නැත. තවද, පවත්නා ධාරිතා උපයෝජනය ද බොහෝදුරට කාලගුණික තත්ත්වයන් වැනි බාහිර සාධකයන් මත රඳා පවතින අතර, එමගින් බල සැපයුම පාලනය කළ නොහැකි සාධක වලට ගොදුරු වීමට ඉඩ කඩ වැඩි වි ඇත. මෙම යටිතල පහසුකම් පාලනය කරන පොදු ව්‍යවසායයන් විදේශීය ණය මත පදනම් වූ අය වැය ආධාර මත යැපෙන අතර, සිය ආයෝජන පුළුල් කිරීමට ප්‍රමාණවත් ආයෝජනමය අතිරික්තයක් ජනනය නොකරයි. මෙම යටිතල පහසුකම් අවශ්‍යතා සපුරාලිමට අවශ්‍ය සම්පත් අයවැයෙන් ලබා ගැනීම සීමා කෙරෙන තත්වයක් යටතේ, වියදම පියවා ගැනීමට යෝග්‍ය වූ මිළ ප්‍රතිපත්ති අනුගමනය කිරීමට අමතරව, මෙම ව්‍යවසායයන් විසින් පුද්ගලික අංශයේ සහයෝගය ද ලබාගත යුතුයි.

ඉදිරි කාලයේදී දුප්පත්කම අඩු කරන්නා වූ සහ සේවා නියුක්තිය වැඩි කරන්නාවූ ඉහල ආර්ථික වර්ධනයක් පවත්වාගැනීමට, වඩා පුළුල් තලයක සැකසුනු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණද, ඒ හා එක්වුණු දැඩි රාජ්‍ය මූල්‍ය ගැලපුම් වැඩ පිළිවෙලක්ද, ශ්‍රී ලංකාව විසින් අනුගමනය කල යුතුය යන්න ඉහතින් කෙරුණු සාකච්ඡාවෙන් එළඹිය හැකි නිශ්චිත නිගමනයයි. තුන් අවුරුදු මැදි කාලීන රාමුවක් තුළ, අයවැය හිඟය 1997 දී ද. දේ. නි. යෙන් සියයට 5 දක්වා එනම් 1994 අය වැය පරතරයෙන් අඩක් දක්වා අඩුකිරීමට සහ සීඝ්‍ර ආර්ථික වර්ධනයක් සඳහා වන බාධක ඉවත් කිරීමට ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හඳුන්වා දිමටත් නව රජය ඇප කැප වී ඇත. මෙම කැපවීම, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා නිවැරදි මඟ වෙත යොමු විමක් පෙන්නුම් කරයි.